

අඛණ්ඩවම **15** වසරක් ජනප්‍රියතම මහජන සම්මානයෙන් පිදුම් ලද දිනපතා ජාතික පුවත්පත

# ලංකාදීප

## කොරෝනා රැල්ලක් යළි මතුවීමේ අවදානමක්: වැඩිවුණොත් සංචරණ සීමා

සෞඛ්‍ය සේවා ප්‍රධානී

10 පිටුව බලන්න

## කොවිඩ් කරල මෙරටට ගෙන්වීමට රජයේ දැඩි අවධානය

31 වැනි කාණ්ඩය 51 වැනි පත්‍රය | පිටු 16 යි කොටස් 2 යි | විජය ප්‍රකාශනයක් | 2021 නොවැම්බර් මස 8 වැනිදා සඳුදා | අන්තර්ජාල ලිපිනය - www.lankadeepa.lk | මිල රුපියල් 30.00 යි



# පී.සී.ආර්. කට්ටල මගඩියකින් කෝටි 13 ක් වතුරේ

## විගණකාධිපති වාර්තාවෙන් හෙළිදරව්වක්

(සන්ඩේ ටයිම්ස්)

වෙළෙඳපොළ සාමාන්‍ය මිල ගණන් නොසලකා හැර, ඉහළ මිලක් ඉදිරිපත් කළ ලංසුකරුවකුගෙන් පී.සී.ආර්. කට්ටල මිලදී ගැනීම නිසා රජයට රුපියල් කෝටි 13ක පමණ (රුපියල් මිලියන 125ක) පාඩුවක් සිදුව ඇතැයි 2020 විගණකාධිපති වාර්තාවේ සඳහන් වේ.

2020 වසරේ අවස්ථා තුනකදී පී.සී.ආර්. කට්ටල 328ක් මෙලෙස ඉහළ මිල ගණන් යටතේ මිලදී ගෙන ඇතැයි ද එහි දැක්වේ.

6 වැනි පිටුවට



## කතරගම දේවාලයට රන්තැටිය පූජාකළ අංගොඩ ලොක්කාගේ බිරිය පොලිසියට

(ඉන්දිකා රාමනායක )

කතරගම දේවාලයේ තිබූ පවුම් 38 ක රන්තැටියක් අතුරුදන් වී ඇති බව කියන සිද්ධිය සම්බන්ධයෙන් සිදුකෙරෙන විමර්ශනයකට අදාළව ප්‍රකාශයක් ගැනීම සඳහා මෙරට ප්‍රධාන පෙළේ මත්කුඩු ජාවාරම්කරුවකු මෙන්ම සංවිධානාත්මක අපරාධකරුවකුව සිට ඉන්දියාවේ දී මියගිය ‘අංගොඩ ලොක්කා’ නමැත්තාගේ බිරිය කොළඹ අපරාධ කොට්ඨාසය හමුවට අද (08) කැඳවා ඇති බව පොලිස් ආරංචි මාර්ග පවසයි.

6 වැනි පිටුවට

## පරිපූරක අතුරු වෛද්‍ය සේවා සමිති 15 ක පිරිස් හෙට සංකේත වර්ජනයක

## සංවර්ධන නිලධාරීහු අද ලෙඩවෙති

## සිමෙන්ති රු. 1,275 ට නගී

## මැතිසබය අද සිට දින 33 ක්

10 පිටුව බලන්න

## අලි සබ්‍රි මන්ත්‍රී-ඇමැති ධූර දෙකෙන් ඉල්ලා අස්වන ලිපි ජනපතිට බාරදෙයි

10 පිටුව බලන්න

## සා.පෙළ - උ.පෙළ පන්ති යළි අද සිට

## ආණ්ඩුව මෙහෙම ගියොත් විකල්ප බලවේගයක් ඒවි: ඇමැතිලා අසාර්ථකයි

### මන්ත්‍රී අනුර යාපා කියයි



(සුජිත් හේවාජුලිගේ)

ආණ්ඩුවේ ආර්ථික උපාය මාර්ග අසාර්ථක බවත් මේ ආකාරයට ගියහොත් රටේ විකල්ප බලවේගයක් බිහිවීම වැළැක්විය නොහැකි බවත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර ප්‍රියදර්ශන යාපා මහතා පැවැසීය.

6 වැනි පිටුවට

## මිලිටරි පාලනයකට සූදනම් නෑ: පොරොන්දුවූ වෙනස ස්ථිරවම කරනවා

### ජනපති කියයි

(ඩයනා උදයංගනී)

මිලිටරි පාලනයකට තමන් සූදනම් නැතැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පෙරේදා (6) පැවසීය.

6 වැනි පිටුවට

## අයියාගෙන් මල්ලීට රහසක්...



සංවර්ධන කටයුතු නිම කළ මාර්ග 1500ක් එකම දිනක දී ජනතා අයිතියට පැවරීම වෙනුවෙන් සංවිධානය කළ උත්සවයක් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් වීරකැටිය, මණ්ඩාඩුව මහජන ක්‍රීඩාංගණයේ දී පෙරේදා (6) පස්වරුවේ පැවැත්විණි. එහිදී ජනාධිපතිවරයා සහ අගමැතිවරයා කතාබහක නිරත වූ අයුරු ඡායාරූපයේ දැක්වේ.

(වාර්තාව 5 වැනි පිටුවේ)





කාබනික පොහොර නිෂ්පාදනය සඳහා මූල්‍ය සහය

- රු. මිලියන 100 ක් දක්වා උපරිම ණය මුදලක්
- ආපසු ගෙවීම සඳහා උපරිම වසර 5ක්
- කාරක ප්‍රාග්ධනයට හා ස්ථාවර වත්කම් සඳහා මූල්‍ය පහසුකම්
- අවම හා සහනදායී ස්ථාවර පොලියක්
- අපේක්ෂිත කාලය තුළ ණය මුදල අතට
- සරල ඇප කොන්දේසි (චංචල හා නිශ්චල දේපළ ඇතුළත්ව)
- ව්‍යාපෘතියේ වටිනාකමින් 75% ක් දක්වා ණය මුදලක්
- ගෙවීම සඳහා සහන කාලය මාස 6ක් (Grace Period) ඇතුළුව පහසුකම් රැසක්

කොන්දේසි සහිතයි

1922

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
அரச ஈட்டு முதலீட்டு வங்கி
State Mortgage & Investment Bank

ICRA (SL) BBB+
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන බලපත්‍රලාභී රජයේ විශේෂිත බැංකුවකි


## තරුණයන් පත්කළාට එජාප කෘත්‍යාධිකාරී රැස්වීම උණුසුම් වෙයි

10 පිටුව බලන්න

## දුම්රිය ගමන් අද සිට සාමාන්‍ය ක්‍රමයට

පණාකප රුවන්දගේ

### සරදම්



අත්‍යවශ්‍ය කොමසාරිස් ජනරාල් දෙට්ටලු!

ඊළඟට ඇමැතිතුමාද සෑර්?

## අලියකුට බියවී සෆාරි ජීප් රියක් පෙරළෙයි

### මරණ 1 යි: 8 කට තුවාල



(යොහාන් භාසුර, මැදිරිගිරිය චාපා මධුභාෂිණී සහ පොළොන්නරුව ක.ග. කරුණාරත්න)

හබරණ හුරුළු ජාතික වනෝද්‍යානයේ දී සංචාරකයන් රැගත් සෆාරි ජීප් රථයක් පෙරළීමෙන් පුද්ගලයකු මියගොස් තවත් අටදෙනකු තුවාල ලබා ඇතැයි හබරණ පොලීසිය පවසයි.

6 වැනි පිටුවට

## මාලිගාවත්ත කතගේ ඝාතනයට මිතුරියත් ඇගේ සැමියාත් අත්අඩංගුවට

10 පිටුව බලන්න

## අධිකරණයේ ලොකු පුටුවක සිටින සැමියාගෙන් මටත් දරු තිදෙනාටත් හිරිහැර

### බිරිඳ පොලිසියෙන් පිහිට පතයි

# සෞඛ්‍ය නීති කැඩූ බස් 403කට කඩ සාප්පු 507කට දැඩි අවවාද

**(ඉන්දිකා රාමනායක)**

**සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා නිකුත් කළ මාර්ගෝපදේශ අනුගමනය නොකළ බස්නාහිර පළාතේ බස් රථ 403කට හා වෙළෙඳසල් 507කට දැඩි ලෙස අවවාද කළ බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි, නීතිඥ නිහාල් තල්දූව මහතා පවසයි.**

ජනතාව සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම පිළිපදින්නේ ද යන්න සහ සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම උල්ලංඝනය කරන පුද්ගලයන් සොයා පොලිසිය පෙරේදා (6 වැනිදා) දහවල් 12.00 සිට පස්වරු 2.00 දක්වා පැය 2ක් කළ විශේෂ සෝදිසි මෙහෙයුමකදී මෙම පිරිස හඳුනාගත් බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කීය.

මෙම මෙහෙයුමට පොලිස් නිලධාරීන් 469 දෙනකු යොදවා ඇත.

බස්නාහිර පළාත් මගී බස් රථ 1,005ක්, වායුසමනය කළ බස් රථ 216ක් හා අලෙවිසල් ඇතුළු වෙළෙඳසල් 1,312ක් සෝදිසියට ලක්කර ඉහත පිරිසට අවවාද කළ බව ද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පැවැසීය.

අවවාද කළ බස් රථ අතර මගී ප්‍රවාහන සාමාන්‍ය බස් රථ 334ක් හා වායුසමනය කළ බස් රථ 69ක් වූ බව ද හෙතෙම කීය.

බස් රථවල ආසන ධාරිතාව ඉක්මවා මගීන් රැගෙන යාම, මගී ජනතාව නිවැරැදි ලෙස නාසය හා මුඛය වැසෙන සේ මුඛ ආවරණ පැළඳ නොසිටීම, වායුසමනය කළ බස් රථවල වාතාශ්‍රය නිසි ලෙස ලැබෙන පරිදි ජනෙල් විවෘත කර නොතිබීම, සිල්ලර කඩ, ඔසු අලෙවිසල් සහ කුඩා වෙළෙඳසල්වලට ඇතුළු විය හැකි පාරිභෝගිකයන් ප්‍රමාණය සම්බන්ධයෙන් දැන්වීම් මගින් ප්‍රදර්ශනය නොකිරීම, ප්‍රමාණය ඉක්මවා මගීන් වෙළෙඳසල්, ඔසු අලෙවිසල්වලට ඇතුළු කරගැනීම යන කරුණු සම්බන්ධයෙන් මෙම පිරිසට අවවාද කළ බව ද ඔහු පැවැසීය.

මෙම මෙහෙයුම් ඉදිරියේදීත් සිදු කරන අතර, සෞඛ්‍ය මාර්ගෝපදේශ නිසි පරිදි නොපිළිපදින බස් රථ රියැදුරන්ට හා වෙළෙඳසල් හිමියන්ටදැඩි නීතිමය පියවර ගන්නා බව ද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා වැඩිදුරටත් කීය.

# අපෙන් සමුගත් නිමල්



සීමාසහිත විජය පුවත්පත් ආයතනයේ 'ඉරිදා ලංකාදීප' සහ 'තරුණයා' පුවත්පත්වල දීර්ඝ කාලයක් සේවය කළ මාධ්‍යවේදියකු වූ නිමල් වර්ණකුලසූරිය මහතා කලක් රෝගාතුරව සිට අභාවප්‍රාප්ත වූ අතර ඔහුගේ අවසන් කටයුතු ඊයේ (7) සිදු කෙරිණි. මේ ලිපිය ඒ නිමිත්තෙනි.

නිමල් වර්ණකුලසූරිය විජය පුවත්පත් ආයතනයට එක්වන්නේ 1984 දීය. ඒ 'තරුණයා' පුවත්පතේ මාධ්‍යවේදියකු ලෙසය.

මාධ්‍යවේදියකු වුවද ඔහුට කළ යුතු කාර්ය රැසක් විය. වරෙක ඔහු විවිධ කලාකරුවන් සමග සම්මුඛ සාකච්ඡාවල නිරත විය. ඒ හැරුණු විට පිටු සැකසීම් කටයුතු කළේය.

එකල දැන් මෙන් පරිගණක තාක්ෂණයක් නොතිබූ නිසා පිටු සකස් වූයේ බ්‍රිස්ටල් බෝඩ්වල ලිපි ඇලවීමෙනි.

ලිපි තීරුවලට කපමින් ගම් ගා ඇලවිය යුතු විය. නිමල් ඒවාට ද සහභාගි වූයේය.

ඇතැම් විශේෂාංග ලිපි කපා කොටා සකස් කළේ ඔහුය. ඔහු එහි නොකළ කාර්යයක් නැති තරම්ය.

විශාල කාර්ය මණ්ඩලයක් නොවූ නිසා වැඩ ද අධික විය.

මේ අයුරින් වැඩ කෙරීගෙන යද්දී ලිපි සකස් කිරීම, විශේෂාංග සකස් කිරීම නිමල් අතින් කෙරුණේය.

බොහෝ නවක පිරිස් 'තරුණයා'ට සම්බන්ධ වීම නිසා ඔවුන් හා කුළුපග වෙමින් නිමල් තම කාර්යය අවුරුදු 22ක් පමණ කාලයක් 'තරුණයා' වෙනුවෙන් කැප කෙළේය.

ඉන්පසුව නිමල් සම්බන්ධ වූයේ 'ඉරිදා ලංකාදීප'යට ය.

එහිදී ප්‍රාදේශීය පුවත් පිටු සංස්කරණයට සම්බන්ධ වෙමින් වසර කීපයක්ම සේවය කළේය. බෝමිරියේ ඉපැදුණ ඔහු බෝමිරිය මධ්‍ය මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය හැදෑරුවෙකි.

නිමල් 'ඉරිදා ලංකාදීප'යට සේවය කරන අතරතුර වරින් වර රෝගාතුර වූයේය.

විටෙක රෝහල්ගත වී ප්‍රතිකාර ගැනුණි.

රෝගාබාධ ටිකෙන් ටික උග්‍ර වෙත්ම ඔහු පත්තර ජීවිතයට සමුදුන්නේය. ඉන්පසු වසර කීපයක්ම ඔහු නිවසට වී කාලය ගත කළේ රෝගී තත්ත්වයෙනි.

වසර 67ක ආයු කාලයක් අවිවාහකයකු ලෙස දිවි ගෙවූ නිමල් පසුගිය 5 වැනිදා හෘදයාබාධයකින් අභාවප්‍රාප්ත විය. ඔහුගේ අවමඟුල් කටයුතු ඊයේ (07) ප.ව. 2.30ට ඉහළ බෝමිරිය සුසාන භූමියේදී සිදුකෙරුණි.

නිමල් බොහෝ කාලයක් යනතුරු විජය පුවත්පත් ආයතනයේ හිතවතුන්ට අමතක නොවනු ඇත. ඒ ඔහු ඒ තරමට පුවත්පත් කලාවේදීන්ට හිතවත් බැවිනි. නිමල්ට නිවන් සුව අත්වේවා!

**රොඩ්නි**

# වෙලේ සුදුගේ මව පනස්දහක කුඩු එක්ක ගෙදරදී අත්අඩංගුවට

**(ඉන්දිකා රාමනායක සහ වැල්ලවත්ත බී. ජානක)**

**මහා පරිමාණ මත්කුඩු ජාවාරම්කරුවකු වන වෙලේ සුදු නමැත්තාගේ මව රුපියල් 50,000කට අධික වෙළෙඳ වටිනාකමක් ඇති මත්කුඩු සමග වැල්ලවත්ත සුබෝධි පාරේ නිවසේ දී වැල්ලවත්ත පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලැබුවාය.**

සැකකාර කාන්තාව වැල්ලවත්ත සිය නිවසේ මහා පරිමාණයෙන් මත්කුඩු ජාවාරමේ නිරතවන බවට බස්නාහිර බුද්ධි අංශය දුන් තොරතුරු මත වැල්ලවත්ත පොලිසියේ විශේෂ කණ්ඩායමක් විසින් ඉකුත් 5 වැනිදා පස්වරුවේ එම නිවසේදී සැකකාරිය අත්අඩංගුවට ගත් බව පොලිසිය කියයි

පොලිස් කණ්ඩායම ඇයගේ නිවස පරීක්ෂා කළ ද එහි තිබී කිසිවක් හමු වී නැති අතර පොලිස් නිලධාරීනියන් යොදවා සැකකාරියගේ සිරුර පරීක්ෂාවට ලක් කිරීමේ දී ඇයගේ රහස් පෙදෙසේ සඟවාගෙන සිටි මත්කුඩු පැකට් හමු වූ බව පොලිසිය පවසයි.

අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ මෙම සැකකාරිය සතුව හෙරොයින් ග්‍රෑම් 5යි, මිලි ග්‍රෑම් 300ක ප්‍රමාණයක් තිබී ඇති අතර ඇය 65 හැවිරිදි බව ද පොලිසිය කියයි.

මෙම සැකකාරිය මීට පෙර ද මත්කුඩු ජාවාරම සම්බන්ධයෙන් පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය මගින් අත්අඩංගුවට ගනු ලැබූ බව පොලිසිය කියයි.

වැල්ලවත්ත පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රශාන්ත ද සිල්වා මහතාගේ උපදෙස් මත, උප පොලිස් පරීක්ෂක රන්දික ද සිල්වා, උප පොලිස් පරීක්ෂක හේෂාන්, කොස්තාපල්වරුන් වන සමරතුංග (93968), සිල්වා (72790), පොලිස් කොස්තාපල්වරියන් වන දිල්කි (9710), මදිවදනි (11112) යන මහත්ම මහත්මීහු මෙම වැටලීම කළහ.

# ඩෙංගු වසංගතයත් පැතිරෙන අවදානමක්

## බස්නාහිර නැගෙනහිර අද සිට මර්දන වැඩ

**(රංජන් කස්තුරි)**

**රටපුරා ඩෙංගු වසංගත තත්ත්වයක් ඇතිවීමේ දැඩි අවදානමක් හටගෙන අතැයි ජාතික ඩෙංගු මර්දන ඒකකය සඳහන් කරයි.**

ඩෙංගු රෝගීන් 2021ක් ඉකුත් ඔක්තෝබර් මාසයේදී හමු වූ අතර මෙම මාසයේ මුල්දින හතර ඇතුළත රෝගීන් 500කට වැඩි පිරිසක් හමු වූ බව ජාතික ඩෙංගු මර්දන ඒකකයේ අධ්‍යක්ෂ වෛද්‍ය සුදත් සමරවීර මහතා පැවසීය.

එම නිසා බස්නාහිර සහ නැගෙනහිර පළාත්වල අද (8) සිට සෙනසුරාදා (13) දක්වා දින හයක ඩෙංගු මර්දන වැඩසටහනක් ක්‍රියාත්මක කරන බව ද සමරවීර මහතා කීවේය.

බස්නාහිර සහ නැගෙනහිර පළාත්වල තෝරාගත් අධිඅවදානම් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාස 59ක එම විශේෂ ඩෙංගු මර්දන වැඩසටහන ක්‍රියාත්මක කරන බවද සමරවීර මහතා කීවේය.

සෞඛ්‍ය සේවකයන්, පොලිසිය, ත්‍රිවිධ හමුදාව හා ස්වේච්ඡා නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් එම ඩෙංගු මර්දන වැඩසටහන ක්‍රියාත්මක කරන බවද සමරවීර මහතා පැවසීය. මදුරුවන් බෝවන ස්ථාන පිරිසුදු කරන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටින බවද ඔහු කීය.

# අංගොඩ ලොක්කාගේ ගෝලයකු මැරූ සැකකරුවන්ට උදවු කළ හෙද නිලධාරියකු ඇතුළු තිදෙනෙක් මාට්ටු

**ඉන්දිකා රාමනායක**

**මුල්ලේරියාව මීගහවත්ත ප්‍රදේශයේ ඉකුත් පස්වැනිදා වෙඩි තබා අංගොඩ ලොක්කාගේ ගෝලයකු ඝාතනය කර තවත් පුද්ගලයකුට තුවාල කිරීමේ සිද්ධියේ සැකකරුවන්ට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් හෝමාගම රෝහලේ හෙද නිලධාරියකු ඇතුළු තිදෙනකු අත්අඩංගුවට ගත් බව පොලිසිය පවසයි.**

මුල්ලේරියාව පොලිසියේ විශේෂ කණ්ඩායමක් මොවුන් බණ්ඩාරගම හා මොරොන්තුඩුව ප්‍රදේශවල දී අත්අඩංගුවට ගත් බව ද පොලිසිය කියයි.

මෙම වෙඩි තැබීමේ සිද්ධියේ දී පොර බැදීමේ දී වෙඩි තැබූ පුද්ගලයාට ද තුවාල සිදුවී ඇති බවත් ඔහුගේ තුවාලවලට ප්‍රතිකාර කිරීම සහ සැකකරුවන්ට මෝටර් රථයකින් පලා යෑමට උපකාර කිරීම සම්බන්ධයෙන් මොවුන් තිදෙනා අත්අඩංගුවට ගත් බව ද පොලිසිය පවසයි.

බණ්ඩාරගම ප්‍රදේශයේ දී අත්අඩංගුවට ගත් හෙද නිලධාරියා වෙඩික්කරුගේ තුවාලවලට නීති විරෝධී ලෙස ප්‍රතිකාර කර ඇති බව ද පොලිස් ආරංචි මාර්ග කියයි.

සිද්ධිය වූ දින මෙම වෙඩික්කරු හා සෙසු සැකකරුට පිළියන්දල සිට බණ්ඩාරගමට මෝටර් රථයකින් පලා යෑමට උදව් කිරීම සම්බන්ධයෙන් අනෙක් සැකකරුවන් දෙදෙනා අත්අඩංගුවට ගෙන ඇත.

හෙද නිලධාරියාගෙන් ප්‍රතිකාර ලබාගෙන ඔවුන් බණ්ඩාරගමින් පලා ගොස් ඇති අතර ඔවුන් සම්බන්ධයෙන් මෙතෙක් තොරතුරු හෙළි වී නැත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 29, 30 සහ 33 යන වයස්වල පසුවන්නන් බවත්, මොවුන් කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර පැය 72 ක රැඳවුම් නියෝග මත රඳවාගෙන ප්‍රශ්න කරමින් පසුවෙන බවත් පොලිසිය පවසයි.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් මීට පෙර සැකකරුවන් දෙදෙනකු කඩුවෙල පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇති අතර ඔවුන් වෙඩික්කරුවන් ඝාතනයට යොදගත් ගිනිඅවිය ගෙන වෙනත් පාර්ශ්වයක් වෙත බාර දුන් පුද්ගලයන් බව ද පොලිසිය කියයි.

බස්නාහිර පළාත බාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ අධීක්ෂණය යටතේ, නුගේගොඩ කොට්ඨාස බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි චන්දන ලියනගේ, සහකාර පොලිස් අධිකාරි හේමන්ත ඕවිටිගම යන මහත්වරුන්ගේ උපදෙස් මත, මුල්ලේරියාව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සුනිමල් සුසන්ත මහතාගේ මෙහෙයවීමෙන්, අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක මායාදුන්න මහතා ඇතුළු පොලිස් කණ්ඩායමක් සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වයි.

# පානදුර 'සලිදු' රට සිට එවන කෝටියක කුඩු-කරල් එක්ක ගෝලයෙක් කොටුවෙයි

**(පානදුර - සුමිත් ප්‍රේමතිලක, පානදුර - සමන් කාරියවසම් සහ බණ්ඩාරගම - බිමල් ශ්‍යාමන් ජයසිංහ)**

විදේශයක සැඟවී සිටිමින් මත්කුඩු ජාවාරම මෙහෙයවන බව කියන ප්‍රධාන මත්කුඩු ජාවාරම්කරුවකු වන 'පානදුර සලිදු' නමැත්තාගේ ගෝලයකු රුපියල් කෝටියකට අධික වටිනාකමකින් යුත් හෙරොයින් සහ මත්කරල් තොගයක් ත්‍රිරෝද රථයකින් ප්‍රවාහනය කරමින් සිටිය දී ඊයේ (7) අත්අඩංගුවට ගත් බව පානදුර දකුණ පොලිසිය කියයි.



පානදුර මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයාට ලද තොරතුරක් මත පානදුර වලපල ප්‍රදේශයේ පොලිස් කණ්ඩායම රැකසිට මෙම ත්‍රිරෝද රථය පරීක්ෂා කිරීමේදී හෙරොයින් මත්කුඩු පැකට් 3600ක්, මත්කරල් 210ක් සහ විද්‍යුත් තරාදියක් එහි තිබී පොලිස් බාරයට ගෙන තිබේ.

මේ සම්බන්ධයෙන් සැකකරුගෙන් ප්‍රශ්න කිරීමේදී අනාවරණය වී ඇත්තේ එම මත්ද්‍රව්‍ය වෙනත් අයට අලෙවිය සඳහා තොග වශයෙන් බෙදහැරීමට මෙසේ ගෙන යමින් සිටි බවය.

සැකකරු පානදුර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්, කළුතර දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති සරත් කුමාර, පානදුර කොට්ඨාස පොලිස් අධිකාරී සමන්ත වෙදගේ, සහකාර පොලිස් අධිකාරී I නිශාන්ත සේනාරත්න යන මහත්වරුන්ගේ උපදෙස් පරිදි මූලස්ථාන පොලිස් පරීක්ෂක චාමින්ද පින්තු මහතාගේ ප්‍රධානත්වයෙන් අපරාධ අංශ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක රෝහණ සිල්වා, පොලිස් පරීක්ෂක එම්.එස්.පී. ලිවේරා, සැරයන් ආර්.එම්. අබේසේකර (39811), කොස්තාපල්වරුන් වන වී.ජී.එන්. තුෂාර (79335), ප්‍රියසමර (35149), එච්.ජී.ඩී.එන්. ගුණරත්න (29631) යන මහත්වරු වැටලීමට එක්වූහ.

# රනිල්ට රට බාර දුන්නොත් පැය 48න් ගෑස් බස්සනවා

## - වජිර අබේවර්ධන

**(අංජුල මහික වීරරත්න)**

**රනිල්ට රට බාර දුන්නොත් පැය 48 න් ගෑස් මිල බස්සන බව එක්සත් ජාතික පක්ෂ සභාපති වජිර අබේවර්ධන මහතා පැවසීය.**

එවැනි පියවර ගැනීම සඳහා දැනුම පළපුරුද්ද මෙන්ම පාලනය පිළිබඳ හැඟීමක් තිබිය යුතු බව කී වජිර අබේවර්ධන මහතා රනිල් වික්‍රමසිංහ 2015 වසරේදීත් රට බාර ගෙන එවැනි ආශ්චර්ය රැසක් කර පෙන් වූයේ මෙවැනිම අමාරු ආර්ථිකයක් තිබිය දී බව සිහිපත් කළේය.

කළුතර දිස්ත්‍රික්කයේ එජාප ප්‍රතිසංවිධාන වැඩසටහන්වලට සහභාගී වෙමින් එජාප සභාපතිවරයා මේ බව සඳහන් කළේය.

# යතුරුපැදි සහතික මගඩියකට ආර්.එම්.වී. ලිපිකාරිනියක් අත්අඩංගුවට

**(ඉන්දිකා රාමනායක සහ බණ්ඩාරගම - බිමල් ශ්‍යාමන් ජයසිංහ)**

**යතුරුපැදි ලියාපදිංචි කිරීමේ සහතික, නියමිත ක්‍රමවේදයෙන් බැහැරව නීති විරෝධී ලෙස නිකුත් කිරීමේ ජාවාරමක නිරතව සිටි බව කියන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ යතුරුපැදි පැවරුම් අංශයේ ලිපිකාරිනියක ඊයේ (7) දහවල් අත්අඩංගුවට ගත් බව කොළඹ අපරාධ කොට්ඨාසය කියයි.**

සැකකාරිය යතුරුපැදි තුනකට අදාළ ලියාපදිංචි සහතික මේ ආකාරයෙන් නීති විරෝධීව සකස් කර ලබා දී ඇති බව පොලිසිය පවසයි.

සැකකාරියගේ වංචාව සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත බාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාට කළ පැමිණිල්ලක් විමර්ශනය සඳහා මීට දින කිහිපයකට පෙර කොළඹ අපරාධ කොට්ඨාසය යොමුකර ඇත.

සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබාගැනීමට සැකකාරිය කොළඹ අපරාධ කොට්ඨාසයට ඊයේ (7) කැඳවනු ලැබ සිටි අතර එහිදී ප්‍රකාශය ගැනීමෙන් පසු ඇය අත්අඩංගුවට ගත් බව පොලිසිය කියයි.

වාහනවල නිකුත් කර ඇති පැවරුම් පොත්, විනාශ වූ හෝ අස්ථාන ගත වූ අවස්ථාවල සහ වෙනස් කර ගැනීමට අවශ්‍ය වන අවස්ථාවලදී එය නැවත නියමිත ක්‍රමය අනුව නිකුත් කිරීමට පොලිස් ස්ථාන වාර්තා ඇතුළු ලියකියවිලි ඉදිරිපත් කර ඒ ගැන කොමසාරිස්වරයා දැනුවත් කළ යුතු වුවද, සැකකාරිය ඒ කිසිවක් නොකර, ඔවුන්ට අවශ්‍ය පරිදි නීති විරෝධී ලෙස මෙම සහතික නිකුත් කර ඇති බව ද පොලිසිය පවසයි.

ඇය මේ සඳහා යොදගෙන ඇත්තේ ඇගේ පරිගණකය නොව, එම අංශයේම වෙනත් අයගේ පරිගණක බවත්, පොත් මුද්‍රණ පිටපත් පවා ඇය ලබාගෙන ඇත්තේ හොර රහසේ බවත් පොලිසිය සඳහන් කරයි.

ආයතනයේ සේවිකාවන් දිවා ආහාර ගැනීම හෝ වෙනත් කටයුත්තකට බැහැරව යන අවස්ථාවලදී සැකකාරිය එම සේවිකාවන්ගේ පරිගණක වෙත ගොස් ඇයගේ මුරපදයෙන්ම එහි සම්බන්ධ වී මෙම වෙනස් කිරීම සිදු කර ඇති බවටත් මුද්‍රණ පිටපත් ගන්නා සේවිකාව ඉන් බැහැරට ගිය අවස්ථාවක ඇයම මුද්‍රණ පිටපත් ද ලබාගෙන ඇති බවටත් තොරතුරු හෙළි කරගෙන ඇතැයි පොලිසිය කියයි.

අත්අඩංගුවට ගත් සැකකාරිය නයිනමඩම ප්‍රදේශයේ පදිංචිකාරියක බවත් ඇය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වසර 22ක පමණ කාලයක් තිස්සේ සේවය කරන බවත් පොලිසිය සඳහන් කරයි.

කොළඹ අපරාධ කොට්ඨාසයේ අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ජනක් නන්දන සහ සහකාර අධ්‍යක්ෂ, සහකාර පොලිස් අධිකාරි නෙවිල් ද සිල්වා යන මහත්වරුන්ගේ අධීක්ෂණය යටතේ, ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්සලම් ද සිල්වා මහතාගේ මෙහෙයවීමෙන්, එහි ඒකක හතේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ලසන්ත ධර්මරත්න, කොස්තාපල්වරුන් වන (84328) සාලින්ද, (77150) ප්‍රදීප්, (91816) කුමාර යන මහත්වරු සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා සැකකාරිය අත්අඩංගුවට ගත්හ.

අත්අඩංගුවට ගත් සැකකාරිය කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයට අද (8) ඉදිරිපත් කිරීමට නියමිතය.

# අය වැය 12 දා මැතිසබයට

## - හදන්න අංශ 102ක නියෝජිතයෝ එක්වෙලා

**(සුජිත් හේවාජුලිගේ සහ අංජුල මහික වීරරත්න)**

**ලබන වසර සඳහා (2022) වන රජයේ අයවැය ලේඛනය පාර්ලිමේන්තුවට ලබන 12 වැනිදා සිකුරාදා ඉදිරිපත් කිරීමට සියලු කටයුතු යොදා ඇතැයි මුදල් අමාත්‍යාංශය පවසයි.**

ආනයනකරුවන්, වෘත්තීය සංගම්, තේ, පොල්, රෙදි, එළවළු, පලතුරු, ආහාර, මත්ස්‍ය ඇතුළු අංශ 102 ක නියෝජිත කණ්ඩායමක් අයවැය ලේඛනය සකස් කිරීම සඳහා සහභාගී විය.

මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා විසින් අයවැය යෝජනාවලිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙනු ඇත.

භූමි සම්පත් හැකිතාක් උපරිම වශයෙන් කාර්යක්ෂමව යොදා ගැනීම, ඇති හැකි අය නොව නැති බැරි අය දිනවීම සහ නිෂ්පාදන ආර්ථිකය කේන්ද්‍රකරගත් අයවැයක් මෙවර ඉදිරිපත් කෙරෙන බව රජයේ ආරංචි මාර්ගවලින් පැවසේ.

මෙය මෙරට 76 වැනි අය-වැය ලේඛනය වන අතර ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ රජයේ දෙවැනි අයවැය ලේඛනයයි.

අමාත්‍යවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු උසස් නිලධාරීන් මෙන්ම විවිධ දේශපාලන පක්ෂ නායකයන්ගේ දායකත්වය ද අයවැය ලේඛනය සකස් කිරීම සඳහා ගෙන ඇතැයි ද එම අමාත්‍යාංශය පවසයි.

| ශනිදා වාසනාව | අද කෝටිපති | ලග්න වාසනාව | ජාතික සම්පත | මහජන සම්පත | සුපර් බෝල් | ජයෝදා |
| --- | --- | --- | --- | --- | --- | --- |
| 3717 වැනි වාරය | 1382 වැනි වාරය | 3268 වැනි වාරය | 1157 වැනි වාරය | 4573 වැනි වාරය | 1556 වැනි වාරය | 1782 වැනි වාරය |
| නොවැ: 7 වැනිදා | නොවැ: 7 වැනිදා | නොවැ: 7 වැනිදා | නොවැ: 01 වැනිදා | නොවැ: 01 වැනිදා | නොවැ: 7 වැනිදා | නොවැ: 3 වැනිදා |
| ඉංග්‍රීසි අකුර - M | ඉංග්‍රීසි අකුර - J | ලග්නය: මකර | ජයග්‍රාහී ලග්නය - මේෂ | ඉංග්‍රීසි අකුර - T | ඉංග්‍රීසි අකුර - X | ඉංග්‍රීසි අකුර - E |
| 34-38-39-75 | 04-09-34-59 | 05-06-49-53 | 1-9-6-3-4-5 | 3-7-7-7-9-0 | 07-47-71-76 | 12-40-59-61 |

| සංවර්ධන වාසනාව | කෝටිපති කප්රුක | ධන නිධානය | ගොවිසෙත | සම්පත ලග්න වරම | සසිරි | මෙගා පවර් | සුපිරි වාසනා |
| --- | --- | --- | --- | --- | --- | --- | --- |
| 456 වැනි වාරය | 762 වැනි වාරය | 603 වැනි වාරය | 2868 වැනි වාරය | 04 වැනි වාරය ජූලි: 30 | 98 වැනි වාරය | 921 වැනි වාරය | 1625 වැනි වාරය |
| නොවැ: 4 වැනිදා | නොවැ: 07 වැනිදා | නොවැ: 01 වැනිදා | නොවැ: 01 වැනිදා | M-2-0-4-5-1-5 | නොවැ: 3 වැනිදා | නොවැ: 01 වැනිදා | ඔක්: 26 වැනිදා |
| දෛව අංකය - 04 | ඉංග්‍රීසි අකුර - C | ජයග්‍රාහී අක්ෂරය-P | ඉංග්‍රීසි අකුර-P | ලග්න වරම | | සුපිරි අංකය:13 | සුපිරි අංකය: 04 |
| ඉංග්‍රීසි අකුර - I | | | | මේෂ | | ඉංග්‍රීසි අකුර - N | |
| 52-62-63 | 01-16-24-29 | 08-39-49-63 | 40-42-54-65 | 17-37-84 | 18-40-42 | 36-72-76-80 | 17-41-42-61 |

සුමිහිරි ගම්මානයකලු. ගම බලන තැනලු. එහි හමුවක්ලු. හෙක්ටයාර් හතරකින් ආ නියෝජිත දවල් කෑමෙන් පසු අතුරුදන් වුණාලු. දින දෙක තුනක් යද්දී අසල සිටියවුන්ට ලක්ෂණ පහළ වුණාලු. ධනාත්මක බව හෙළි වුණේ ඊට පස්සේලු.

අතුරුදන් වූ ඇත්තාටත් ලකුණු තිබියදී ආ ගමනින් මේ වින්නැහිය වෙලාලු. ආදර්ශයක් දිය යුතු අයගේ හැසිරීම තවත් පොකුරක මුල වගේලු.

(පුෂ්පකුමාර මල්ලවආරච්චි)

# සෙල්ෆි ගහන්න ගිහින් තරුණයා දුම්රියේ ගැටී මරුට

(වන්නි - රොමේෂ් මධුෂංඛ)

**වව්නියාව සෙට්ටිකුලම් ප්‍රදේශයේදී සෙල්ෆි ඡායාරූපයක් ගැනීමට උත්සාහ ගත් තරුණයකු මන්නාරම දුම්රිය මාර්ගයේදී ධාවනය වූ දුම්රියක ගැටීමෙන් මියගොස් ඇතැයි සෙට්ටිකුලම් පොලිසිය පවසයි.**

සෙට්ටිකුලම් දකුණ කල්ලාරු පාලම මතදී මෙම අනතුර පසුගිය 05 වැනිදා සිදුව ඇතැයි පොලිසිය සඳහන් කරයි.

මන්නාරමේ සිට අනුරාධපුර දක්වා ධාවනය වූ දුම්රිය ගමන් කරන අතරතුරදී දුම්රිය මාර්ගයේ සිට තරුණයන් දෙදෙනකු දුම්රිය ගමන් කරන අතරවාරයේ සෙල්ෆි ඡායාරූපයක් ගැනීමට උත්සහ දරා ඇත.

එහිදී තමන් දුම්රියේ ගැටෙන බව එක් තරුණයකු දැක පාලමෙන් පැන ඇති අතර අනෙක් තරුණයා දුම්රියේ ඉදිරිපස කොටසේ ගැටී විසිවීමෙන් එම ස්ථානයේම මියගොස් ඇතැයි පොලිසිය සඳහන් කරයි.

මියගිය තරුණයාගේ මළ සිරුර සෙට්ටිකුලම් දුම්රිය ස්ථානයට රැගෙන ඒමෙන් අනතුරුව සෙට්ටිකුලම් පොලිසිය මගින් සෙට්ටිකුලම් රෝහලට බාරදෙනු ලැබීය.

අනතුරින් මියගොස් ඇත්තේ මන්නාරම මුරුංගන් ප්‍රදේශයේ පදිංචි 21 හැවිරිදි සුරේස් නමැත්තෙකි.

සෙට්ටිකුලම් පොලිසිය වැඩිදුර පරීක්ෂණ මෙහෙයවයි.


## පස්සර තරුණියක් මරුට

(බදුල්ලේ පාලිත ආරියවංශ)

කොවිඩ් 19 ආසාදනයට ලක් වූ 22 හැවිරිදි තරුණියක ජීවිතක්ෂයට පත්වූ බව පස්සර සෞඛ්‍ය වෛද්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසයේ පරිපාලන මහජන පරීක්ෂක එන්. ජයකුමාර් මහතා පැවැසීය.

පස්සර නගරයේ සිය නිවෙසේදීම ජීවිතක්ෂයට පත්වූ මෙම තරුණියගේ දේහය බදුල්ල මහරෝහලට රැගෙන විත් පී.සී.ආර් . පරීක්ෂණයට ලක්කළ අවස්ථාවේ ඇය කොවිඩ් 19 ආසාදිතයෙක් බවට තහවුරු වී තිබේ.

## තිස්ස හේවාවිස්සගේ හිනා වැස්ස




## ශාස්ත්‍ර අහන්න ගිහින් පේනකාරියටත් යන එන මං නැතිවෙලා

(උණවටුන - ඩී.ජී. සුගතපාල)

ඔහු පළමුවෙන්ම පොල් ලී මුදලාලි කෙනකු ළඟ වැඩ කළේය. කපන ලද පොල් ගස් විවිධ ප්‍රමාණවලට කපා ඒවා සුද්ධ කර පරාල යට ලී ආදිය සඳහා සකස් කළේ ඔහුය. තම සේවකයාගේ විශ්වාසවන්තකම පිළිබඳ පොල් ලී මුදලාලි ද පැහැදී සිටියේය. එහෙත් ඔහු වැයෙන් පොල් පරාල සුද්ධකරන ගමන් නිතරම සිතුවේ හැමදමත් අනුන් යටතේ වැඩ කරනවාට වඩා තමන්ටත් පොල් ලී වෙළෙඳ සලක් පටන් ගන්නට ඇත්නම් කොපමණ හොඳද යනුවෙනි.

දෙයියෝ සාක්කි

මේ අතර ටික කලකින්ම මුදලාලි අසනීප තත්ත්වයට පත්විය. පොල් පරාල යට ලී වෙළඳම ද නැතිව ගියේය. ඔහු ණයට මුදල් ලබාගෙන පළාතේ ඇවිදිමින් පොල් ගස් කපාගෙන ඇවිත් පොල් ලී වෙළෙඳසලක් පටන් ගත්තේය.

දැන් ඔහුගේ ලී වෙළෙඳම සරුය. මේ අතර දිනක් උදෑසන නැගිට බලනවිට ලී මඩුවේ තිබූ අඩි 18ක් දිග යට ලී තුනක්ම සොරුන් ගෙන ගොස්ය. තමාගේ ලී මඩුව දියුණුවන නිසා කිසිවකු මෙය කරන්නට ඇතැයි ඔහු සිතුවේය. එහෙත් එය හරියට දැන ගැනීමට ඔහුට අවශ්‍ය විය.

එනිසා එදිනම සවස ප්‍රදේශයේ දේවාරූඪයෙන් ශාස්ත්‍ර කියන ශාස්ත්‍රකාරියක ළඟට ගියේය. පෝලිමේ සිටි ඔහු තමාගේ වාරය පැමිණි පසු බුලත් කොළ කිහිපයක් මත රුපියල් තුන්සීයයි සත දහයක් තබා ශාස්ත්‍රකාරියගේ අතට දුන්නේය. ඒ සමගම ඇය ඔළුව දෙපසට කරකවමින් මහ හඬින් දෙවියන්ට කන්නලව් කරන්නට වූවාය.

"හ්ම්... හ්ම්... දරුවා තමාගේ නැති වුණ දෙයක් ගැන අහන්නේ"

"එහෙමයි එහෙමයි මැණියෙනි"

ඔහු ද පිළිතුරු බැන්දේය.

"තමා දියුණු වෙනවට ඉරිසියාවේ තමයි මේ සොරකම කරල තියෙන්නේ. දරුව ඔය දරුවගේ ගෙදරට නිතරම යන එන කෙනෙක් මේක ඉණේ ගහගෙන ගිහිල්ලා. ආපහු ලැබෙන්නේ නම් නැහැ දරුවා"

මෙය අසා සිටි ඔහුගේ කෝපය ඉහවහා ගියේය.

"මොනවා අඩි දහඅටක් දිග යට ලී තුනක් කොහොමද ඉණේ ගහගෙන යන්නේ. බොරු කියන්න එපා. මගේ සල්ලි දෙන්න"

ඒ සමගම ශාස්ත්‍ර ඇසීමට පැමිණ සිටි අනෙක් අයටද ඇතිවූයේ ශාස්ත්‍රය ගැන සැකයකි. ඔහුගේ කෑගැසීමට වටාපිටාවේ අයද පැමිණියහ. එහි ප්‍රතිඵලය වූයේ ඔහුට මෙන්ම වැඩි කල් නොගොස් ශාස්ත්‍රකාරියට ද දේවාලයෙන්ම පිටවීමටය.









# මාරක රිය අනතුරෙන් මවුපියන්ට පාඩමක්

'ගවරාගේ ආදරය' යනු සිංහල භාෂා ව්‍යවහාරයේ එන උපහැරණයකි. ගවරාගේ පැටියාට තුවාලයක් වූ කල ගවයා එම තුවාලය දිවෙන් පිරිමදී. එම පිරිමැදීම නිසා පැටියාට ඒ මොහොතේ තාවකාලික සුවයක් ලැබේ. එහෙත් එම පිරිමැදීම නිසා තුවාලය ප්‍රසාරණය වෙයි. නියත ප්‍රතිඵලය වන්නේ පැටවා මිය යාමය. ගවරාගේ ආදරය විනාශය රැගෙන එන්නේ එසේය.

ඇතැම් දෙමාපියන් සතුව තිබෙන්නේ ද ගවරාගේ ආදරයම වේ. දරුවාට ඇති ආදරය නිසාම දරුවාට අවශ්‍ය දේ කිරීමට නිදහස හා අවසරය ලබා දෙයි. ඉල්ලන ඉල්ලන දේ ලබා දෙයි. එහි හොඳ නරක සොයා නොබලයි. උචිත-අනුචිත බව තැකීමක් නොකරයි. දරුවාට සිතැඟි පරිදි හැසිරීමට ඉඩ ලබා දෙයි. අවසානයේ එය මහා විනාශයකට හේතුවන බව පහසුවෙන් අමතක කරයි.

ඉකුත් 4 වැනිදා කොළඹ-මීගමුව ප්‍රධාන මාර්ගයේ මාරක රිය අනතුරක් සිදුවිය. සුඛෝපභෝගී මෝටර් රථයක් වේගය පාලනය කරගත නොහැකිව පාරෙන් ඉවතට පැන වාහන හතරක ගැටීමෙන් එක් පුද්ගලයකු මිය ගිය බව අප පුවත්පත ප්‍රධාන පුවත ලෙස වාර්තා කළේය. පස් දෙනකු බරපතළ ලෙස තුවාල ලබා ඇතැයි වාර්තා කළ එම ප්‍රවෘත්තියෙන් ඉන් එක් අයකුගේ තත්ත්වය බරපතළ බව ද සඳහන්ය.

මෙම මාරක රිය අනතුරෙහි විශේෂත්වය වන්නේ අනතුර සිදු කළ සුඛෝපභෝගී රථයේ රියැදුරා දහසය හැවිරිදි දරුවකු වීමය. එම මෝටර් රථයේ හිමිකරු 16 හැවිරිදි පාසල් සිසුවාගේ පියා මහබාග ප්‍රදේශයේ ප්‍රධාන පෙළේ ස්වර්ණාභරණ වෙළෙඳ සැලක හිමිකරුවෙකි. ඔහු එම රථය සෝද මිදුලේ නතරකර තිබිය දී 16 හැවිරිදි දරුවා රථය රැගෙන ගොස් ඇති බවත් ඒ බව පියා ඇතුළු නිවැසියන් නොදැන සිටි බවත් මාධ්‍ය වාර්තාවල සඳහන්ය.

දරුවා යනු දෙමාපියන්ට ආභරණයකි, ආඩම්බරයකි, අභිමානයකි. තම දරුවා උස් මහත් වෙමින් ප්‍රකට කරන දස්කම් විස්කම් දෙස බලා දෙමාපියෝ අපමණ සතුටක් ලබති. දරුවන්ට ආදරය කරන දෙමාපියන්ගේ හැටි එහෙමය. කුඩා දරුවන් උකුල මත තබාගෙන රිය පදවන තාත්තලා සිටිති. එය බෙහෙවින් අනතුරුදායක වුවත් ආදරය වැඩි කමට තාත්තලා එසේ කරති. දරුවා කුඩා වුවත් රිය පදවන්නේ නම් එය අගය කරති. සෙස්සන් ඉදිරිපිට ඒ ගැන සතුටෙන් කතා කරති. මේවා සාමාන්‍යයෙන් සිදුවන දේය. එහෙත් 'නූලෙන් ගැස්සී ගියොත්' සිදුවිය හැකි දේ සම්බන්ධයෙන් ද අවබෝධයක් තිබිය යුතුය. නැතහොත් එය දරුවාගේ ජීවිතයට අනතුරකි. දරුවා නිසා සෙස්සන්ගේ ජීවිතවලට අනතුරකි. රිය අනතුරට සම්බන්ධ දරුවාත් දරුවාගේ පියාත් දැන් රිමාන්ඩ් බාරයේය.

ඇතැම් දරුවන් වෙනස්ය. ඇතැම් දරුවන්ට චිත්තාවේග පාලනයක් නැත. ඇතැම්විට අධික ලෙස කෝපයට පත්වන්නකු විය හැකිය. මානසික ආබාධ ඇති දරුවෝ ද සිටිති. ඇතැම් දරුවෝ මුරණ්ඩු වෙති. දරුවාගේ නියම තත්ත්වය හඳුනා ගැනීමට දෙමාපියන් සමත් විය යුතුය. එසේ හඳුනා ගැනීමෙන් එයට ගැළපෙන පරිදි වැඩපිළිවෙළක් සකස් කළ යුතුය. එය දෙමාපියන්ගේ වගකීමය. එම වගකීමෙන් බැහැරවීමට දෙමාපියන්ට නොහැකිය. 'දරුවන්ගේ වැරැදිවලට දෙමාපියන් පලි නැතැයි' තර්කයක් මත කළ හැකිය. එහෙත් වැරැදි නොකරන දරුවකු නිර්මාණය කිරීම දෙමාපියන් සතු අත්හළ නොහැකි වගකීමකි.

පොලිස් කූඩුවේ සිටින පුතුට මත්පෙති රැගෙන එන අම්මලා ගැන මාධ්‍ය වාර්තාවන්හි සඳහන්ය. බන්ධනාගාරයේ සිට උසාවියට රැගෙන ආ පුතුට මත්ද්‍රව්‍ය රැගෙන යන තාත්තලා සිටිති. ඒ මත්ද්‍රව්‍ය නොමැතිවීම නිසා පුතු විඳින වේදනාව ඔවුන් දන්නා නිසා විය හැකිය. ඇතැම් දරුවන්ට 'කුඩු' ගැසීමට මුදල් දෙන්නේ ද අම්මලා තාත්තලාමය. එය අවසානයේ වැටෙන්නේ 'ආදරය' නැමැති ගිණුමටය. එහෙත් එම ආදරය 'ගවරාගේ ආදරයෙන්' කිසි ලෙසකින් හෝ වෙනස් නොවන්නකි.

කුඩු නැතිව දුක් විඳින පුතාට කුඩු ගෙනත් දීම වෙනුවට මවුපියන් කළ යුතුව තිබෙන්නේ කුඩු නොගසනා දරුවකු නිර්මාණය කිරීමය. ඇතැම් දෙමාපියන් සිතන්නේ දරුවාට හොඳම ඉගැන්වීම සැප පහසුකම් සලසාදීම තමා අතින් සිදුවිය යුතු ප්‍රධාන යුතුකම් සේය. එහෙත් එය එසේ නාවේ. සිඟාලෝවාද සූත්‍රයේදී බුදු රජාණන් වහන්සේ දෙමාපියන්ගෙන් දරුවන්ට ඉටුවිය යුතු යුතුකම් පහක් දක්වා තිබේ. ඉන් පළමු වැන්න පාපයෙන් හෙවත් වරදින් වැළැක්වීමය. දෙවැන්න යහපතට යොමු කිරීමය. අධ්‍යාපනය ලබාදීම දක්වා ඇත්තේ ඉන් පසුවය. වැරැද්දෙන් නොවැළකුණු, යහපතෙහි නොයෙදෙන දරුවා කිසි විටෙක මවුපිය අභිමතාර්ථ ඉටු නොකරයි. 'ගුණ නැණ බෙලෙන් යුතු පුතුමය ඉතා ගරු' යනුවෙන් දක්වා තිබෙන්නේ එහෙයිනි. මේවා දිවමන් වැකි ලෙස මවුපියන් ප්‍රගුණ කළ යුතුය. එවිට දරුවන් වෙනුවෙන් කඳුළු සලන්නට සිදු නොවේ.

ලංකාදීප
අන්තර්ජාලයේ ප්‍රථම සිංහල පුවත්පත
2021 නොවැම්බර් මස 8 වැනිදා සඳුදා
වෙබ් අඩවි--: වෙබ්.ලංකාදීප.ලංකා- www.lankadeepa.lk
කර්තෘ මණ්ඩලය : 2448321, 2423919, 5383237 ෆැක්ස් : 2438039, 2479240, 5383240 බෙදාහැරීම් : 2479625 ෆැක්ස් : 2479650
දැන්වීම් :2479540, 5383383, 5330330, ෆැක්ස් : 2314864, 2479595




# දේශපාලන ඇසින් සියල්ල දැකීමේ වරද

**ශ්‍රී ලංකාව මේ වනවිට රටක් හැටියට ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටී. එහෙත් මෙය ගෝලීය ආර්ථික ගැටලුවකි. නොඑසේව ජාතික ආර්ථික ගැටලුවක් නොවේ. ගෝලීය ප්‍රශ්නයක් නිසා එයින් පරිධියේ රටවලට ඇතිකරන බලපෑම වැඩිය. සාමාන්‍යයෙන් ලෝක ආර්ථිකයේ දිගුකාලීන කම්පනයක් දරාගෙන සිටීම පහසු මධ්‍යයේ පවතින රටවලටය. රටේ ආර්ථික ශක්තිය, මූල්‍ය සංචිත ප්‍රමාණය, දේශීය නිෂ්පාදන ක්‍රියාවලිය යම් පමණකට ආරක්ෂා කිරීමට ඔවුනට හැකියාව තිබේ. ඔවුන් ඒ සඳහා භාවිත කරන උපක්‍රම ද වෙනස්ය.**

නිදසුනකට ගතහොත් නිවෙසේ සිට වැඩ කිරීමේ දී මේ රටවලට තිබුණේ ඉහළ තාක්ෂණික හැකියාවකි. එනිසා සේවා ස්ථානයෙන් බැහැර සිට වැඩ කිරීම ඔවුන්ට ලොකු කම්පනයක් වුණේ නැත. තවත් සරලව කිවහොත් ධනවත් පුද්ගලයකුට රැකියාව අහිමිව ජීවත්වීමට ඇති හැකියාව සහ දුප්පතෙකුට ඇති හැකියාව සමාන නැත. මෙහි තවත් සුවිශේෂී කරුණක් වූයේ මෙම තත්ත්වය නිසාම ගෝලීය ධනය නැවතත් මධ්‍යයේ රටවල් හෙවත් ධනපති රටවලට සංකේන්ද්‍රණය වීමය. කොවිඩ් වසංගතයට එන්නත් සොයාගනු ලැබුවේ ඔවුන් විසිනි. එවිට ඒවා විකිණීමෙන් ආදායම ලැබෙන්නේ ඔවුන්ටමය. ලංකාව වැනි රටවල සංචාරය කර මුදල් වියදම් කරනු ලැබුවේ ද ඔවුන් විසිනි. දැන් සංචාරක සීමා නිසා එම මුදල් ද ඇත්තේ ඔවුන් අතය. කොවිඩ් සමයේ බිඳ වැටුණු සමාජ බැඳීම් ගැට ගසන අන්තර්ජාල සමාජ ජාල සබඳතා හිමිකාරිත්වය ඇත්තේ ද ඔවුන්ටය. එවිට එමගින් ලැබෙන ලාභය ද නැවත යන්නේ ඔවුන් වෙතය. ලොව ධනවත්ම පුද්ගලයන්ගේ ආදායම් කොවිඩ් වසංගත සමයේ දී ඉහළ ගොස් ඇත්තේ මේ පසුබිමේය.

2021 මැද භාගය වනවිට ආසන්න වශයෙන් ඩොලර් ට්‍රිලියන 3.5ක පමණ ආදායමක් ලෝකයට අහිමිව ඇතැයි කියැවේ. මේ අහිමිවීමේ වැඩි බලපෑම ඇත්තේ ලංකාව වැනි රටවලටය. චීනයේ ආර්ථික වර්ධන වේගය සියයට 9.8 - 10 අතර යැයි විශ්වාස කෙරේ. ඔවුන්ගේ ආදායම මේ වනවිට ඩොලර් ට්‍රිලියන 14ක් පමණ වේ. එය සියයට 10කින් පමණ වැඩිවීම යනු ආදායම ඩොලර් බිලියන 140කින් පමණ වැඩිවීමය. එහෙත් අපේ රටේ මුළු වත්කම ද ඇත්තේ ඩොලර් බිලියන 84 සීමාවේය. එවැනි අගයකට සියයට 2ක පමණ වර්ධනයක් යනු සොච්චමකි. තවත් කරුණක් නම් බොහෝ සංවර්ධිත රටවල් යනු තවත් රටක නිෂ්පාදන මත යැපෙන්නෝය. එහෙත් ඇතැම්විට ඒ නිෂ්පාදන අත්‍යවශ්‍යම නැත. නිදසුනකට අපේ රටේ ඇඟලුම් නිෂ්පාදන නැති වුවත් ඔවුන්ට සිය පැරණි ඇඟලුම් භාවිත කළ හැකිය. ලංකාවේ තේ වෙනුවට වෙනත් පානයක් පරිභෝජනය කළ හැකිය. අපේ සුළු අපනයන බෝග වුවත් මාළු වුවත් එසේය. අපේ විදෙස්ගත කම්කරු ශ්‍රමයට වුව මේ කාරණය පොදුය. එහෙත් මෙවැනි දෙයින් ලංකාව වැනි රටවලට අහිමි වන වත්කම අති විශාලය.

**ලෝකයේ මේ වනවිට වැඩිම වත්කම් උපයන්නේ සේවා අංශයෙනි. එහෙත් ලංකාවේ පවතින්නේ අතිශය දුර්වල සේවා අංශයකි. ලංකාවේ සේවා අංශය යැයි කියද්දී සංචාරක කර්මාන්තය, ඇඟලුම් කර්මාන්තයේ ඇතැම් අංශ, විදෙස්ගත ශ්‍රමිකයන් පෙන්වා දිය හැකිය. කොවිඩ් වැනි වසංගත තත්ත්වයක දී මේ අංශවලට එල්ල වන්නේ මරු පහරකි.**

එසේ බලද්දී කොවිඩ් වැනි වසංගතයක දී සංවර්ධන රටවලට ඇත්තේ ධනය නොලැබීම ගැන ප්‍රශ්නයක් නොවේ. ධනය ලැබීමේ වේගය ගැන ප්‍රශ්නයකි.

## රටම හසුවූ උගුල්

ලංකාවට කිසියම් ප්‍රමාණයකට හෝ විදේශීය මුදල් ගලා ඒමක් තිබුණේ නම් දැන් එය අපට අහිමිව තිබේ. එහෙත් අපේ ජනයා භාවිත කරන්නේ නතර කළ හැකි භාණ්ඩ නොවේ. අපට ඉන්ධන ආනයනය නතර කරන්නට බැරිය. ගෑස් ද එසේය. හාල්, පිටි සහ ලූනු වුව එසේය. ගෝලීය ආර්ථික ලෝකයෙහි අන්තර්ජාලය නොමැතිව ජීවත්වීමට ද නොහැකිය. කාරණය නම් අප මෙම සියලු දෑ සපයා ගන්නේ ලෝක වෙළෙඳපොළෙන් වන බැවින් ඒ සඳහා ජාත්‍යන්තර මිලක් ගෙවීමට සිදුවීමය. එසේ වුවද දැන් කොවිඩ් නිසා පෙර පරිදි එම නිෂ්පාදන සිදුවන්නේ ද නැත. නිදසුනකට නවසීලන්තයේ බැටළුවන්ගේ ලොම් මිලදී ගැනීමට චීනය සූදානම් නැත. එසේය කියා බැටළුවන් මරා දමන්නට නොහැකිය. තවද ගල් අඟුරු ආකරවල සේවය කිරීම් නතර කර ඇත. මේ ක්‍රියා සෘජුවම නිෂ්පාදනයට බලපායි. නිෂ්පාදනය සිදුවුවත් සැපයීම්, ප්‍රවාහන, රක්ෂණ වැනි අනෙක් ක්‍රියාවලිවල මිල ඉහළ ගොස් ඇත.

**යුරියාවල ලෝක වෙළෙඳපළේ මිල සීයට තුන්සීයකින් පමණ වැඩි වී ඇත. ගෑස් මිල වැඩි වී ඇති අතර ඉන්ධන මිල වැඩිවෙමින් පවතී. මේ එළඹෙන්නේ බොහෝ රටවලට සීත කාලයයි. සීතලෙන් බේරෙන්නට මින් පෙර ගෑස් භාවිත කළ පිරිස් ගෑස් මිල ඉහළ නිසා ඩීසල්, පෙට්‍රල්, ලාම්පුතෙල් යන විකල්පවලට යොමුවී සිටිති.**


ලෝක නිෂ්පාදන නොමැතිව ජීවත්වීමට බැරි තත්ත්වයට අප පත්ව ඇතත් ලෝකයට එසේ නැත. එවිට අපනයන කර ලාභ උපයන තත්ත්වයක ලංකාව නැත. අවුරුදු පනහක් හැටක් තිස්සේ ආර්ථිකයේ දියුණුවක් නොමැතිව ගිය ගමන නිසා මෙවැනි වාතාවරණයකට මුහුණ දෙන්නේ කෙසේද? යන්නත් අපට ආගන්තුකය. මෙවැනි තත්ත්වයක දී ඩොලර් වත්කම් වර්ධනය කරගන්නේ කෙසේදැයි අප තවමත් සිතා නැත. එක්කෝ අපට සිදුවන්නේ අපේ දේපළ විකුණා දමන්නටය. එසේ නැත්නම් තවදුරටත් ණය වීමටය.

**ප්‍රධාන සාධකයක් වන්නේ රටේ මහජනයාය. සැබැවින්ම දැන් මහජනයා සිටින්නේ විපිළිසරවය. දේශපාලනික වශයෙන් කලබෑගැනිවලට ඔවුන් පැටලෙන්නේ ද එහෙයිනි. එහෙත් මේ ආරාවුල විසඳගත හැක්කේ ඔවුන් සමග පරතරය වැඩිකර ගැනීමෙන් නොව සක්‍රීය සංවාදයක් මගින් නිසි තොරතුරු සන්නිවේදනයෙනි. යහපත් තීරණ විනිවිදභාවයෙන් යුක්තව සාකච්ඡාවෙන් සම්මුතියෙන් ක්‍රියාවට නැගීමෙනි.**

මේ ආර්ථික අර්බුදයේ දී ඇතැමුන් විවේචනය කරන්නේ දේශපාලකයන්වය. එහෙත් මේ අවුලේ මුල ඇත්තේ සමස්තයේය. පළමු ශ්‍රේණියට ඇතුළත් කළ දරුවන්ගෙන් උසස් පෙළ සමත් වන්නේ දක්ෂතමයෝය. එයින් ද විශ්ව විද්‍යාලවලට බඳවා ගැනෙන්නේ විශිෂ්ටයෝය.

**එවිට විශ්වවිද්‍යාල උපාධි ලබන්නේ මේ රටේ ප්‍රශස්තම මට්ටමේ පිරිස යැයි අපට පිළි ගැනීමට සිදුවේ. මේ විශිෂ්ට යැයි කියන පිරිසෙන් අතිබහුතරයක් දැන් සේවය කරන්නේ රාජ්‍ය අංශයේය. එහෙත් අපේ රටේ වඩා අකාර්යක්ෂම අංශය ද රාජ්‍ය අංශයයි.**

එවිට රාජ්‍ය අංශය නියෝජනය කරන්නේ මේ රටේ බුද්ධිමත් යැයි කියන පිරිසය. මෙය විරුද්ධාභාසයකි. සැබැවින්ම ලංකාවේ රාජ්‍ය අංශය ශක්තිමත්ව තිබුණේ නම් මීට වඩා ආදායමක් ලබා



පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ
මහාචාර්ය මාලක රණතිලක

ගැනීමට ඉඩ තිබුණි. ඇතැමුන් කියන පරිදි ලංකාවේ ආර්ථික වර්ධනයේ ප්‍රශ්නයට හේතුව දේශපාලනයම පමණක් නොවේ. ලංකාවේ බොහෝ අය කරන්නේ රැකියාවක් ලැබීම සමග ණයක් ගෙන නිවෙසක් ඉදිකිරීමය. ඉන්පසු කරන්නේ කුමන හෝ අයුරකින් සිය දරුවන් ලොකුම පාසලකට ඇතුළත් කිරීමය. ඉන්පසු ඔවුහු තවදුරටත් දුෂ්කරතාවට පත් වෙති. නිවෙස ඉදිකර අවසන් නැති නිසා කුලී නිවෙසකට වියදම් කිරීමට ද නොහැකිය. පදිංචි ස්ථානය වෙනස් කළත් දරුවන් අධ්‍යාපනය ලබන පාසල වෙනස් කිරීම කිසිසේත් පහසු නැත. මෙසේ බලද්දී ලංකාව යනු සමාජ ආර්ථික දේශපාලනික යන අංශවලින් උගුලකට ලක් වූ රටකි.

මිනිසුන්ගේ ආදායම් ඉහළ නොදමා බඩු මිල පමණක් ඉහළ ගියහොත් ඒ රටේ මිනිස්සුන්ට ජීවත්වෙන්නට විදියක් නැත. එහෙත් මේ එහෙම කියන වකවානුවක් නොවේ. බංගලාදේශයට ඇති ආර්ථික වත්කම අපට නැත. ලෝකය විසින් අපට සපයනු ලබන භාණ්ඩ මිල ඉහළ යද්දී ලංකාව තුළ ද නිෂ්පාදන මිල වැඩි විය.

**මේ අතරේ ගුරුවරුත් වැඩි වැටුප් ඉල්ලා බල කරද්දී ආණ්ඩුවට සිදුවන්නේ මුදල් අච්චු ගැසීමටය. එසේ අති විශාල මුදල් ප්‍රමාණයක් පසුගිය කාලයේ දී අච්චු ගැසීය.**

විශේෂයෙන්ම කොවිඩ් වසංගතය සඳහා දැන් වැය කරන මුදල මීට පෙර අපේක්ෂා කළ කරුණක් නොවේ. මේ මුදල යනු ඔවුන් පරිභෝජනය කරන භාණ්ඩවල මිලයි. කොවිඩ් වසංගතය සඳහා ආණ්ඩුව වෙන් කරන සමස්ත වියදම ජනගහනයෙන් බෙදූවිට එන අගයට වැඩි මුදලක් ඔවුහු බදු ලෙස ගෙවා ඇත. එහෙත් ජනතාවට මේ කතාව තේරෙන්නේ නැත. කොවිඩ් සම්බන්ධයෙන් වුව අපරීක්ෂාකාරී වීම සමස්ත සමාජය අනතුරේ හෙළන බව ඔවුන්ට දැන් මතක නැත. බොහෝ දෙනෙක් මේ වනවිට විනෝද සවාරි යන්නට පටන්ගෙන තිබේ. මෙසේ අනතුරේ වැටීමෙන් අවසන දඬුවම් ලබන්නේ සියලු දෙනාය.

**ආර්ථික අර්බුදය ගැන මගේ කියවීමේ දී නම් ඊට ජනතාවගේ ද සංයුක්ත මැදිහත්වීමක් අත්‍යවශ්‍යය. එය හුදෙක් දේශපාලකයන්ට පමණක් බාර කළ කාලය දැන් අවසානය. පොදු ජනයා මින් ඉදිරියට දේශපාලකයා පමණක් නොව රාජ්‍ය සේවය මෙන්ම තමන් ගැන ද මීට වඩා සිතිය යුතුය. පොහොර ප්‍රශ්නය යැයි කියමින් ගොවීහු මේ දිනවල වීදි බසිති. එහෙත් කොවිඩ් වයිරසය නැවත හිස එසෙව්වහොත් ඊට ආණ්ඩුව වෙන්කරන්නේ මහජන බදු මුදල්ය.**

මහජන බදු මුදල් යනු මහජනයාගේම සල්ලිය. එවිට කිසියම් ආකාරයකට මේ ගොවීන්ගේම සල්ලි නැවතත් වැය කෙරෙන්නේ වසංගතය මඩින්නටය. ඒ අර්ථයෙන් ගත්කල තමා පරෙස්සම් වීම යනු හුදෙක් සෞඛ්‍ය ආරක්ෂා කරගැනීමම නොව සිය ධනය ද ආරක්ෂා කරගැනීමය. අනෙක් අතට ලෝකය තිබෙන තත්ත්වය අනුව ලංකාව සිටින්නේ ද ආයෝජන ළඟා කර ගත හැකි තැනක නොවේ. මේ වේලාවට යම් ආයෝජනයක් පැමිණියත් ඒවා අපට වාසිදායක ඒවා නොවේ. එනිසා අප බැලිය යුත්තේ අඩුම තරමින් රටක වියදම අඩු කරගැනීම ගැනය.

## පරීක්ෂාකාරීව ගතයුතු තීන්දු

නිදසුනකට පෙට්‍රල් රුපියල් 10කින් අඩු කර ඇතැයි පුවතක් ඇසූ පුද්ගලයෝ වහාම ඉන්ධන හල් කරා යති. වැඩි වේලාවක් යන්නට පෙර අප දකින්නේ දිගු පෝලිම්ය. ලීටර් 50ක් ලබා ගත්තත් ලාබය රුපියල් 500කි. එහෙත් මිනිසුන් පෝලිම්වලට වී පිච්චූ ඉන්ධන හා මිනිස් පැය ප්‍රමාණය හා සසඳද්දී ලැබූ ලාභයක් නැත. ප්‍රශ්නය නම් මිනිසුන් මෙවැනි දේ ගැන තාර්කිකව නොසිතීමය.

**ඇත්ත වශයෙන්ම මෙවැනි කාල පරිච්ඡේදයක දී මිනිසුන් කළ යුත්තේ වියදම් ඇතිවීමට ඇති අවකාශයක් වේ නම් එය හැකි සෑම අයුරින්ම අවම වන පරිදි කටයුතු කිරීමටය. නිදසුනකට ඇතැමුන් කියන්නේ කිරි පිටි නොබී බැරි බවය. මොහොතකට එය සැබෑම යැයි සිතමු. අඩුම තරමින් කිරි පිටි බොන වේල් ගණන අඩු කළ නොහැකිද? මගේ යෝජනාව නම් ආනයනික භාණ්ඩ පරිභෝජනය වැඩි වන තරමට රට උගුලට හසුවීමේ වේගය වැඩි වන බවයි.**

අත්‍යවශ්‍ය භාණ්ඩ අරපරෙස්සමින් භාවිත කළ යුතුය. ගෑස් හා විදුලිය යනු එසේ අරපරෙස්සමින් භාවිත කළ යුතු ඉන්ධනය. එහෙත් අපට පෙට්‍රල් නැතිව ජීවත්වීමට හැකියාවක් ඇත. වෙනද පෙට්‍රල් ලීටර් 100ක් භාවිත කළ අයකුට අත්‍යවශ්‍ය ගමන් සඳහා පමණක් වාහනය භාවිත කර ලීටර් ගණන 25 දක්වා අඩු කළ හැකිය. විදුලිය වුව දල්වන විදුලි පහන් සංඛ්‍යාව අඩු කළ හැකිය. මේ අයුරින් අප රටක් හැටියට සිතා සකසුරුවම් ජීවන ශෛලියකට සක්‍රීය ලෙස මැදිහත් වන්නේ නම් පවතින අර්බුදයෙන් යම් දුරකට ගොඩ ආ හැකිය. නොඑසේව අර්බුදයට විසඳුම ආණ්ඩු හෝ පුද්ගල මාරුවක් ලෙස දකින්නේ නම් එයින් විසඳුමක් නැත.


**මේ අවස්ථාවේ ඇතැම් සාකච්ඡා දියත් වන බව පෙනෙන්නේ එවැනි පුද්ගලවාදී දෘෂ්ටිකෝණයෙන් බව පෙනේ. එය කනගාටුදායක තත්ත්වයකි. සැබැවින්ම කොවිඩ් අවුල යනු දේශපාලනික කාරණයක් නොවේ. ස්වාභාවික උපද්‍රව්‍යයකි. එය ප්‍රශ්නයක් හැටියට සලකා කළමනාකරණය කිරීම දේශපාලනික කාරණයකි.**

එහිදී වැදගත්ම කරුණ ලෙස මා දකින්නේ රටේ ජනතාව සමග ප්‍රශ්නය ගැන සාකච්ඡාවකට යෑමය. නිදසුනකට ගුරු ප්‍රශ්නයේ දී මතු වූ කරුණ වූයේ නිසි සාකච්ඡාවක් නොතිබුණේය යන්නයි. ගොවි ප්‍රශ්නයේදී ද එසේය. යුගදනවි බලාගාර ප්‍රශ්නය වුව එසේය. මහජනයාගේ ස්වභාවය නම් තොරතුරු මත කලබල වීමය. සාකච්ඡා විරහිත ක්‍රියාමාර්ග විසින් සිදුකරනු ලබන්නේ එකී මහජනයා කලබලයට පත්කිරීමය.

**ආණ්ඩුකරණයේ දී අත්‍යවශ්‍ය පියවරක් වන්නේ තොරතුරු සහිත සාකච්ඡාවෙන් සම්මන්ත්‍රණයෙන් මහජනයා දැනුවත් කරමින් වැඩ කිරීමය. කරන වැඩ නිරවුල්ව නිරවද්‍යභාවයෙන් කරද්දී මහජනයා කලබල වන්නේ නැත. එය ආණ්ඩුකරණයට ද පහසුවකි. නිදසුනකට ගිවිසුමක් රෑ දෙළහට අස්සන් කිරීම නොකොට දවල් දෙළහට අස්සන් කළ නොහැකි ද? අස්සන් ගැසීමට පෙර සතියක් දෙකක් ජනතාව සමග සාකච්ඡා කළ නොහැකි ද? රසායනික පොහොර වෙනුවට කාබනික කෘෂිකර්මයට විතැන්වීම ලංකාවේ සියලු ජීවීන්ගේ අයිතින් සුරක්ෂිත කරන මුළු ලෝකයක් පිළිගන්නා අගනා වැඩපිළිවෙළකි. එහෙත් එය කළ යුත්තේ මහජනයා සමග වූ සක්‍රීය සාකච්ඡාවකින් පසුය.**

එවැනි සාකච්ඡාවකට විශාල කාලයක් වැය වන්නේ ද නැත. ධනවාදී ලෝකයෙහි මිනිසකු පරයා තවත් මිනිසකු ලාභ උපරිම කරගැනීමට වෑයම් කරන්නේ යම් සේද එක රටක් සෙසු ලෝකය සමග ගැටෙන්නේ ද එපරිද්දෙන්මය. එවිට මේ කොවිඩ් සමයේදී ලංකාව වැනි පරිධියේ රටවලට සිදුවන්නේ ගෝලීය හා ජාතික යන තල දෙකේදීම ඉතාම පරීක්ෂාකාරී ලෙස ආර්ථික තීන්දු ගැනීමටය. එහිදී ප්‍රධාන සාධකයක් වන්නේ රටේ මහජනයාය. සැබැවින්ම දැන් මහජනයා සිටින්නේ විපිළිසරවය. දේශපාලනික වශයෙන් කලබෑගැනිවලට ඔවුන් පැටලෙන්නේ ද එහෙයිනි. එහෙත් මේ ආරාවුල විසඳගත හැක්කේ ඔවුන් සමග පරතරය වැඩිකර ගැනීමෙන් නොව සක්‍රීය සංවාදයක් මගින් නිසි තොරතුරු සන්නිවේදනයෙනි. යහපත් තීරණ විනිවිදභාවයෙන් යුක්තව සාකච්ඡාවෙන් සම්මුතියෙන් ක්‍රියාවට නැගීමෙනි.

සංවාද සටහන
බිඟුන් මේනක ගමගේ



### පෝය ලබන ගෙවෙන වේලාවන්

| දිනය | පෝය | පෝය ලබන වේලාව | පෝය ගෙවෙන වේලාව |
|---|---|---|---|
| නොවැ:11 | පුර අටවක | පෙ.ව.06.49 | 12 දා පෙ.ව.05.51 |
| නොවැ:18 | පසළොස්වක | ප.ව.12.00 | 19 දා පෙ.ව.14.27 |
| නොවැ:27 | අව අටවක | පෙ.ව.5.43 | 28 දා පෙ.ව.06.00 |
| දෙසැ:03 | අමාවක | ප.ව.16.55 | 04 දා ප.ව.13.12 |

# මාර්ග 1500ක් විවෘත කිරීමේ උළෙල:

## මේ රටේ නියත වශයෙන්ම විප්ලවීය වෙනසක් ඇති කරනවා

## ජනපති ගෝඨාභය රාජපක්ෂ

## අපි හැමදාකම දුන්නේ ඉටුකරන්න පුළුවන් පොරොන්දු විතරයි

## අගමැති මහින්ද රාජපක්ෂ





(ඩයනා උදයංගනී)

**හැට නව ලක්ෂයක් ජනතාව ඡන්දය දුන්නේ තම මුහුණට නොව 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ඉදිරිපත් කළ ප්‍රතිපත්තිවලට බවත්, එහි සඳහන් විප්ලවීය වෙනස නියත වශයෙන්ම ඇති කරන බවත් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පෙරේදා (6 වැනිදා) පැවැසීය.**

ජනතාව ඉල්ලා සිටි එම විප්ලවීය වෙනස සිදු කිරීමේදී අපහසුතා සහ බාධකවලට මුහුණ දීමට සිදු වුවත්, එම අභියෝගය ජය ගැනීමට කැපවීමෙන් ක්‍රියා කරන බව ද ජනාධිපතිවරයා සඳහන් කළේය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා මේ බව පැවැසුවේ, වැඩ නිම කළ මාර්ග 1,500ක් එකම දිනකදී ජනතා අයිතියට පත්කිරීම වෙනුවෙන් වීරකැටිය, මණ්ඩාඩුව මහජන ක්‍රීඩාංගණයේ පෙරේද (6 වැනිද) පස්වරුවේ පැවැති උත්සවය අමතමිනි.

තමා දුන් පොරොන්දු එලෙසින්ම ඉටු කිරීමට කොවිඩ් වසංගතය හමුවේ නොහැකි වුවත්, එහි කිසිදු අඩුවක් නොතබා ජනතාව තමා කෙරෙහි තැබූ විශ්වාසය ආරක්ෂා කරන බව ද ජනාධිපතිවරයා මෙහිදී පැවැසීය.

**ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා මෙසේ ද පැවැසීය.**

"මීට වසරකට පෙර මම 'පාරවල් ලක්ෂයේ' වැඩසටහනට මුල් ගල තිබ්බා. වසරක් අවසානයේදී අපි පාරවල් 1,500ක වැඩ නිම කළා. අපි මේ කාලය තුළ කටයුතු කළේ විශාල බාධා මැද්දෙයි. කිහිප අවස්ථාවක් රට සම්පූර්ණයෙන්ම වහලා තිබ්බා. කොවිඩ් ප්‍රශ්න නිසා කොන්ත්‍රාත්කරුවන්ට වැඩ කරන අය ගෙන්න ගන්න කොච්චර අපහසු වුණා ද කියලා අපි දන්නවා. ඒ බාධක මැද්දේ පාරවල් 1,500ක වැඩ අවසන් කිරීම පිළිබඳ මම ඇමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද මා විවේචනය කරන කොටස් දෙකක් ඉන්නවා. එක පිරිසක් තමයි, මේ පසුගිය වසර දෙක ගැන අවබෝධයක් නැති කොටස. ඔවුන් හිතන්නේ මේ පසුගිය වසර දෙක සාමාන්‍ය තත්ත්වයේ වසර දෙකක් කියලා. මුළු ලෝකයේම නායකයන් මුහුණ දුන් විශාල අභියෝගයක් වූ කොවිඩ් වසංගතය පැතිරුණ අවුරුදු දෙකකට අපි මුහුණ දුන්නා.

අනෙක් කොටස තමයි මගෙන් විප්ලවීය වෙනසක් ඉල්ලපු කොටස. හැබැයි ඉතින් මේ වෙනස කරන්න ගියාම ගොඩක් අයට රිදෙනවා. මෙන්න මේ රිදෙන කොටස තමයි විවේචන කරන්නේ. මම ජනාධිපති ධුරයට පත්වුණේ 2019 නොවැම්බර් 19 වැනිද. දෙසැම්බර් මාසය වෙනකොට චීනයේ වූහාන් නගරයෙන් මේ කොවිඩ් වසංගතය පැතිරුණා. එද ලෝකයේ කිසිම කෙනෙක් මොකක් ද මේ වසංගතය, මේකට මුහුණ දෙන්නේ කොහොම ද එන්නතක් තියෙනවා ද කියා දැන හිටියේ නැහැ.

එවැනි තත්ත්වයක් යටතේ තමයි වූහාන් නගරයේ ඉගෙන ගත්ත ළමයි 34 දෙනෙක් ලංකාවට රැගෙන එන්න සිද්ධ වුණේ. අපි විශේෂ ගුවන් යානයක් යවලා ඉතා සෞඛ්‍යාරක්ෂිතව මත්තලට ගෙනල්ලා, එතැනින් විශේෂ ආරක්ෂාව යටතේ දියතලාව හමුදා කඳවුරට අරගෙන ගිහින් වෙනමම ස්ථානයක් හදලා ඔවුන් නිරෝධායනය කළා. එද ඉඳලා අපි නිරෝධායනය ආරම්භ කළා. මැද පෙරදිග සේවය කළ එක්ලක්ෂ පනස්දහසකට අධික සංඛ්‍යාවක් ලංකාවට ගෙනල්ලා නිරෝධායනය කළා.

අපට මේ රට දස වතාවකට වැඩිය වහන්න සිද්ධ වුණා. ඔබට මතක නම් පසුගිය වසරේ එක දිගට මාස දෙක හමාරක් රට වහලා තිබ්බා. මෙවැනි තත්ත්වයක් යටතේ අපට ආර්ථික වර්ධනයක් කරන්න පුළුවන් ද? මේ තත්ත්වය ගැන බොහෝ දෙනකුට අවබෝධයක් නැහැ. එහෙම නැති නම් අවබෝධයක් ඇති වෙන්න ඉඩ දෙන්නේ නැහැ. පහුගිය අවුරුදු දෙක රට පාලනය කළේ එවැනි වාතාවරණයක් මැද්දේ. කොහෙ හරි කොවිඩ් රෝගියකු හම්බ වුණොත් වෛද්‍යවරුන්, විශේෂඥයන් වහාම රට වහන්න, නැති නම් මේක විනාශයක් වෙයි කිව්වා. රට ඇරලා තියෙනකොට රට වහන්න කියන විපක්ෂය රට වහනකොට රට අරින්න කියා කෑ ගහනවා.

ඩොලර් බිලියන 5ක විදේශ විනිමයක් ගෙනාපු සංචාරක අංශය කොවිඩ් වසංගතය නිසා සම්පූර්ණයෙන්ම බිංදුව දක්වා වැටුණා. කුඩා ආර්ථිකයක් තිබෙන අප වැනි රටක ඩොලර් බිලියන 5ක් නැති වුණාම ආර්ථිකයට කොපමණ බලපෑමක් ඇති වෙනවා ද කියලා ඔබ දන්නවා. එමෙන්ම විශාල පිරිසක් සංචාරක කර්මාන්තයෙන් යැපුණා. ඉහළම පන්නයේ හෝටල්වල ඉඳලා තැඹිලි විකුණන පුද්ගලයා දක්වා මිලියන 3කට වැඩි ජනතාවක් යැපුණා. ඒ අයගේ ආදායම සම්පූර්ණයෙන්ම කඩා වැටුණා.

මුල් කාලයේ දී ඇඟලුම් කර්මාන්තය වසා දැමූ නිසා අපේ අපනයන ආදායම නැති වෙලා ගියා. දැන් අපි ඒක නැවත හදාගෙන තිබෙනවා. ඒ වගේම ලක්ෂ දෙකකට ආසන්න මැද පෙරදිග සේවය කළ අයගේ රැකියා නැති වෙලා. ඒ රටවල ආර්ථිකය කඩා වැටුණු නිසා අපි ඒ අය ලංකාවට ගෙනාවා. ඒ අයගෙන් මෙරටට ආපු මුදල් නැති වුණා. මෙවන් ආර්ථික පසුබිමක් තුළ පෙර ආණ්ඩු විසින් ගත් ණය අවුරුද්දකට ඩොලර් බිලියන 4ක් අපට ගෙවන්න සිදු වුණා. අපි මේ අවුරුදු දෙක තුළත් ඒ ණය ගෙව්වා. ඊට අමතරව ස්වෛරී බැඳුම්කර පොලිය ඩොලර් බිලියන 1.5ක් ගෙවන්න ඕනෑ. ඒවත් ගෙව්වා. අපට පහුගිය ආණ්ඩුව බාර දුන්නේ ඉතාම සුළු සංචිතයක්.

මේ කොවිඩ් වසංගතය නිසා අපට නැති වුණ විදේශ විනිමය, අපට ගෙවන්න තිබෙන ණය බැලුවාම කුඩා ආර්ථිකයක් කොච්චර අමාරුවෙන් ද ඉදිරියට ගෙනියන්නේ කියන එක ජනතාව තේරුම් ගන්න ඕනෑ. එහෙම වුණත් අපි රාජ්‍ය සේවකයාට නිවාඩු දීලා ගෙදර තිබ්බා. දුරස්ථව රාජකාරි කළා. ඒ අයගේ පඩි කැපුවේ නැහැ. සියලු දෙනාගේ පඩි ගෙව්වා. ගුරුවරුන් අවුරුදු දෙකක් ගෙදර හිටියා. අපි ඔවුන්ගේත් පඩි ගෙව්වා. කොවිඩ් හැදෙන හැම පවුලකටම මුදල් ලබා දුන්නා. මේ වගේ අසීරු තත්ත්වයක් යටතේ වුණත් අපි ජනතාව ජීවත් කරවන්න ඕනෑ කියන එක තේරුම් ගත්තා.

අද ගොවි මහත්තුරු කියලා පිරිසක් උද්ඝෝෂණ කරනවා. ඒත් ගොවියා බලාගත්තේ මොන ආණ්ඩුව ද කියලා තේරුම් ගන්න ඕනෑ. මම බලයට එනකොට වී රුපියල් 25ට විකුණ ගන්න බැරුව හිටියේ. මම ප්‍රවෘත්තිවල දැක්කා එක ගොවි මහත්තයෙක් අපට අඩු ගානේ රුපියල් 40ක් දෙන්න කියනවා. අපි ඊට වඩා දුන්නා. එද පොහොරවලටත් මුදල් ගෙව්වා. මම ඇවිල්ලා ඒ පොහොර නිකම් දුන්නා. එද රුපියල් 25ට විකුණ ගන්න බැරි වීවලට රුපියල් 50ක සහතික මිලක් දුන්නා. ඒ සහතික මිල 50ට දුන්නත්, අද 60, 70, 80ටත් විකුණනවා. කමක් නැහැ. ඒක යන්නේ ගොවියාට. දැන් අපි අවුරුදු දෙකක් රසායනික පොහොර නිකම් දුන්නා.

හැට නව ලක්ෂයක් ජනතාව මට ඡන්දය දුන්නේ මගේ මුහුණට නොවේ. 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් මම ඉදිරිපත් කළ ප්‍රතිපත්තිවලට. ඒ ප්‍රතිපත්තිවල පැහැදිලිව අපි හරිත කෘෂිකර්මාන්තයකට යන බව ප්‍රකාශ කළා. මේ රටේ කාබනික පොහොර නිෂ්පාදනය කරන බව අපි පැහැදිලිව කිව්වා. වස විසෙන් තොර ආහාර හදන බව කිව්වා. විශේෂඥයන් රූපවාහිනියට ඇවිල්ලා ආහාර සුරක්ෂිතතාව ගැන කතා කරනවා මම දැක්කා. ආහාර සුරක්ෂිතතාව කියන්නේ වස විස ආහාර දෙන එක නෙවේ. වස විසෙන් තොර ආහාර වේලක් ජනතාවට ලබා දෙන එකයි. අපි පොරොන්දු වුණේ ඉතා අසීරු කාර්යයක්.

ඔබ වෙනසක් ඉල්ලුවා, විප්ලවීය වෙනසක් ඉල්ලුවේ. ඒ වෙනස පුරුදු ක්‍රමයෙන් බැහැරව කරන්න අමාරුයි. මට ගොවි ජනතාවට කිසිම අපහසුතාවක් ඇති කරන්න, ගොවි ජනතාවට බලෙන් කාබනික පොහොරවලට යන්න කියන්න අවශ්‍ය නැහැ. ඒත් මම කළේ හරි දේ වගේම පොරොන්දු වුණ දේ.



ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහත්වරු ඇතුළු ආරාධිතයන් උත්සවයට සහභාගි වී සිටි අයුරු. අමාත්‍යවරුන් වන ජොන්ස්ටන් ප්‍රනාන්දු, චමල් රාජපක්ෂ, නාමල් රාජපක්ෂ යන මහත්වරු ද මෙහි වෙති.

## හමුදාවේ කෙනෙක් වගේ තදින් වැඩකරන්න පුළුවන්: ඒත් එහෙම කරන්නේ නෑ

අපි බලාපොරොත්තු වුණේ මිලිටරි ක්‍රමය ගෙනියන ගෝඨාභය කෙනෙක් කියලා සමහර අය කියනවා. ගොවියාට කාබනික පොහොර භාවිත කරන්න කියලා බෙල්ලෙන් අල්ලලා හමුදාවේ විදිහට කියන්න මට පුළුවන්. ඒත් මට එහෙම කරන්න අවශ්‍යතාවක් නැහැ. ඒක ද බලාපොරොත්තු වුණේ. මම ආවොත් ප්‍රජාතන්ත්‍රවාදය නැති වෙයි කියලා සමහර අය කිව්වා. ඒ අයම අද කියනවා අයියෝ අපි බලාපොරොත්තු වුණේ ඔහොම එක්කෙනෙක් නෙවේ, හමුදාවේ වගේ එක්කෙනෙක් කියලා. ඕනෑ නම් මට පුළුවන් එහෙම කරන්න. ඒත් මේක ප්‍රජාතන්ත්‍රවාදී රටක්. බොරු චෝදනා නිසා අදත් අපි මානව හිමිකම් උල්ලංඝනය කළා කියලා රටක් හැටියට ජිනීවාවලට යනවා. අපි අපේ රටට එහෙම කරන්න ඕනෑ නැහැ. ඒත් මම පොරොන්දු වූ ඒ විප්ලවීය වෙනස මම කරනවා. පුනර්ජනනීය බලශක්තිය ගැන අපි කතා කළා. අපට තෙල්, ගල් අඟුරු, ගෑස් නැහැ. ඒත් අපට හිරු එළිය, ජලය, සුළඟ තියෙනවා. මේ තුනෙන්ම විදුලිය ජනනය කරන්න පුළුවන්. ඒකත් අපි සෞභාග්‍යයේ දැක්මේ කියා තියෙනවා. ඒක කරන්න ගියාමත් විශාල විරෝධයක් ගෙනියනවා.

## නෑයොයි හිතමිත්‍රයොයි අරන් සමුළුවට ගියේ නෑ: ගියේ ඔක්කොම 6යි

අපි රටක් හැටියට කරන්න පොරොන්දු වුණේ අසීරු දේවල්. එද යහපාලනය යටතේ ජනාධිපතිතුමා, අගමැතිතුමා යනකොට විශාල කාර් ප්‍රමාණයක් යනවා. පාරවල් වහනවා, ගිලන් රථ යනවා, ගිනි නිවන රථ යනවා අපි දැක්කා. මම ඒවා නැති කළා. දැන් මම යනකොට යන්නේ ආරක්ෂක රථ දෙකයි. මම එක්සත් ජාතීන්ගේ සමුළුවට ගිහිල්ලා හිටියේ, සාමාන්‍ය හෝටලයක. මගේ භාර්යාව මාත් එක්ක ගියා. එයාගේ ටිකට් එකට මම සල්ලි ගෙව්වා. මගෙත් එක්ක හත් දෙනයි ගියේ. එතැන වැඩ කරන අය ඉස්සෙල්ලා ජනාධිපතිතුමා නම් මෙන්න මෙහෙම ගෙනාවා, අර හොඳ හෝටලයේ හිටියේ, ඇයි ඔබතුමා මෙතැන ඉන්නේ කිව්වා. මාධ්‍යයෙන් ඇවිත් ඇයි ඔබතුමා කට්ටිය ගෙන්නුවේ නැත්තේ කියා ඇහුවා. මම එහෙම කළේ නැහැ. ඒක තමයි වෙනසක් කරන්න ඕනෑ.

මාත් එක්ක මගේ ඥාතීනුත් ගියා නම් ඒ අයත් සංතෝෂයි. ඒ අය අරගෙන ගියේ නැති වුණාම කියන්නේ අපේ මාමා ජනාධිපති වුණාට වැඩක් නැහැ, අපට යන්නවත් නැහැ කියලා. ඒකයි වෙනස. මම ඇමැතිතුමන්ලාට කිව්වා සම්බන්ධීකරණ නිලධාරියකු විදිහටවත් ඥාතීන්ව දාගන්න එපා කියලා. එතකොට ඇමැතිතුමාගෙන් අහනවා අපි වැඩ කරලා සම්බන්ධීකරණ නිලධාරි තනතුරක්වත් නැහැ කියලා. ඒක තමයි වෙනස. මටත් රජ ගෙදරක් තියෙනවා. ඒක බොහොම විශාලයි, ඒකෙ ඉන්න අමාරුයි. අපරාදේ ලයිට් බිල් යනවා. මම ඉන්නේ මම හිටපු ගෙදරමයි. ඇත්තටම සමහර අය ඇවිල්ලා මේකෙ ද ඉන්නේ අහනවා. යන්නකො අර රජ ගෙදරක් තියෙන්නේ කියනවා.

## හාමුදුරුවන්ට වගකීම් දුන්නාම විවේචනය කරනවා

ඒකයි වෙනස.

මම අභයාරාමයේ මුරුත්තෙට්ටුවේ ආනන්ද හාමුදුරුවන්ට කොළඹ විශ්වවිද්‍යාලයේ කුලපතිකම ලබා දුන්නා. උන්වහන්සේ මේ රජය පත්කරන්න වැඩ කළා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ ඉඳලා උන්වහන්සේ වැඩ කළා. ඒක ඇත්ත. හැබැයි පසුගිය කාලයේ යම් යම් හේතු නිසා උන්වහන්සේ අපට විරුද්ධව කතා කළත් විජයදාස රාජපක්ෂ, සජිත් ප්‍රේමදාස, රනිල් වික්‍රමසිංහ මහත්වරුන් උන්වහන්සේගෙන් උපදෙස් ගන්න ගියා. ස්ටාලින්, මහින්ද ජයසිංහ කියන පුද්ගලයන් ගියා. ඔය ඔක්කොම උපදෙස් ගන්න ගියේ උන්වහන්සේ ගාවට. හැබැයි උන්වහන්සේ කුලපති කළාම ඒකට සුදුසු නැහැ කියනවා.

දවසක් මම රුවන්වැලි සෑය වඳින්න යනකොට ස්වාමීන්වහන්සේ නමක් 'කෝ ජනාධිපතිතුමා අර එක රටක් - එක නීතියක්' කියා කිව්වා. මම කිව්වා 'හරි ඒක අපි ලබා දෙන්නම් හාමුදුරුවනේ' කියලා. අවුරුදු දෙකක් ගියා. මම කැබිනට් එකෙත් කිව්වා, අපි මේක කරන්න ඕනෑ කියලා. මේක සංකල්පයක්. හැබැයි ඒකට ඥානසාර හාමුදුරුවන් පත් කළා කියලා අද විවේචනය කරනවා, අවුරුදු 5ක් තිස්සේ 'එක රටක් - එක නීතියක්' සංකල්පය ගැන කතා කළේ උන්වහන්සේයි. මම උන්වහන්සේට කතා කරලා, 'දැන් ඔබවහන්සේ මේක ගැන අවුරුදු 5ක් කතා කළානේ. ඔබවහන්සේ මට මේ සංකල්පය හදලා දෙන්න' කිව්වා. මේක හදලා දුන්නාම අඩු පාඩු තියෙනවා නම් හදලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඒක අධිකරණ ඇමැතිතුමාට දෙනවා. ඒකයි මට අවශ්‍ය. ඒකටත් දෝෂාරෝපණය කරනවා.

මම ආපු ගමන්ම මුං ඇට, කවුපි, උඳු වගේ බෝග 16 ක් පිටරටින් ගේන එක නතර කළා. අද මුං ඇටවලට ගොවියාට කීයක් හම්බ වෙනවා ද රුපියල් 450ක්. ගම්මිරිස්වලට කීයක් හම්බ වෙනවා ද? කුරුඳුවලට දෙගුණයකටත් වඩා හම්බ වෙනවා කිලෝ එකකට 2,800-3,200 අතර. මම කහ ගේන එක සම්පූර්ණයෙන් නතර කළා. දැන් අපි කහවලින් ස්වයංපෝෂිතයි. කහ, ඉඟුරුවලට කීයක් හම්බ වෙනවා ද? ගොවියාට වැඩි මුදලක් එනකොට පාරිභෝගිකයාට ගැටලුවක් එනවා. ඒත් ගොවියාගේ ආදායම අඩු කරන්න බැහැ. අපේ යුතුකම ගොවියා බලාගන්න එක. ඒකයි අපි කරලා තියෙන්නේ. අපි පාරිභෝගිකයාට ඒ වෙනුවෙන් සහන දෙනවා. ඒකයි ක්‍රමවේදය.

'සෞභාග්‍යයේ දැක්මේ' ඉදිරිපත් කර තිබෙන ඒ විප්ලවීය වෙනස අපි කරනවා. මම බලයට පත් වුණ වෙලාවේ තරුණයන් ඉදිරියට ඇවිල්ලා තාප්පවල චිත්‍ර ඇන්ද. පුරන් කුඹුරු වගා කළා. මම ඔවුන්ට ආරාධනා කරනවා මේ රජය විශ්වාස කරලා නැවතත් ඉදිරියට ඇවිත් කුඹුරු ගොවිතැන් කරන්න. බය වෙන්න එපා, මේක විශාල වෙනසක්. අපට පුළුවන් නම් මේ වෙනස කරන්න අප රටේ ව්‍යවසායකයන් වැඩි කරන්න, පර්යේෂණ කරන්න පුළුවන්. ඒක කරන්න පුළුවන් නම් මේක කරපු පළමුවැනි රට අපේ රට කියා අපට කියන්න පුළුවන්. එවිට අපට වැඩියෙන් සංචාරකයන් ගෙන්න ගන්න පුළුවන්. අපේ ආහාර පිටරට යවලා, හොඳ විදේශ විනිමයක් ගන්න පුළුවන්. මේක අභියෝගයක්. මේක පර්යේෂණයක්. මම සියලු ගොවි මහත්තුරුන්ගෙන් ඉල්ලා සිටිනවා, අපි වගා කරමු. ඒ ඉල්ලපු විප්ලවීය වෙනස අනිවාර්යයෙන්ම සිදු කරනවා කියන බලාපොරොත්තුව දෙමින් මගේ කතාව අවසන් කරනවා."

**අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා එහිදී මෙසේ පැවැසීය.**

"2024 වෙද්දී මාර්ග කිලෝමීටර ලක්ෂයක් සංවර්ධනය කර ජනතාවට භාරදෙන්න අපි සැලසුම් කර තිබෙනවා. දැනටමත් කිලෝමීටර 65,000ක මැණුම් කටයුතු අවසන් කර ඇති බව ඇමැතිතුමා කිව්වා. ඉතිරි කොටසත් ඉක්මනින් අවසන් කරනවා. මේ අවුරුද්දට විතරක් අපි කිලෝමීටර 25,000ක් සංවර්ධනය කර තිබෙනවා. අද ජනතාවට පැවැරෙන්නේ ඉන් කොටසක් විතරයි. මේවා ආරම්භ කළේ කොවිඩ් වසංගතය දරුණුවට තිබූ කාලේ. අපි එද මේ ව්‍යාපෘතිවල වැඩ නැවැත්තුවා නම් අද අපිට මේ පාරවල් ජනතා අයිතියට පත්කරන්න ලැබෙන්නේ නැහැ.

මෙහිදී අපි ප්‍රමුඛත්වය දුන්නේ ග්‍රාමීය හා වතු මාර්ග සංවර්ධනය කරන්නයි. ඒ වෙනුවෙන් අපි රාජ්‍ය අමාත්‍යාංශයකුත් පිහිටෙව්වා. ගමේ ඉන්න නිෂ්පාදකයන්ට තමන්ගේ නිෂ්පාදන වෙළෙඳපොළට ගේන්න, නිෂ්පාදන මිලදී ගන්න අයට ගමට එන්න මාර්ග පහසුකම් තිබිය යුතුයි. නැත්නම් ඒ නිෂ්පාදනවලට සාධාරණ මිලක් ගන්න බැරි වෙනවා. වීරකැටිය, මැදමුලන ග්‍රාමීය පළාත්වල ක්‍රමානුකූල දියුණුවක් ඇති වෙන්නේ මේ පාරවල් නිසා. ලෙඩක් දුකක් හැදුණාම ළඟම රෝහලට යන්න වුණත් පාරක් හොඳට තිබිය යුතුයි. ඉස්සර අපට වීරකැටියේ ඉඳන් කොළඹ යන්න පැය අටකට වැඩිය ගියා. අද පැය දෙකකින්, තුනකින් යන්න පුළුවන්. ගම නැගුණොත් තමයි රට නැගෙන්නේ. ගෝඨාභය රාජපක්ෂ මහතාගේ න්‍යාය ඒකයි. ඒ නිසා මාර්ග සංවර්ධනයට සමගාමීව ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය නගාසිටුවන වැඩපිළිවෙළක් සම්බන්ධයෙනුත් රජයේ අවධානය යොමු කර තිබෙනවා.

ගමේ පාරවල්, පාලම්, බෝක්කු හදනවා කියන එක ඡන්ද කාලෙදි බොහෝ ජනප්‍රිය පොරොන්දුවක්. ඒක අපි එද සිට අහලා තියෙනවා. ඒකට හේතුව ගමේ ජනතාව හැමදාම ඉල්ලන්නේ ගමට පාරක් හදා දෙන්න කියලයි. අපි දුන්න පොරොන්දු මතකයේ තියාගෙන ඉන්න ආණ්ඩුවක් බව ජනතාව දන්නවා. අපි හැමවිටම දුන්නේ කරන්න පුළුවන් පොරොන්දු විතරයි. අපි පාරවල් හැදීම ඡන්ද පොරොන්දුවකට සීමා කළේ නැහැ. අපට ඡන්දය දුන්, නොදුන් කියා වෙනසක් නැතිව පාරවල් හදන්නේ හැමෝටම යන්නයි. නිදහසින් පසු මේ රටේ මහාමාර්ග පද්ධතියේ පෙරළියක් වුණා නම් ඒ අපේ කාලයේදී බව ආඩම්බරයෙන් කිව හැකියි.

කොවිඩ් වසංගතය සමඟ විවිධ දුෂ්කරතා ආවත් අපි ඒ සෑම අභියෝගයක්ම භාරගත්තා. ඉදිරියේදීත් එන ඕනෑම අභියෝගයකට මුහුණ දෙන්න අපි සූදනම්."

**මහාමාර්ග අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා මෙසේ සඳහන් කළේය.**

"ඉතිහාසයේ තිබුණු සමහර ආණ්ඩුවල ප්‍රධානීන් ජනතාවට පටි තද කරගන්න කිව්වා. මහින්ද රාජපක්ෂ මහතා යුද්ධයක් කරන ගමන් රටේ සංවර්ධන කටයුතු ඉදිරියට ගෙන ගියා. රටේ ආර්ථිකය ශක්තිමත් කළා. 2015දී මේ රට බාර දෙද්දී අපේ රටේ ආර්ථික වර්ධන වේගය දෙවැනි වුණේ චීනයට විතරයි. ඒත් ගෝඨාභය රාජපක්ෂ මහතාට ලැබුණේ ආර්ථිකය බිංදුවට වැටුණු රටක්.ගෝඨාභය රාජපක්ෂ ෆේල් කියලා විපක්ෂය සමාජය තුළ බොරු මතයක් ගොඩනගනවා. ඒත් අපි අද එන්නත්කරණය සාර්ථකව සිදු කළ පළමු රටවල් 10 අතර සිටිනවා. කොවිඩ් වසංගතයට සාර්ථකව මුහුණ දී මේ රටේ ජනතාව බේරගත් නායකයා ලෙස ඔබතුමා ඉතිහාසගත වෙනවා. ඔබතුමා කූල් නායකයකු කියා මම කලින් දවසකත් කිව්වා. ඒ ඔබතුමා ඉතාමත් සංවේදී වගේම පරිස්සමින් වැඩකටයුතු කරන නායකයෙක් නිසයි. මැතිවරණ වේදිකාවල දුන් පොරොන්දු නොපිරිහෙලා ඉටුකරන නායකයකු ලෙසට ඔබතුමා ජනතාව අතර නමක් දිනා සිටිනවා. තවත් මාර්ග 2,500ක් අපි නුදුරේදීම විවෘත කරනවා."

ලෝක බැංකු දකුණු ආසියානු කලාපයේ උප සභාපති ආචාර්ය හාට්විග් ශේ, ආසියානු සංවර්ධන බැංකුවේ ශ්‍රී ලංකා නේවාසික නියෝජිත ආචාර්ය චෙන් චෙන් යන මහත්වරුන් ද එහිදී අදහස් දැක්වූ අතර, මැති ඇමැතිවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු පිරිසක් එම අවස්ථාවට එක්ව සිටියහ.



# චිත්‍ර ශිල්පී ඇන්ටන් කලුරිය කරයි



හැත්තෑව දශකයේ මුල් කාලයේ සිටම ජනප්‍රිය චිත්‍ර කතා ශිල්පියකු වූ වත්තල ආර්. ඇන්ටන් මහතා අභාවප්‍රාප්ත විය.

ලංකාවේ චිත්‍ර කතා පත්තර නිකුත් වෙන්නට පෙර යුගයේ, ඔහුගේ නිර්මාණ චිත්‍ර කතා පොත් වශයෙන් මහජනතාව අතර ඉතාම ජනප්‍රියත්වයට පත් වූ අතර එම යුගයේ දී ඔහු පුවත්පත් කාටූන් ශිල්පියකු වශයෙන් නමක් දිනාගෙන සිටියේය.

දරුවන් වෙනුවෙන්ම ප්‍රකාශයට පත් කළ කතාන්දර පොත් රැසකට සිතුවමෙන් විශාල දයකත්වයක් දුන් ඇන්ටන්, සිය ක්ෂේත්‍රයේ ප්‍රසාදයට ලක්ව සිටි චිත්‍ර ශිල්පියෙකි.

අවසන් කටයුතු ඊයේ (7) සිදුකෙරිණි.

# තද වැස්සට - සැඩ සුළඟට 5ක් බිලි: දෙදෙනෙක් අතුරුදන්

## දිසා 12ක 4391කට පීඩා

**(ඩයනා උදයංගනී)**

**දින ගණනාවක් තිස්සේ පැවැති තද වැසි සමඟ ඇති වූ ගංවතුර, අකුණු සහ සුළං සහිත කාලගුණය හේතුවෙන් දිවයිනේ දිස්ත්‍රික්ක 12ක පවුල් 1,143කට අයත් 4,391 දෙනකු පීඩාවට පත්ව ඇතැයි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පවසයි.**

මෙම අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් මරණ පහක් වාර්තා වී ඇති අතර, තවත් දෙදෙනකු අතුරුදන්ව ඇතැයි එම මධ්‍යස්ථානය සඳහන් කරයි.

පීඩාවට පත් පවුල් 63කට අයත් 251 දෙනකු ආරක්ෂිත ස්ථාන 2ක රඳවා ඇතැයි එම මධ්‍යස්ථානයේ සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය) ප්‍රදීප් කොඩිප්පිලි මහතා පැවසීය.

රත්නපුර, කෑගල්ල, මහනුවර, නුවරඑළිය, මාතලේ, මුලතිව්, යාපනය, මන්නාරම, බදුල්ල, පුත්තලම, ගාල්ල සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවලට එම ආපද තත්ත්වයෙන් බලපෑම් එල්ල වී ඇතැයි ද කොඩිප්පිලි මහතා සඳහන් කළේය.

මින් වැඩිම බලපෑමක් එල්ල වී ඇත්තේ, බදුල්ල දිස්ත්‍රික්කයට වන අතර, එම දිස්ත්‍රික්කයේ පවුල් 687කට අයත් 2,680 දෙනකු පීඩාවට පත්ව සිටිති.

එම දිස්ත්‍රික්කවල නිවාස 12ක් සම්පූර්ණයෙන් විනාශ වී ඇති අතර, තවත් නිවාස 635කට අර්ධ හානි සිදුව තිබේ.

මේ අතර, පවතින අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් දිවයිනේ දිස්ත්‍රික්ක අටකට පනවා ඇති නායයෑම් අනතුරු ඇඟවීමේ නිවේදනය තවදුරටත් දීර්ඝ කර තිබේ.

බදුල්ල, ගාල්ල, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ සහ රත්නපුර දිස්ත්‍රික්කයන්හි මෙම අවදනම් තත්ත්වය පවතින බව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සඳහන් කරයි.

පවතින වැසි සහිත කාලගුණික තත්ත්වය හේතුවෙන් දැදුරු ඔය, රාජාංගනය, වෙහෙරගල, මහවිලච්චිය, යෝධ වැව, නාලන්ද, තබ්බෝව, ලක්ෂපාන සහ ඉහළ කොත්මලේ යන ජලාශවල වාන් දොරටු විවෘත කර ඇතැයි ආපද කළමනාකරණ මධ්‍යස්ථානය පවසයි.

නෝටන්බ්‍රිජ් විමලසුරේන්ද්‍ර ජලාශය ද වාන් දැමීම ආරම්භ කර ඇති බව වාර්තා වේ.

මේ අතර, මාර්ග ජලයෙන් යට වීම, මාර්ගවලට ගස් හා පස් කඳු කඩා වැටීම ආදිය නිසා ඇතැම් ප්‍රදේශවල ගමනාගමන කටයුතුවලට ද බාධා එල්ල වී තිබිණි.

පීඩාවට පත්වූවන්ට සහන සැලසීමේ කටයුතු දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සහාය ඇතිව සිදු කරන බව ද ඔහු සඳහන් කළේය.

කිසියම් හදිසි ආපද තත්ත්වයක් මතු වුවහොත් ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේ 117 ක්ෂණික ඇමතුම් අංකයෙන් ඒ බව දැනුම් දිය හැකි බව ද කොඩිප්පිලි මහතා කීවේය.

### මහ ගංගා 9කින් ගංවතුර අවදානමක්

**(ඩයනා උදයංගනී)**

පවතින වැසි සහිත කාලගුණ තත්වය අනුව දිවයිනේ ප්‍රධාන ගංගා නවයක් ආශ්‍රිතව ඉදිරි දිනවලදී ගංවතුර අවදනමක් ඇතිවිය හැකි බව වාරිමාර්ග දෙපාර්තමේන්තුව පවසයි.

කැලණි, කළු, නිල්වලා, ගිං සහ බෙන්තර යන ගංගා ද්‍රෝණි සහ දැදුරු ඔය, මහ ඔය, අත්තනගලු ඔය සහ කලා ඔය ආශ්‍රිතව ගංවතුර තත්ත්වයක් ඇතිවිය හැකි බව වාරිමාර්ග දෙපාර්තමේන්තුව නිකුත් කර ඇති පූර්ව ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදනයේ දැක්වේ.

මේ වනවිට පවතින වැසි තත්වය, ඉදිරි දිනවල දී ඇතිවිය හැකි වර්ෂාපතනයන් සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කර ඇති අනතුරු ඇඟවීම් සහ දිවයිනේ ජලාශවල දැනට පවතින ජල ධාරිතාව අනුව මෙම අනතුරු ඇඟවීම කර ඇතැයි වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල විද්‍යා හා ආපද කළමනාකරණ) ඉංජිනේරු එස්.පී.සී. සුගීෂ්වර මහතා පැවසීය.

වැසි තත්වය අඛණ්ඩව පැවතියහොත් මෙම ගංගා ආශ්‍රිතව අද (8), හෙට (9), අනිද්ද (10) යන දිනවල සැලකිය යුතු ගංවතුර තත්ත්වයක් ඇතිවිය හැකි බව ඔහු සඳහන් කළේය.

# මහාචාර්ය මෙත්තිකාට ලෝක විද්‍යා ඇකඩමි සම්මානයත්



**(සුජිත් හේවාජුලිගේ සහ කඹුරුපිටිය ප්‍රීති ජයවර්ධන)**

ලෝකයේ හොඳම පර්යේෂකයන් 100 දෙනා අතරට තේරුණු ලංකාවේ 24 දෙනා අතර පළමු තැන සිටින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය මෙත්තිකා විතානගේ මහත්මිය ලෝක විද්‍යා ඇකඩමිය පිරිනමන ෆයාස් අල් කරාෆි සම්මානය ද (2020) හිමි කරගෙන ඇත.

කසළ ජෛවස්කන්ධ ජෛව අඟුරු බවට පරිවර්තනය කිරීම සහ එය පරිසර දූෂණය අවම කර ගැනීම සඳහා යොදා ගැනීමේ වැඩපිළිවෙළට අදළ පර්යේෂණය වෙනුවෙන් ඇයට මෙම සම්මානය හිමි වී තිබේ.

මෙම සම්මානය සෑම වර්ෂයකදීම පිරිනමනු ලබන්නේ ලෝකයෙන්ම එක් විද්‍යාඥවරියකට පමණි. විද්‍යා සහ තාක්ෂණය සඳහා අඩු පහසුකම් සහිත රටවල සිටින කාන්තා පර්යේෂිකාවන් අතුරින් අයෙක් මේ සම්මානය සඳහා තෝරා ගැනෙති.

නාමයෝජනා ඉදිරිපත් කිරීමෙන් පසුව අයදුම්පත් අගැයීමට ලක් කිරීමෙන් අනතුරුව මෙම සම්මානය පිරිනැමෙන අතර, මේ සඳහා නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන්නේ අදළ විද්‍යාඥවරියන් විසින් නොවීම ද විශේෂත්වයකි.

මෙම සම්මානය සඳහා සලකා බැලුණු ජෛව අඟුරු, මහාචාර්ය මෙත්තිකා විතානගේ මහත්මිය විසින් නිෂ්පාදනය කරනු ලැබ තිබුණේ කොම්පෝස්ට් සෑදීමේ දී ශේෂ වන සියයට 50ක් වන අපද්‍රව්‍යවලින් ද කුණු කඳුවලට බහාලන කසළවලින්, ලී කුඩු, බලශක්තිය සඳහා ඇල්බීසියා ආදහනය කළ පසු ඉතිරිවන අඟුරු, වී පොතු (දහයියා) සහ ආක්‍රමණික පැළෑටි වැනි විවිධ ජෛව ස්කන්ධ යොදා ගෙනය.

පසෙහි සහ ජලයේ ඇති බැරලෝහ, ප්‍රතිජීවක වැනි ඖෂධ ද්‍රව්‍ය, ග්ලිෆොසේට්, කාබෝෆියුරාන් වැනි ද්‍රව්‍ය අහිතකර මට්ටමට අන්තර්ගතව ඇතිවිට මෙම ජෛව අඟුරු යොදා ගෙන ඒවා උරා ගැනීමට සැලැස්වීම මගින් අදළ මාධ්‍යවලින් විෂ ද්‍රව්‍ය ඉවත් කිරීමට හැකියාව ලැබෙන බව මහාචාර්ය මෙත්තිකා විතානගේ මහත්මිය පැවැසුවාය.

මෙයට අමතරව සක්‍රිය කළ කාබන් වෙනුවට ජෛව අඟුරු යෙදූ පිරිසුදු කිරීමේ ඒකක සකසා ඒ හරහා අපවිත්‍ර ජලය ගලා යෑමට සැලැස්වීමෙන් ද විෂ ඉවත් කිරීමට හැකියාව ලැබෙන බව ඇය සඳහන් කළාය.

# වකුගඩුවක් පිරිනමා ජීවිතයක් බේරාදෙමු

පානදුර ප්‍රදේශයේ පදිංචි සමන්ප්‍රිය ගොඩකන්ද මහතා (47) දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන අතර ඔහුට වකුගඩුවක් ඉක්මනින්ම බද්ධ කළ යුතු බවට කොළඹ ජාතික රෝහලේ වකුගඩු රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය ඒ.එල්.එම්. නසාර් මහතා නිර්දේශ කර ඇත.

ඔහුට අවශ්‍ය 'ඕ පොසිටිව්' වර්ගයේ වකුගඩුවක් ලබාදිය හැකි පරිත්‍යාගශියකු වෙත්නම් ඒ බව 0776767483 දුරකතන අංකයට දැනුම් දෙන ලෙස ගොඩකන්ද මහතාගේ පවුලේ ඥතිහු ඉල්ලීමක් කරති.

# පොහොර මිථ්‍යාව නිසා අනාගතයේදී අපි ලොකු අමාරුවක වැටෙනවා

## මන්ත්‍රිනී ගීතා කුමාරසිංහ කියයි

**(අම්බලන්ගොඩ හේමන්ත ද සිල්වා සහ අලුත්ගම තුසිත කුමාර ද සිල්වා)**

**ආණ්ඩුවේ මම හිටයත් පොහොර කතන්දරේ දී මම ඉන්නේත් මිනිස්සුත් එක්ක. මේ පොහොර මිත්‍යාව නිසා අප අනාගතයේ දී ලොකු කරදරයකට මුහුණපාන අවස්ථාවක් එනවා, යැයි ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රිනි ගීතා කුමාරසිංහ මහත්මිය පෙරේද (06) බෙන්තොට ද පැවසීය.**

අපේ රට තවත් ප්‍රපාතයකට යන්න ඉඩ නොදී දරුවන් වෙනුවෙන් අපි සියලු දෙනා එකතුවී රට බේරා ගනිමු යැයි ද ගීතා කුමාරසිංහ මහත්මිය පැවැසුවාය.

බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම් බලපත්‍ර ප්‍රදනය කිරීම නිමිත්තෙන් බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවනාගරයේ දී පෙරේද (06) පැවැති ජන හමුවක් අමතමින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගීතා කුමාරසිංහ මහත්මිය එසේ කීවාය.

එහිදී අදහස් දැක් වූ ගීතා කුමාරසිංහ මහත්මිය මෙසේ ද පැවසුවාය.

අපි මේ කොරෝනාව ජය ගන්නවා ජය ගන්නවාමයි. ජනාධිපතිතුමාට අගමැතිතුමාට අවස්ථාව ලබා දෙමින් විවේචන අපිත් කරනවා. මිනිස්සුත් කරනවා. මේ සියලු විවේචන අතර බලන්න සිද්ධ වෙන දේවල්. මේ දේවල් හැමදම කරනවා. පාරවල් හදනවා පාරවල් කාපට් කරනවා. ඒ හැමදේම කරනවා. මිනිස්සු කොතෙකුත් හොඳ දකිනවාට වඩා නරක දකින්න කැමතියි. හාල්ටික නැති වුණොත් පොහොර කතන්දරයේ දී මම ඉන්නේ මිනිස්සුත් එක්ක. මම ආණ්ඩුවේ හිටියට පොහොර කතන්දරේ මිත්‍යාව අනාගතයේ දී ලොකු කරදරයකට මුහුණපාන අවස්ථාවක් එනවා යැයි ද ඇය කීවාය.

# මුතුරාජවෙල ගැසට්ටුවට එරෙහිව කොළඹ අගරදගුරුත් ශ්‍රේෂ්ඨාධිකරණයට

**(රංජන් කටුගම්පොළ සහ තිළිණි ද සිල්වා)**

**මුතුරාජවෙල තෙත්බිම පරිසර සංවේදී කලාපයක් ලෙස නම් කර "රැම්සා" තෙත්බිමක් ලෙස සංවර්ධනය කිරීමට අදළව ජනාධිපතිවරයා ඉකුත් ඔක්තෝබර් 07 නිකුත් කළ ගැසට් නිවේදනය බලරහිත කරන්නැයි ඉල්ලා මැල්කම් කාදිනල් රංජිත් කොළඹ අගරදගුරුතුමන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ රිට් පෙත්සමක් ගොනු කළහ.**

එම ගැසට් නිවේදනය අනුව කටයුතු කිරීම සහ ඉදිරි පියවර ගැනීමෙන් නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළු වගඋත්තරකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් වළක්වන අතුරු නියෝගයක් කරන්නැයි ද කාදිනල්තුමෝ සිය පෙත්සමින් ඉල්ලා සිටිති.

මෙම පෙත්සමේ වගඋත්තරකරුවෝ ලෙස නාගරික සංවර්ධන සහ නිවාස ඇමැති අගමැති මහින්ද රාජපක්ෂ, නාගරික සංවර්ධන රාජ්‍ය ඇමැති නාලක ගොඩහේවා, එම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් සිරිනිමල් පෙරේරා, නාගරික සංවර්ධන අධිකාරිය, එම අධිකාරියේ සභාපති මේජර් ජනරාල් (විශ්‍රාමික) උදය නානායක්කාර, එම අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය, පරිසර අමාත්‍ය මහින්ද අමරවීර, වනජීවී අමාත්‍ය සී.බී. රත්නායක, වනජීවී අධ්‍යක්ෂ ජෙනරාල් චන්දන සූරියබණ්ඩාර, මිනුම්පති, වත්තල, මීගමුව, ජා ඇල ප්‍රාදේශීය ලේකම්වරු, නීතිපතිවරයා ඇතුළු 18 දෙනෙක් නම් කරනු ලැබ සිටිති.

නීතිඥ සඳුන් නාගහවත්ත මහතා මගින් ගොනු කළ පෙත්සමේ මෙසේ ද සඳහන් වේ.

පෙත්සම්කරු රෝමානු කතෝලික පූජකවරකු සේම ශ්‍රී ලංකා කතෝලික සභාවේ අගරදගුරුවරයා ද වේ.

මුතුරාජවෙල තෙත්බිම ආශ්‍රිතව ජීවත්වන ප්‍රජාවෙන් බහුතරයක් දෙනා කතෝලිකයෝ වෙති. පෙත්සම්කරු ඔවුන්ගේ අධ්‍යාත්මික නායකයා වේ.

වසර දහස් ගණනක සිට මිනිස් ප්‍රජාවට ආහාර සැපයීමේ ක්‍රියාදමයට යොදවා ගන්නා තෙත්බිම් ජල චක්‍රයේ ද කොටසකි. රැම්සා තෙත් බිම් පිළිබඳ වගකිව යුතු ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන වන්නේ වනජීවී අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරියයි. මෙම ආයතන දෙක මගින් 2006 වසරේදී " ජාතික තෙත්බිම් ප්‍රතිපත්තිය ද දියත් කෙරිණි.

මුතුරාජවෙල තෙත්බිම හෙක්ටයාර 1926කින් සමන්විත භූමි ප්‍රමාණයකි. මුතුරාජවෙල ආශ්‍රිත ප්‍රදේශයේ කතෝලික බැතිමතුන් අනූදහසක් ජීවත්වන අතර ග්‍රාම සේවා වසම් 15ක්ද ඊට අයත් වේ. බහුතරයක් ප්‍රජාව ධීවර, වගා, ආදී කටයුතුවල නිරතව සිටිති.

එසේම කතෝලික දේවස්ථාන කිහිපයක්ම මෙම ප්‍රදේශයේ පිහිටා ඇත. මෙම ප්‍රදේශය රැම්සා තෙත්බිමක් ලෙස සංවර්ධනය කිරීමට අදළව ජනාධිපතිවරයා විසින් ඉකුත් ඔක්තෝබර් මස 07දින 2248/44 දරන ගැසට් නිවේදනයක් නිකුත් කළේය.

එම ප්‍රදේශය රැම්සා තෙත් බිමක් ලෙස සංවර්ධනය කිරීම නිසා එහි පදිංචිකරුවන්ට සිය ජීවනෝපාය මාර්ග මෙන්ම නිවාස සහ ආගමික සිද්ධස්ථාන ද අහිමි වේ.

එම සංවර්ධන කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය ට පැවරීමත් එමගින් සිදු කර තිබේ. රැම්සා තෙත් බිම් සංවර්ධනය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කටයුත්තක් වන අතර එය නාගරික සංවර්ධන අධිකාරියට පැවරීම නීතිවිරෝධී වේ.

එම ගැසට් නිවේදනය නාගරික සංවර්ධන අධිකාරි පනතේ දෙවැනි ඡේදය යටතේ නිකුත් කිරීම නීතියට පටහැනි මෙන්ම රාජ්‍ය බාර සහ ස්වභාව යුක්ත මූල ධර්මයන්ට ද පටහැනි වේ.

රැම්සා තෙත් බිමකට කිසිවකුට ඇතුළු විය නොහැකි නිසා එම ප්‍රදේශයෙන් පදිංචිකරුවන්ට එම ප්‍රදේශයෙන් ඉවත් වීමට සිදු විය හැකි වේ. එබැවින් එම ගැසට් නිවේදනය නීතිවිරෝධී වේ.

මෙවන් තත්ත්වයක් යටතේ මුතුරාජවෙල තෙත් බිම පරිසර සංවේදී කලාපයක් ලෙස නම් කර "රැම්සා" තෙත් බිමක් ලෙස සංවර්ධනය කිරීමට අදළව ජනාධිපතිවරයා ඉකුත් ඔක්තෝබර් 07 වැනිද නිකුත් කළ ගැසට් නිවේදනය බලරහිත කරන නියෝගයක් නිකුත් කරන ලෙසත්, අදළ ගැසට් නිවේදනය අනුව කටයුතු කිරීම සහ ඉදිරි පියවර ගැනීමෙන් වගඋත්තරකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් වළක්වන අතුරු නියෝගයක් නිකුත් කරන ලෙසත්, එම ගැසට් නිවේදනය අහෝසි කරන රිට් ආඥවක් නිකුත් කරන ලෙසත් කාදිනල්තුමෝ සිය රිට් පෙත්සම මගින් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටිති.

# අලියකුට බියවී සෆාරි ජීප් රියක් පෙරළෙයි

1 වැනි පිටුවෙන්

පන්නිපිටියේ පදිංචිකරුවකු වන 41 හැදිරිදි තරිඳු සුමතිරත්න නමැති අය මෙම අනතුරින් මියගොස් ඇතැයි සඳහන් කරයි.

තුවාල ලැබූ පිරිස දඹුල්ල රෝහලට ඇතුළත් කළ බවත් රෝහල්ගත කළ පුද්ගලයන් අතර දරුවන් හතර දෙනකු ද සිටින බවත් පොලිසිය කියයි.

එම පිරිස උද්‍යානය නරඹමින් සිටිය දී අලියකුට බිය වීමෙන් මෙම අනතුර සිදුවී ඇති බවත් අනතුර සිදුවූ අවස්ථාවේ සෆාරි ජීප් රථයේ 11 දෙනකු සිට ඇති බවත් වාර්තා වේ.

අනතුරට පත් වූ පිරිස පන්නිපිටිය සහ මාතර ප්‍රදේශවල පදිංචිකරුවන් බව ද පොලීසිය සඳහන් කරයි.

# දඹුල්ලේ එළවළු කිලෝ ලක්ෂ 25 දැන් අටට බැහැලා

## වෙළෙඳ සංගම් සභාපති කියයි

**(දඹුල්ල - කාංචන කුමාර ආරියදස)**

**දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට සාමාන්‍ය දිනයක දී එළවළු කිලෝ ලක්ෂ 20ක් 25ක් පමණ ලැබෙන නමුත් එය මේ වනවිට ලක්ෂ හතක් අටක් පමණ දක්වා අඩුවී ඇතැයි දඹුල්ල වෙළෙඳ සංගමයේ සභාපති යූ.බී. ඒකනායක මහතා පැවැසීය.**

මේ හේතුවෙන් එළවළු මිල ශීඝ්‍රයෙන් ඉහළ යමින් තිබෙන බව ද ඔහු කීවේය.

වෙළෙඳපොළට එන එළවළු ප්‍රමාණය මෙලෙස ශීඝ්‍ර ලෙස අඩුවීමට පොහොර, කෘමිනාශක හිඟය මෙන්ම, අධික වැසි සහිත කාලගුණික තත්ත්වය ද බලපා ඇතැයි හෙතෙම සඳහන් කළේය.

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ බෝංචි, මාළු මිරිස්, කැරට්, ලීක්ස් එළවළු කිලෝවක තොග මිල රුපියල් 200ත් 350ත් අතර මිල ගණන් යටතේ අලෙවි වන බවද සභාපතිවරයා පෙන්වා දුන්නේය.

පහත රට ප්‍රදේශවලින් ලැබෙන මඤ්ඤොක්කා සහ කැකිරි, වට්ටක්කා හැරෙන්නට අනෙකුත් සෑම එළවළුවක්ම රුපියල් 150ත් 200ත් අතර තොග මිල ගණන් යටතේ අලෙවි වන බව ද ඔහු පෙන්වා දුන්නේය.



ආර්ථික මධ්‍යස්ථානය වෙනද වෙළෙන්දන් සහ ගොවීන් විශාල පිරිසකගෙන් පිරී ඉතිරී ගිය ද, මේ දිනවල එතරම් ගොවීන් පිරිසක් ආර්ථික මධ්‍යස්ථානයේ දැක ගැනීමට නොහැකි අතර, ඊයේ (07) දිනයේ එහි දැඩි පාළු ස්වභාවයක් ගෙන තිබිණි.

රුපියල් 140ත් 150ත් අතර මිලකට අලෙවි වූ තක්කාලි කිලෝවක් ඊයේ රුපියල් 280ත් 300ත් අතර ඉහළ මිලකට අලෙවි විය.

# පී.සී.ආර්. කට්ටල මගඩියකින් කෝටි 13 ක් වතුරේ

1 වැනි පිටුවෙන්

මෙම විගණන වාර්තාව, විගණකාධිපති ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න මහතා විසින් කතානායක මහින්ද යාපා අබේවර්ධන මහතාට පසුගිය සතියේ බාර දෙනු ලැබීය.

එම මිලදී ගැනීම් කර ඇති කාලයේදී පී.සී.ආර්. කට්ටලයක සාමාන්‍ය මිල රුපියල් 1,850ක් වුවත්, එම කට්ටල මිලදී ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඖෂධ සැපයුම් අංශය වෙනුවෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව රුපියල් කෝටි 76කට වැඩි මුදලක් (රුපියල් මිලියන 762.96ක්) වැය කර ඇතැයි එම වාර්තාවේ සඳහන් වේ.

අවම මිල සහිත ලංසු යටතේ ලබාදීමට නියමිත පී.සී.ආර්. කට්ටල පවතින පී.සී.ආර්. යන්ත්‍ර සමඟ නොගැළපීම නිසා ඒවා ප්‍රතික්ෂේප කර ඇතැයි සඳහන් වන අතර, තාක්ෂණික ඇගයීම් කමිටුව ඇතැම් සමාගම්වලට වාසිදයක අයුරින් කටයුතු කර ඇත්තේ පැවැති හදිසි තත්ත්වය, වෛද්‍ය පර්යේෂණ ආයතනය භාවිත කරන යන්ත්‍ර වර්ගය හා අතීත අත්දැකීම් සලකා බවත් පැවැසේ.

ලංසු කැඳවීමට පෙර නිවැරදි ලෙස එම කට්ටලවල විශේෂතා ද භාවිත වන යන්ත්‍රවලට අනුරූප වන අයුරින් සූදනම් කර තිබී නැති බව වාර්තාවේ දැක්වේ.

තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත අමාත්‍යාංශයේ විශේෂ ප්‍රසම්පාදන කමිටුව ඉහළ ලංසුකරුවකුගෙන් ඒවා මිලදී ගැනීමට නිර්දේශ කර ඇත්තේ, රුපියල් කෝටි 12.5ක පාඩුවක් විඳිමින් බව ද එහි සඳහන් වේ.

# ආණ්ඩුව මෙහෙම ගියොත් විකල්ප බලවේගයක් ඒවි:ඇමැතිලා අසාර්ථකයි

1 වැනි පිටුවෙන්

ආණ්ඩුව කරන කිසිම දෙයක් ජනතාව නොදන්නවා සේම ඇමැතිවරුන් කියන කිසිම දෙයක් අද ජනතාව විශ්වාස නොකරන බව පැවසූ මන්ත්‍රීවරයා ඇමැති මණ්ඩලය සම්පූර්ණයෙන්ම අසාර්ථක බව ද ප්‍රකාශ කළේය.

රටේ විශාල ආර්ථික අර්බුදයක් නිර්මාණයවී පෝලිම් යුගයක් නිර්මාණයවී ඇති බවද හෙතෙම සඳහන් කළේය.

ප්‍රජාතන්ත්‍රවාදී රටක් පාලනය කළ යුත්තේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයට බව පැවසූ ප්‍රියදර්ශන මහතා ජනතාවගේ මූලික අත්‍යවශ්‍ය භාණ්ඩ මේ ආකාරයට දිගින් දිගටම අහස උසට නගිද්දි රටක් පාලනය කිරීම දුෂ්කර වනු ඇතැයි ද පැවසුවේය.

ආණ්ඩුව මේ යන්න හදන්නේ කොතැනකට දැයි තවමත් බලා සිටින බවත් පවතින තත්ත්වය යටතේ මේ ආණ්ඩුවේ ඇමැති තනතුරක් බාර ගැනීමට කිසිම අදහසක් තමාට නැති බවත් අනුර ප්‍රියදර්ශන යාපා මහතා කීවේය.

මේ මොහොතේදී ජනතාවට සහන අවශ්‍ය බව හෙතෙම සඳහන් කළේය.

# කතරගම දේවාලයට රන්තැටිය පූජා කළ අංගොඩ ලොක්කාගේ බිරිය පොලිසියට

1 වැනි පිටුවෙන්

2019 ජූලි මස කතරගම පෙරහර පැවැති අවස්ථාවක දී අංගොඩ ලොක්කාගේ බිරිය විසින් මෙම රන් තැටිය කතරගම දේවාලයට පූජා කරන ලද බවට විමර්ශනවල දී තොරතුරු හෙළිවී ඇත.

එම තොරතුරුවල සත්‍ය අසත්‍ය බව හෙළි කර ගැනීම සඳහා ඇය මෙලෙස කැඳවා ඇතැයි පොලිසියේ උසස් නිලධාරියෙක් පැවසීය.

කොලොන්න ප්‍රදේශයේ පදිංචිකාරියක වන මෙම කාන්තාවට කොළඹ අපරාධ කොට්ඨාසයට අද පැමිණෙන ලෙසට දැනුම් දුන් බව ඔහු කීවේය.

මෙම කාන්තාව පවුම් 38 ක් බර රන්තැටියක් දේවාලයට පූජා කළේ කුමන හේතුවක් මත ද යන්න හෙළිකර ගැනීම සඳහා පොලිසිය ඇයගෙන් ප්‍රශ්න කිරීමට නියමිතව ඇත.

මෙම රන්තැටිය මීට වසරක පමණ කාලයක සිට අතුරුදන්ව ඇති බවත්, ඒ සම්බන්ධයෙන් පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත්තේ මීට සති දෙකකට පමණ ඉහත දී බවද පොලිස් ආරංචි මාර්ග කියයි.

මේ සම්බන්ධයෙන් පොලිස්පති සී.ඩී වික්‍රමරත්න මහතාට ලැබුණු තොරතුරකට අනුව කොළඹ අපරාධ කොට්ඨාසය විමර්ශන ආරම්භ කර තිබේ.

කොළඹ අපරාධ කොට්ඨාසයේ අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ජනක් නන්දන මහතාගේ අධීක්ෂණය යටතේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරි නෙවිල් සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් පොලිස් කණ්ඩායමක් කතරගමට ගොස් පරීක්ෂණ ආරම්භ කර ඇත.

# කොවිඩ් පෝලිමට 626 ක් අලුතෙන්

**(ඩයනා උදයංගනී)**

**කොවිඩ් ආසාදිත රෝගීන් තවත් 626 දෙනකු ඊයේ (7 වැනිද) අලුතින් හඳුනාගත් බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා නිවේදනය කළේය.**

ඒ අනුව, මෙරටින් වාර්තා වන මුළු කොවිඩ් රෝගීන් සංඛ්‍යාව 5,45,256 ක් බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වාර්තාවේ දැක්වේ.

කොවිඩ් ආසාදිත 16,064 දෙනකු මේ වන විට රෝහල් සහ නිවෙස්වල ප්‍රතිකාර ලබමින් සිටින බව ද එහි සඳහන් වේ.

කොවිඩ් ආසාදිත වී ප්‍රතිකාර ලබමින් සිටි කොවිඩ් රෝගීන් 271 දෙනකු සුවය ලබා ඊයේ (7 වැනිද) රෝහල්වලින් පිටව ගොස් ඇති අතර, සුවය ලැබූ මුළු රෝගීන් සංඛ්‍යාව මේ වන විට 5,15,183ක් දක්වා ඉහළ ගොස් ඇතැයි සෞඛ්‍ය අංශ සඳහන් කරයි.

# කොවිඩ් මරණ තවත් 15 ක්

**(ඩයනා උදයංගනී)**

**කොවිඩ් ආසාදිත වූ රෝගීන් තවත් 15 දෙනකු පෙරේද (6 වැනිද) මරණයට පත් වී ඇතැයි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ඊයේ (7 වැනිද) තහවුරු කළේය.**

ඒ සමඟ මෙරටින් වාර්තා වූ කොරෝනා ආසාදිත මරණ මුළු සංඛ්‍යාව 13,856 දක්වා ඉහළ ගොස් ඇත.

වයස අවුරුදු 60ට වැඩි 12 දෙනකු සහ අවුරුදු 30ත් 59ත් අතර තිදෙනකු මියගිය අය අතර වන බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වාර්තාවේ දැක්වේ.

පිරිමින් අට දෙනකු සහ කාන්තාවන් හත් දෙනකු මියගිය පිරිසට ඇතුළත් බව ද එම වාර්තාවේ සඳහන් වේ.

# මිලිටරි පාලනයකට සූදානම් නෑ: පොරොන්දුවූ වෙනස ස්ථිරවම කරනවා

1 වැනි පිටුවෙන්

බලාපොරොත්තු වුණේ මිලිටරි ක්‍රමය ගෙනියන ගෝඨාභය කෙනෙක් කියා සමහරුන් කීවත් එවැනි ක්‍රමයක් ප්‍රජාතන්ත්‍රවාදී රටකට නොගැළපෙන බව ද ජනාධිපතිවරයා සඳහන් කළේය.

නමුත් තමන් රටට පොරොන්දු වූ විප්ලවීය වෙනස අනිවාර්යයෙන්ම කරන බව ද ජනාධිපතිවරයා කීවේය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා මේ බව පැවසුවේ සංවර්ධන කටයුතු අවසන් කළ මාර්ග 1,500 ක් එකම දිනක දී ජනතා අයිතියට පත්කිරීම වෙනුවෙන් වීරකැටිය, මණ්ඩාඩුව මහජන ක්‍රීඩාංගණයේ පෙරේද (6) පස්වරුවේ පැවති උත්සවය අමතමිනි.

කාබනික පොහොර භාවිත කරන්න යැයි ගොවියාගේ බෙල්ලෙන් අල්ලා හමුදවේ විදියට කීමේ හැකියාව ඇතත්, එසේ කිරීමේ අවශ්‍යතාවක් තමාට නැතැයි කී ජනාධිපතිවරයා ජනතාව බලාපොරොත්තු වුණේ එවැන්නක් නොවන බව ද කීවේය.

තමන් බලයට ආවොත් ප්‍රජාතන්ත්‍රවාදය නැති වන බවට එද කී අයම දැන් 'අයියෝ අපි බලාපොරොත්තු වුණේ ඔහොම එක්කෙනෙක් නෙවේ, හමුදවේ වගේ එක්කෙනෙක්' කියා පවසන බව ජනාධිපතිවරයා පැවසීය.

මානව හිමිකම් උල්ලංඝනය කළ බවට වන බොරු චෝදනා නිසා ශ්‍රී ලංකාව ජිනීවාවලට අදත් යන බව කී ජනාධිපතිවරයා 'අපි අපේ රටට එහෙම කරන්න ඕන නැහැ.' යැයි ද සඳහන් කළේය.

තමන් සෞභාග්‍යයේ දැක්ම යටතේ පොරොන්දු වී ඇත්තේ රටක් ලෙස කිරීමට අපහසු දේ බව කී ජනාධිපතිවරයා එම පොරොන්දු ඉටුකිරීමට යද්දී ඇතැමුන් විශාල වශයෙන් විරෝධතා ගෙනයන බව ද ප්‍රකාශ කළේය.

තමා බලයට පත් වූ පසුව ආරක්ෂක රථ ප්‍රමාණය අඩුකර, විදේශ සංචාරවලට ගෙන යන පිරිස අඩුකර, ජනාධිපති මැදුරට නොයා නිවසේ සිටිමින් වෙනස්කම් රැසක් කර ඇතැයි ද ජනාධිපතිවරයා පැවසීය.

# තනිව විසූ වියපත් කත ළිඳට වැටී මරුට

(පානදුර සුමිත් ප්‍රේමතිලක)

කළුතර උතුර, පරගස්තොට ප්‍රදේශයේ වයෝවෘද්ධ කාන්තාවක ඉකුත්ද (05) ළිඳකට වැටී මියගොස් ඇතැයි කළුතර උතුර පොලිසිය කියයි.

මෙසේ මියගොස් ඇත්තේ කළුතර උතුර, පැල්පොල, ආචාරිගොඩ ප්‍රදේශයේ පදිංචිව සිටි මහවඩුගේ ලීලාවතී 75 හැවිරිදි කාන්තාවක බව පොලිසිය කීය.

අදාළ කාන්තාව තනිව නිවසේ පදිංචිව සිට ඇති අතර, ඇය ළිඳට වැටෙන අයුරු අසල සිටි කුඩා දැරියක විසින් දැක ඇති බවත්, ඒ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදුකරන බවත් පොලිසිය කීය.

මෘත දේහය නාගොඩ මහ රෝහලේ තැන්පත් කර ඇති අතර, පශ්චාත් මරණ පරීක්ෂණය සිදුකිරීමට නියමිතය.

කළුතර උතුර පොලීසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

# මත්ද්‍රව්‍ය නිසා වසරකට 43,000ක් මැරෙනවා

## වෛද්‍ය කේ.ඩබ්.කේ. කල්‍යාණතිස්ස කියයි

(ජේ.ඒ.එල්. ජයසිංහ)

මත්ද්‍රව්‍ය භාවිතා කිරීමෙන් වාර්ෂිකව පුද්ගලයන් 43000 මරණයට පත් වන බව 2019 වසරේදී දීපව්‍යාප්තව කරන ලද සංගණනයකදී හෙළිවී ඇතැයි මහනුවර ජාතික රෝහලේ මානසික සුවතා ඒකකයේ වෛද්‍ය නිලධාරී වෛද්‍ය කේ.ඩබ්.කේ. කල්‍යාණතිස්ස මහතා මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති විශේෂ රැස්වීමකදී පැවසීය.


අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් මහනුවර දිස්ත්‍රික්කයේ මත්ද්‍රව්‍ය නිවාරණ හා පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා අනුයුක්ත කළ අභ්‍යාසලාභී උපාධිධාරීන් දැනුවත් කිරීම සඳහා පැවති මෙම රැස්වීමේදී වැඩිදුරටත් කරුණු දැක්වූ වෛද්‍ය කල්‍යාණතිස්ස මහතා මෙසේද කීය.

ගංජා, හෙරොයින්, අයිස් වැනි සමාජය තුළ දැනට ප්‍රචලිත මත්ද්‍රව්‍ය වලට අමතරව රසායනිකව සකස් කරන ලද මත්ද්‍රව්‍ය ව්‍යාප්තවීම ඉදිරියේදී ලෝක ප්‍රවණතාවයක් බවට පත්වෙමින් පවතිනවා. එමෙන්ම මාත්‍රාව ඉක්ම වූ ඖෂධ සහ අනිසි ඖෂධ භාවිතය ද ගැටලුවක් බවට පත්වෙමින් තිබෙනවා. කුමන ආකාරයේ මත්ද්‍රව්‍ය භාවිතා කළත් ඒ මගින් සිදුවන සමාජ ව්‍යසනය වැළැක්විය නොහැකියි.

මත්ද්‍රව්‍යවලින් පුද්ගලයා මුදගත හැකි නමුත්, සමාජීය ඇබ්බැහිවීම හා හිතවතුන්ගේ බල කිරීම් මත යළි ඒ වෙනුවෙන් ඔවුන් යොමුවනවා. මත්ද්‍රව්‍ය සඳහා පුද්ගලයන් ආකර්ෂණය කර ගැනීම සමාගම් විසින් ඍජු හා වක්‍ර අයුරින් විවිධ ක්‍රියාකාරකම්වල නිරත වන බව ද වෛද්‍ය කල්‍යාණතිස්ස මහතා මෙහිදී වැඩිදුරටත් පැවැසීය.

මහනුවර දිස්ත්‍රික් ලේකම් චන්දන තෙන්නකෝන්, මහනුවර සහකාර දිස්ත්‍රික් ලේකම් සඳමාලි ජයසිංහ, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මධ්‍යම පළාත් සම්බන්ධීකාරක ටී.ජී. ආරියරත්න යන මහත්ම මහත්මීහු ද මෙම අවස්ථාවට සහභාගි වූහ.

# රට කැළඹූ ආණ්ඩුව එළි දුටුදා...



කඩුවෙල හිටපු නගරාධිපති ජී.එච්. බුද්ධදාස මහතා විසින් රචිත 'රටම කැළඹූ දින 52 ආණ්ඩුව' නැමැති ග්‍රන්ථය ඉකුත්ද ප්‍රකාශයට පත් කෙරිණි.

එහිදී එහි පිටපතක් බුද්ධදාස මහතා අතින් එජාප නායක රනිල් වික්‍රමසිංහ මහතාට පිළිගැන්වුණ අයුරු.


**උකස් රත්තරං**

උකසින් බේරා වැඩිම මිලට මිලදී ගනිමි. ඉතිරි මුදල් ඔබේ අතට නැතහොත් නැවත වැඩිම මිලකට උකස් තබා දෙමි.

සංජීවනී:- 071-2318328

හිසට සිසිලසයි දවස පුරා ප්‍රබෝධයයි

**ෆිගරෝලියා**

හර්බල් මසාජ් හෙයාර් ටොනික්

මි.ලි 100, 200, 350 ප්‍රමාණයන්ගෙන් ලබා ගත හැක

වසර 50කට වඩා වැඩි විශ්වාසය

0774727984-0755110578

**ජා-ඇල කොටුගොඩින්**



ඉඩම සමග ලක්ෂ 25 කට නිවසක්

දුරකථන - 076 8256447
076 8256441
0768256445
011 2233886
011 2237203

CENTRAL HOMES & REAL ESTATE (PVT)LTD.
JA-ELA



## තෙමස් පූර්ණ සිහිකිරීම

උපත 1937 03 06



විපත 2021 08 10

**කේ. ඩී. ධර්මදාස මහතා**

නො. 71/02, මේජර් ප්‍රියන්ත කොළඹගේ මාවත, තුම්බෝවිල, පිළියන්දල විසූ

**විශ්‍රාමලත් හමුදා නිලධාරි කිරින්ගොඩගේ දොන් ධර්මදාස මහතා**

අප අතුරින් වෙන් වී තෙමසක් පිරෙන 2021.11.09 දින සුමධුර දහම් දෙසුමකි. පසු දින සංඝගත දක්ෂිණාවකි.

එම පින් බෙලෙන් ඔබට උතුම් නිවන් සුව අත්වේවා!

**මීට සොවින් තැවෙන**
**පත්මසීලි කොළඹගේ - භාර්යාව**
**නිලුකා තරංගනී - දියණිය**
**සම්පත් පද්මලාල් - බෑණනුවන්**
**දිලන, දිනදි - මුනුපුරු මිණිබිරියන්**



## හැකියාවට රැකියාවක්

### සී/ස පැල්මඩුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය

### තනතුරු පුරප්පාඩු

සී/ස පැල්මඩුල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ පහත පුරප්පාඩු වී ඇති තනතුර සඳහා, රත්නපුර දිස්ත්‍රික්කයේ වසර 02ක ස්ථිර පදිංචි වයස අවුරුදු 18-45 ත් අතර, **(සමුපකාර සමිති සේවකයන්ට සහ සමිති අභ්‍යන්තර සේවකයන්ට වයස් සීමාව බලපානු නොලැබේ.)** අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් 2021.12.31 දහවල් 12.00 දක්වා මා විසින් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| තනතුර | -: | 111 ශ්‍රේණියේ බැංකු සේවා කළමණාකරු තනතුර (විධායක ශ්‍රේණිය) |
| වැටුප් ක්‍රමය | -: | 28,500.00 - 10 × 190 - 10 × 210 - 32500.00 |
| | | මෙයට අමතරව රුපියල් 20000.00 ක පමණ අමතර දීමනා |
| පන්තිය | -: | 111 |
| පුරප්පාඩු සංඛ්‍යාව | -: | 01 |

**සුදුසුකම්**

I. පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය සමඟ පිළිගත් රාජ්‍ය හෝ පෞද්ගලික බැංකුවක මාස 06 ක පුහුණුව ලබාතිබීම හෝ

II. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බැංකු කළමණාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සහ පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක බැංකු කටයුතු පිළිබඳව වසර 01 ක පලපුරුද්ද තිබීම හෝ

III. පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ සුළු මූල්‍යකරණ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම හෝ පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ බැංකු කළමනාකරණ ඩිප්ලෝමා සහතිකය ලබාතිබීම හෝ, සමග පිළිගත් ආයතනයක බැංකු ක්ෂේත්‍රයේ වසර 05 ක පලපුරුද්ද තිබීම හෝ

IV. පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ බැංකු හා මූල්‍ය කළමණාකරණ පාඨමාලාව හාදාරා තිබීම හෝ ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ කළමනාකරණය පිළිබඳ (උසස් පෙළ) සහතිකය ලබාතිබීම හෝ , සහ පිළිගත් ආයතනයක බැංකු ක්ෂේත්‍රයේ විධායක ශ්‍රේණියක වසර 08ක පලපුරුද්ද තිබීම හෝ

V. සබරගමුව විශ්ව විද්‍යාලයේ සමුපකාර ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම සහ පිළිගත් වාණිජ කාර්මික ආයතනයක බැංකු ක්ෂේත්‍රයේ වසර 05 ක පලපුරුද්ද සහිතව, විධායක මට්ටමේ තනතුරක වසර 03 ක හෝ මෙහෙයුම් 01 මට්ටමේ තනතුරක වසර 08 ක හෝ මෙහෙයුම් 11 මට්ටමේ තනතුරක වසර 10 ක හෝ සතුටුදායක සේවා පලපුරුද්දක් ලබා තිබීම.

තමන් විසින් පිළියෙල කරන ලද අයදුම්පත් උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, ග්‍රාමසේවා සහතිකය, පළපුරුද්ද පිළිබඳ සහතික, හැදුනුම්පත සහ වෙනත් සුදුසුකම් සහිත සහතිකවල ජායා පිටපත් පහත ලිපිනයකට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

**ගරු සභාපති,**
**සී/ස පැල්මඩුල්ල විවිධ සේවා සමුපකාර සමිතිය,**
**බලංගොඩ පාර,**
**පැල්මඩුල්ල.**



## මාළු කැපීම සඳහා දක්ෂ අය අවශ්‍යයි

**OCEAN COOL ආයතනයට**
අවු. 45 ට අඩු නැවතී වැඩ කිරීමට කැමති පළපුරුද්ද සහිත

**මාළු කපන අය අවශ්‍යයි**

දිනක වැටුප රු. 2500/-ට වැඩි

දක්ෂතාවය හා පළපුරුද්ද අනුව වැටුප අඩු වැඩිවේ.

**සම්මුඛ පරීක්ෂණය සඳහා 2021.11.09 වන අඟහරුවාදා දින පෙ.ව. 11.00 ට පහත ලිපිනයට පැමිණෙන්න.**

ඕෂන් කූල්, නො.88, රජමල්වත්ත පාර, මෝදර, කොළඹ 15
0766424832,0710912141



## රියදුරන් අවශ්‍යයි

වයස අවු. 45 ට අඩු බර වාහන ලයිසන් ඇති අවු. 2 ට වඩා පලපුරුදු නැවතී වැඩ කිරීමට කැමති

**රියදුරන් අවශ්‍යයි (සිංහල)**

දිනක වැටුප රු. 2500/-

දක්ෂතාවය අනුව වැටුප අඩු වැඩිවේ.

**පරීක්ෂණය සඳහා 2021.11.09 වන අඟහරුවාදා දින පෙ.ව. 11.00 ට පැමිණෙන්න**

ඕෂන් කූල්, නො.88, රජමල්වත්ත පාර, මෝදර, කොළඹ 15
0710912141, 0766424832



AMW bringing the world to you

**ඇසෝසියේටඩ් මෝටර්වේස් පෞද්ගලික සමාගම**

**පහත සඳහන් ද්‍රව්‍ය විකිණීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ**

- ගෘහ භාණ්ඩ (වානේ/ දැව/ ප්ලාස්ටික්)
- මුදල් සේප්පු
- විදුලි උපකරණ (AC/ TV/ ශීතකරණ)
- රාක්ක, කාපට්, සෙවිලි තහඩු
- යන්ත්‍රෝපකරණ (Hydraulic Jacks/ Compressors)
- රිම්, ටයර්, ස්ටීල් ලයිට් ෆිටින්ස්

මේ සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන් මුද්‍රා තබන ලද මිල ගණන් සහිත අයදුම් පත්‍රයක් 2021.11.17 දින ප.ව. 4.00ට පෙර මෙහෙයුම් ප්‍රධානී, අංක 170, සේදවත්ත පාර, වැල්ලම්පිටිය යන ලිපිනයේ ඇති සීල් තබන ලද ටෙන්ඩර් පෙට්ටිය තුළට දමන්න.

සතියේ දිනවල පෙ.ව. 8.00 - ප.ව. 4.00 අතර පහත ලිපිනයට පැමිණ අදාල භාණ්ඩ පරීක්ෂා කළ හැක.

මෙහෙයුම් ප්‍රධානී: 0777 736 300

අංක 170, සේදවත්ත පාර, වැල්ලම්පිටිය.

skills



## මහජනතාව වෙත කරන දැනුම්දීමයි

**කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී සමඟ ඒකාබද්ධ වීම හේතුවෙන් ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් පී.එල්.සී සමාගම වෙත 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ සහ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කර ඇති බලපත්‍ර අවලංගු කිරීම**

මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ සැලැස්මේ කොටසක් ලෙස ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් පී.එල්.සී සමාගම කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී සමඟ ඒකාබද්ධ වීම හේතුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් පී.එල්.සී සමාගම වෙත මුදල් ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කර ඇති බලපත්‍රය සහ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ කල්බදු මූල්‍යකරණ පවත්වාගෙන යාමට නිකුත් කර තිබූ ලියාපදිංචිය 2020.12.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කළ බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ. ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් පී.එල්.සී විසින් 2020.12.31 දින සිට මහජනතාවගෙන් තැන්පතු භාර ගැනීම හෝ කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුතු සිදුකර නොමැත.

**අධ්‍යක්ෂක - බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
8 වන මහල, ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01
011-2477500 011-2477738 dsnbfi@cbsl.lk



CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE

## කැලණිය විශ්වවිද්‍යාලය

### දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර) - 2015**

දිවයිනේ පැවති කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් අවලංගු කරන ලද ඉහත සඳහන් පරීක්ෂණය 2021 නොවැම්බර් මස 22 වන දින පැවැත්වීමට සියලු විධිවිධාන යොදා ඇත. පරීක්ෂණය සඳහා ඉදිරිපත්වීමට බලාපොරොත්තු වන සියලු අපේක්ෂකයන්ට තමන්ගේ විභාග ප්‍රවේශ පත්‍රය 2021-11-08 දින සිට කැලණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ පහත වෙබ් අඩවිය මගින් බාගත කළ හැකිය.

http://www.cdce.kln.ac.lk

**වැඩිදුර විමසීම් හා මේ පිළිබඳ ව යම් ගැටලුවක් වේ නම් දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ පහත සඳහන් දුරකථන අංක අමතන්න.**

011-2987000
011-2987001
011-2987005
011-2914478
011-2908166

ලේඛකාධිකාරි
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය

CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE



## ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය

**කැබිනට් මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුව**
**වරාය හා නාවික අමාත්‍යාංශය**
**ශ්‍රී ලංකා වරාය අධිකාරිය**

## ලංසු කැඳවීම

**පර්යන්ත කළමනාකරණ පද්ධති මිලදී ගැනීම / අර්ධ ස්වංක්‍රීය නැඟෙනහිර බහාලුම් පර්යන්තය සඳහා ද පර්යන්ත මෙහෙයුම් පද්ධතිය කොළඹ වරාය**

**Bid No. CMS/LP/21/PT/02/24**

කොළඹ වරායේ පර්යන්ත කළමාකරණ පද්ධති/අර්ධ ස්වයංක්‍රීය නැඟෙනහිර බහාලුම් පර්යන්තය සඳහා මෙහෙයුම් පද්ධති වෙනුවෙන් ප්‍රසම්පාදන ලබා ගැනීම සඳහා කැබිනට් මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ලංසු කැඳවනු ලැබ ඇත.

ලංසු ඉදිරිපත් කළ යුත්තේ කොළඹ 01 ලේඩින් බැස්ටියන් පරේ අංක 45 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණ ප්‍රධාන කළමනාකාරතුමන් වෙතින් ශ්‍රී ලංකා රුපියල් 100,000.00 (වැට් ඇතුළුව) ආපසු නොගෙවන ලියකියවිලි ගාස්තුව සෑම ලංසුවකට වෙන වෙනම ගෙවීමෙන් පසු ලබාගන්නාවූ ලංසු ලියකියවිලි පුරවා දීමෙන්ය. මෙම ලංසු ලියවිලි කට්ටල 2021 නොවැම්බර් මස 08 දින උදේ. 9.00 සිට 2021 දෙසැම්බර් මස 22 දින 1400 පැය දක්වා නිකුත් කරනු ලැබේ.

සම්පූර්ණ කරන ලද ලංසු ලියකියවිලි සභාපති කැබිනට් මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුව අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01 යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑල මගින් එවීම හෝ අමාත්‍යාංශයේ තබා ඇති ලංසු පෙට්ටියේ බහාලිය හැක. ලංසු භාර ගැනීම 2021 දෙසැම්බර් මස 23 දින 1400 පැයට අවසන් වන අතර ඒ සමගම ඒවා විවෘත කිරීම ආරම්භ කරනු ඇත. ලංසු තැබීමේ පූර්ව රැස්වීම 2021 නොවැම්බර් මස 30 දින උදෑසන 10.30ට කොළඹ 01 ලේඩින් බැස්ටියන් පාරේ අංක 45 දරන ස්ථානයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්මික අධ්‍යක්ෂ කාර්යාලයේ පවත්වනු ලැබේ.

සෑම ලංසුවක් සමඟම ඇමෙරිකානු ඩොලර් 180,000 හෝ ඒ හා විනිමය අනුපාතයට සමාන ශ්‍රී ලංකා මුදල් ප්‍රමාණයක ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පළකරන්නට යෙදෙන අනුපාත යටතේ, ලංසු තැබීම අවසන් වන දින සිට දින 208 ඉදිරියට වලංගු සහිත ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය.

ලංසු තැබීමේ ලියකියවිලි ප්‍රධාක කළමනාකරු (සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණ) ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 45, ලේඩින් බැස්ටියන් පාර, කොළඹ 01 යන ලිපිනයෙන් ලබා ගත හැක. (දු.ක. 2323102, 2432866 ෆැක්ස් 2381652)

**සභාපති**
**කැබිනට් මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුව**
**වරාය හා නාවික අමාත්‍යාංශය**
**අංක 19, චෛත්‍ය පාර,**

# මාලිගාවත්ත කතගේ ඝාතනයට මිතුරියත් ඇගේ සැමියාත් අත්අඩංගුවට

## ප්‍රධාන සැකකරු පැනගිහින්

(ඉන්දිකා රාමනායක, මල්වාන - ඩබ්ලිව්.ඩී.එම්. විතානගේ, දෙල්ගොඩ - සුදත් පුබුදු කීර්ති සහ කැලණිය - ලාල් එස්. කුමාර)

**සපුගස්කන්ද මාබිම පාරේ පිහිටි තෙල් පිරිපහදු මධ්‍යස්ථානය අසල මාර්ගයේ කැළි කසළ ගොඩක තිබූ ගමන් බෑගයක තිබී හමුවූ කාන්තා මළ සිරුර සම්බන්ධයෙන් සැකකාරියක හා සැකකරුවකු අත්අඩංගුවට ගත් බව පොලිසිය පවසයි.**

මෙම ඝාතන සිද්ධිය සම්බන්ධයෙන් මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ එම කාන්තාවගේ මිතුරිය සහ මිතුරියගේ සැමියා බව ද පොලිසිය කියයි.

මෙම ඝාතන සිද්ධියේ ප්‍රධාන සැකකරු එම කාන්තාවගේ මල්ලී බවත්, සිද්ධියෙන් පසුව ඔහු ප්‍රදේශයෙන් පලාගොස් ඇති බවත් පොලිසිය පවසයි.

අත්අඩංගුවට ගෙන සිටින සැකකාරිය සහ ඇයගේ සොහොයුරා ඉකුත් 28 වැනි දින මෙම කාන්තාව රවටා මාලිගාවත්ත නිවසේ සිට ත්‍රිරෝද රථයකින් සමිට්පුරට කැඳවාගෙන ගොස් සමිට්පුර පිහිටි සැකකාරියගේ කුලී නිවසේදී ඇයගේ සහෝදරයා සමග එක්ව කාන්තාව ඝාතනය කර ඇති බවට ප්‍රශ්න කිරීමේදී හෙළිවූ බව උසස් පොලිස් නිලධාරියෙක් පැවැසීය.

මෙම සිද්ධියේ ප්‍රධාන සැකකරුවන සැකකාරියගේ බාල සහෝදරයා දැනට ප්‍රදේශයෙන් පලාගොස් ඇති බවත්, ඔහු තදින්ම අයිස් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී සිටින්නකු බවත් එම උසස් නිලධාරියා කීය.

සැකකරු සමිට්පුර නිවසේ දී මෝල් ගසකින් කාන්තාවගේ හිසට පහරදී ඇය සිහිසුන් වූ පසුව ඇය හිස වසා සිටි රෙදි කඩෙන් ගෙල සිර කර මෙම ඝාතනය සිදුකර ඇති බවටද පොලිසිය තොරතුරු හෙළි කරගෙන ඇත.

ඝාතනයට ලක් වූ මොහොමඩ් ශාපි පාතුමා මුම්තාස් (45) නමැති කාන්තාව සූදු ක්‍රීඩාවට අමතරව, මුදල් පොලියට දීම සහ උකස් කරන රන් භාණ්ඩ සින්නවීමට නොදී මිලදී බේරාගෙන වැඩි මුදලකට දීමේ ව්‍යාපාරයක ද යෙදී සිටි බව ද පොලිසිය පවසයි.

සිද්ධියේ ප්‍රධාන සැකකාරිය පවුමක පමණ රන් මුද්දක් රුපියල් 25,000 ක මුදලකට උකස් තබා ඇති බවත්, එය මාලිගාවත්තේ කාන්තාව විසින් මුදල් ගෙවා බේරා ගත්තද ඉන් බඩුවේ වටිනාකමට අදාළ මුදල ඇයට මෙතෙක් ලබා නොදීමේ සිද්ධියක් සම්බන්ධයෙන් දෙදෙනා අතර අමනාපයක් පැවැති බවට තොරතුරු ලැබී තිබූ බවද පොලිසිය පවසයි.

සිද්ධිය වූ දින සවස ප්‍රධාන සැකකරුට අයත් රන් මාලයක් බේරාගැනීමට ඇති බවට පවසා සැකකාරිය ත්‍රිරෝද රථයකින් මාලිගාවත්ත නිවසේ සිට සමිට්පුරට කැඳවාගෙන විත් ඇති බවත් පසුව මාලය උකස් කළ රිසිට්පත ගෙන ඒමට නොහැකි වූ බව පවසා මොවුන් දෙදෙනා කාන්තාව සමඟ සමිට්පුර ප්‍රධාන සැකකාරියගේ කුලී නිවසට ගොස් ඇති බවත් පොලිසිය කියයි.

රුපියල් 25,000 ට බේරාගත් මුද්දේ නියම වටිනාකමට අදාළ මුදල අවශ්‍ය බවට ප්‍රධාන සැකකරු මෙහිදී කාන්තාවට තර්ජනය කර ඇති අතර එහිදී සැකකරු හා පාතුමා (ඝාතනය කළ කාන්තාව) අතර බහින් බස් වීමක් සිදුවී ඇති බව ද පොලිසිය සඳහන් කරයි.

මෙම බහින් බස්වීම දුරදිග ගොස් සැකකරු නිවස තුළ තිබූ මෝල් ගසකින් පාතුමාගේ හිසට පහර දී ඇය සිහිසුන් වූ පසුව ගෙල සිරකර ඝාතනය කර ඇති බවට හෙළි වූ බව ද පොලිසිය පවසයි.



කාන්තාවගේ ඝාතන සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සැකකාරිය හා සැකකරු රැඳවුම් නියෝග ලබාගැනීම සඳහා මහර මහේස්ත්‍රාත් අධිකරණයට වෙත රැගෙන ගිය අයුරු. (ඡායාරූප: දෙල්ගොඩ - පුබුදු කීර්ති)

පසුව ප්‍රධාන සැකකාරිය ඇයගේ ඇඳුම් දමන බෑගයේ තිබූ ඇඳුම් ඉවත් කර කාන්තාවගේ මළසිරුර අත් පා ගැටගසා එම ගමන් මල්ලට දමා එය, ප්ලාස්ටික් පැදුරකින් ද ඔතා එදින රාත්‍රියේ එම නිවසේම සඟවාගෙන සිට ඇති බව ද පොලිස් ආරංචි මාර්ග කියයි.

නිවසේ තිබූ සියලු ලේ පැල්ලම් එදිනම සෝදා ඇති අතර සිද්ධිය වන අවස්ථාවේ එම නිවසේ සිට ඇත්තේ සැකකරු සහ සැකකාරිය පමණක් බව ද පොලිසිය පවසයි.

සැකකාරියගේ දරුවන් තිදෙනා සහ සැමියා පසුව නිවසට පැමිණ ඇති අතර සිද්ධිය සම්බන්ධයෙන් ඔවුන්ට සැකයක් නොහිතෙන ලෙස ඇය හැසිරී ඇතැයි ද කියති.

පසුදින (29) පෙරවරුවේ සැකකාරියගේ සැමියා රැකියාවට ගොස් ඇති අතර, දරු තිදෙනා මවගේ නිවසට යවා ඇති සැකකාරිය සිද්ධියේ ප්‍රධාන සැකකරු වන සොහොයුරා කැඳවාගෙන ඔහු ලවා කුඩා ලොරියක් ද ගෙන්වාගෙන ලොරි රථයේ රියැදුරුට සැකයක් ඇති නොවන පරිදි මළසිරුර දැමූ ගමන් බෑගයද, මෙට්ට ද, කැඩී තිබූ ශීතකරණයක් ද, කැඩුණු පුටුවක්ද ලොරියේ දමා වැල්ලම්පිටිය ප්‍රදේශයට රැගෙන ගොස් ඇත.

ලොරි රියදුරුට සැක නොසිතන ලෙස සැකකාරිය සහ ඇයගේ දියණියක් ලොරියේ ඉදිරිපස ගමන් ගෙන ඇති අතර, ප්‍රධාන සැකකරු තමා විසින්ම ත්‍රිරෝද රථයකින් පැමිණ ඇති බව පොලිස් ආරංචි මාර්ග පවසයි.

වැල්ලම්පිටිය ප්‍රදේශයේ ශීතකරණ අලුත්වැඩියා කරන ස්ථානයකට ශීතකරණය රැගෙන ගොස් ඇති අතර, ලොරියේ තිබූ මෙට්ටය, පුටුව සහ මළසිරුර සහිත ගමන් බෑගය සැකකරු විසින් ඔහු පදවාගෙන ආ ත්‍රිරෝද රථයට එහිදී පටවා ගෙන ඇති බවද පොලිසිය කියයි.

පසුව සැකකාරිය හා ඇයගේ දියණියද ලොරි රථයෙන්ම සමිට්පුර නිවස බලා ගොස් ඇත.

ප්‍රධාන සැකකරු පුටුව හා මෙට්ටය වෙනත් ස්ථානයක අතහැර මළසිරුර සහිත බෑගය පමණක් ත්‍රිරෝද රථයෙන් ගෙන ගොස් 29 වැනිදා දහවල් එම සිරුර සහිත ගමන් බෑගය සපුගස්කන්ද මාබිම පාරේ කැළි කසළ ගොඩට දමා ඇති බව ද පොලිස් ආරංචි මාර්ග සඳහන් කරයි.

අත්අඩංගුවට ගත් සැකකාරිය සහ ඇයගේ සැමියා 36 වැනි වියේ පසුවන බවත්, මෙම ඝාතනයට ඇයගේ සැමියාගේ යම් සහායක් ලැබී ඇතිද යන්න හෙළිකර ගැනීම සඳහා ඔහු අත්අඩංගුවට ගත් බවත් පොලිසිය කියයි.

මළසිරුර ගෙනගිය බව කියන කුඩා ලොරි රථය ද පොලිසිය බාරයට ගෙන ඇත.

සිද්ධියේ ප්‍රධාන සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා පොලිස් කණ්ඩායම් කිහිපයක්ම යොදා පරීක්ෂණ පවත්වන බව ද පොලිසිය පවසයි.

සැකකරු සහ සැකකාරිය මහර මහේස්ත්‍රාත් අධිකරණයට ඊයේ (7) ඉදිරිපත් කර පැය 48ක රැඳවුම් නියෝග ලබාගෙන රඳවාගෙන ප්‍රශ්න කරගෙන යන බව ද පොලිසිය කියයි.

බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ අධීක්ෂණය යටතේ, කැලණිය කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි රෝෂාන් ඩයස්, සහකාර පොලිස් අධිකාරි අර්ජුන මාහිංකන්ද යන මහත්වරුන්ගේ උපදෙස් මත, කැලණිය කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කීර්තිරත්න, පොලිස් පරීක්ෂක රුමේෂ් රත්නායක, උප පොලිස් පරීක්ෂක දෙහිදෙණිය යන මහත්වරුන් සහ සපුගස්කන්ද පොලිසියේ වැඩ බලන පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්ලිව්.කේ. විජේතිලක මහතාගේ මෙහෙයවීමෙන්, අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක එල්. අමරසේකර, සැරයන් (12011), පර්සිලාල් (51737), කොස්තාපල් (31805) චතුරංග යන නිලධාරීහු සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වති.

කැලණිය කොට්ඨාස අපරාධ ස්ථාන පරීක්ෂණ (සොකෝ) අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ආර්.වී. කහටපිටිය, පොලිස් පරීක්ෂක එස්.ඒ.එස්.ඩී. සේනාධීර, උප පොලිස් පරීක්ෂක ජයලත්, කොස්තාපල්වරුන් වන ප්‍රියදර්ශන (81342), පෙරේරා (84545) යන මහත්වරු එම ස්ථානයට ගොස් පරීක්ෂණ පැවැත්වූහ.

# කොවිඩ් කරල මෙරටට ගෙන්වීමට රජයේ දැඩි අවධානය

(සුජිත් හේවාජුලිගේ)



**කොවිඩ් මර්දනය සඳහා එන්නත වෙනුවට භාවිත කෙරෙන ප්‍රතිවයිරස කරල මෙරටට ගෙන්වීම සම්බන්ධයෙන් රජයේ සහ සෞඛ්‍ය බලධාරීන්ගේ ඉහළ අවධානය යොමුවී ඇත.**

මෙම ඖෂධ කරල නිපදවනු ලබන්නේ ඇමරිකාවේ මර්ක් ආයතනය විසිනි.

මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා පැවසුවේ මේ කාරණය සෞඛ්‍ය අමාත්‍යාංශයේ විද්වත් කමිටුවට යොමුකර ඇති බවයි.

මේ සම්බන්ධයෙන් එම කමිටුව නුදුරු දිනකදීම සිය නිර්දේශ ලබා දෙනු ඇතැයිද ඔහු සඳහන් කළේය. මේ සම්බන්ධයෙන් අදහස් පළ කළ ඖෂධ නිෂ්පාදන, සැපයුම් හා නියාමන රාජ්‍ය අමාත්‍ය මහාචාර්ය චන්න ජයසුමන මහතා පැවසුවේ මෙම කරල පිළිබඳව කඩිනමින් අවධානය යොමු කළ යුතු බවයි.

ලෝකයේ රටවල් ගණනාවක් මේ සඳහා ඇණවුම් ඉදිරිපත් කර ඇති බවත් ඇණවුම ඉක්මනින්ම බාර නොදුණහොත් ඖෂධය ලබා ගැනීම ප්‍රමාද විය හැකි බවත් මහාචාර්යවරයා සඳහන් කළේය.

# අලි සබ්‍රි මන්ත්‍රී - ඇමැති ධුර දෙකෙන් ඉල්ලා අස්වන ලිපි ජනපතිට බාරදෙයි

(සුජිත් හේවාජුලිගේ)

**එක රටක් එක නීතියක් ජනාධිපති කාර්යසාධක බළකායේ සභාපති ධුරයට ගලගොඩඅත්තේ ඥානසාර හිමියන් පත්කිරීමට විරුද්ධත්වය පළකරමින් අධිකරණ අමාත්‍ය ජනාධිපති නීතිඥ අලි සබ්‍රි මහතා සිය අමාත්‍ය ධුරයෙන් මෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වන බව දැනුම් දෙමින් ලිපි දෙකක් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට පෙරේදා (5) බාරදී ඇත.**

කෙසේ වෙතත් ජනාධිපතිවරයා අලි සබ්‍රි මහතාගේ එම ඉල්ලා අස්වීමේ ලිපි බාරගෙන නැතැයි රජයේ ආරංචි මාර්ගවලින් දැනගන්නට ඇත.

ජනාධිපතිවරයා හමුවුණු අලි සබ්‍රි මහතා නීති සකස් කිරීමට රටේ නිශ්චිත ක්‍රමවේදයක් පවතිද්දී මෙවැනි කාර්යසාධක බළකා මාර්ගයෙන් නීති සකස් කිරීමට යෑම අනවශ්‍ය ගැටලු මතු වන්නක් බව පෙන්වා දී තිබේ.

එම පත්කිරීම් සම්බන්ධයෙන් තමාගේ පැහැදීමක් නැතැයි ද අධිකරණ ඇමැතිවරයා එහිදී පවසා ඇතැයි දැනගන්නට ඇත.



එහිදී අදහස් දක්වා ඇති ජනාධිපතිවරයා පවසා ඇත්තේ මෙම ජනාධිපති කාර්යසාධක බළකාය පත් කළේ තමාට එම කාරණයට අදාළව උපදෙස් ගැනීමට විනා අන් දෙයකට නොවන බවයි.

එසේම නීති සකස් කිරීමේ කටයුතුවල දී අනිවාර්යයෙන්ම අධිකරණ ඇමැතිවරයාගේ දායකත්වය ලබාගන්නා බව ද ගෝඨාභය රාජපක්ෂ මහතා දැනුම් දී තිබේ.

අධිකරණ ඇමැති අලි සබ්‍රි මහතාගේ කාර්යසාධනය ජනාධිපතිවරයා මෙහිදී ඉහළින්ම අගය කර ඇතැයි ද වාර්තා වෙයි.

ඉහත පත්කිරීම සම්බන්ධයෙන් සමහරුන් තුළ පවතින්නේ වැරැදි අවබෝධයක් බව ද වහාම එය නිවැරැදි කිරීමට පියවර ගන්නා බව ද ජනාධිපතිවරයා මෙහිදී පවසා ඇතැයි දැනගන්නට ඇත.

# කොරෝනා රැල්ලක් යළි මතුවීමේ අවදානමක්: වැඩිවුණොත් සංචරණ සීමා

## සෞඛ්‍ය සේවා ප්‍රධානී කියයි

(සුජිත් හේවාජුලිගේ)

**කොරෝනා රැල්ලක් යළි මතුවීමේ අවදානමක් ඇතැයි සෞඛ්‍ය අංශ පවසයි.**

ආසාදිතයන් සංඛ්‍යාව වැඩි වුවහොත් සංචරණ සීමා යළි පැනවීමට සිදුවනු ඇති බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා පැවැසීය.

ජනතාව වගකීමකින් තොරව හැසිරෙන්නේ නම් අකැමැත්තෙන් වුවත් සංචරණ සීමා නැවත පැනවීමට සිදුවන බව පැවසූ අධ්‍යක්ෂ ජනරාල්වරයා රෝගය පැතිරෙන ආකාරයට පැවැත්වුණු උත්සව, සාද, මංගල කිහිපයක් පසුගිය දිනවල වාර්තා වූ බව ද සඳහන් කළේය.



කොවිඩ් පැතිරීම පාලනයවීමත් සමඟ රටපුරා සංචරණ සීමා මෑතක දී ඉවත් කෙරිණි.

මේ අතර පෙරේදා (06) අඛණ්ඩව දෙවැනි දිනටත් කොවිඩ් 19 ආසාදිතයන් 600 සීමාව ඉක්මවා ගොස් ඇත. වාර්තා වූ ආසාදිතයන් ගණන 617 කි.

දින 20 කට පසුව මෙරට දෛනික කොවිඩ් 19 ආසාදිතයන් සංඛ්‍යාව ඉකුත් 05 වැනිදා ද 600 සීමාව ඉක්මවා ගිය බව සෞඛ්‍ය අංශ පවසයි.

# පරිපූරක - අතුරු වෛද්‍ය සේවා සමිති 15 ක පිරිස් හෙට සංකේත වර්ජනයක

(රංජන් කස්තුරි)

**පරිපූරක සහ අතුරු වෛද්‍ය සේවාවන්ට අයත් සෞඛ්‍ය වෘත්තීය සමිති 15ක සාමාජික සාමාජිකාවෝ හෙට (9) සංකේත වැඩ වර්ජනයක නිරත වෙති.**

වෛද්‍ය රසායනාගාර විද්‍යාඥ, හෙද, ඖෂධවේදීන් අක්ෂි තාක්ෂණවේදීන්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ඇතුළු සෞඛ්‍ය වෘත්තීය 15ක් නියෝජනයෙන් එම සංකේත වැඩවර්ජනය ක්‍රියාත්මක කරන බව පරිපූරක වෛද්‍ය සේවා ඒකාබද්ධ බලමණ්ඩලයේ සභාපති රවි කුමුදේශ් මහතා පැවසීය.

එම වැඩවර්ජනය හෙට (9) පෙරවරු 8ට ආරම්භ කර පසු දින (10) පෙරවරු 8ට අවසන් කරන බව ද කුමුදේශ් මහතා කීය.

වැටුප් විසමතා ඉවත් නොකිරීම, වෘත්තීයවේ දී උපාධියට හිමි තනතුරුවල නොපිහිටුවීම, සෞඛ්‍ය පරිපාලන සේවයක් නොපිහිටුවීම, මාණ්ඩලික හිමිකම් තහවුරු නොකිරීම ඇතුළු කරුණු මුල්කර ගනිමින් එම වර්ජනය ක්‍රියාත්මක කරන බව ද හෙතෙම සඳහන් කළේය.

වසර හතරක විශේෂවේ දී උපාධියක් ලැබූ සෞඛ්‍ය වෘත්තීයවේදීන් මේ වනවිට ඩිප්ලෝමාධාරීන්ගේ වැටුපකට හිරකර තිබෙන බව ද රවි කුමුදේශ මහතා කීවේය.

# සංවර්ධන නිලධාරීහු අද ලෙඩවෙති

(රංජන් කස්තුරි)

**රටපුරා සේවය කරන සංවර්ධන නිලධාරීන් පිරිසක් අද (8) අසනීප නිවාඩු වාර්තා කිරීමේ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක නිරත වෙති.**

රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් ලක්ෂයකට අධික පිරිසක් සිටින අතර ඔවුන් අද මෙම වෘත්තීය සමිති ක්‍රියා මාර්ගයට එක්වන බව සංවර්ධන නිලධාරී සේවා සංගමයේ ප්‍රධාන ලේකම් චන්දන සූරියආරච්චි මහතා කීය.

වැටුප් විසමතා ඉවත්කිරීම, උසස්වීම් පටිපාටියක් ක්‍රියාත්මක කිරීම, පිළිගත හැකි රාජකාරී ලැයිස්තුවක් ලබාදීම, අත්හිටුවා ඇති විශ්‍රාම වැටුප් හිමිකම යළි ලබාදීම ඇතුළු ඉල්ලීම් ගණනාවක් මුල්කර ගනිමින් එම වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයේ නිරත වන බව ද ඔහු පැවසීය.

සංවර්ධන නිලධාරීන්ගේ වෘත්තීය ගැටලුවලට විසඳුම් ලබාදෙන ලෙස ඉල්ලමින් අද පෙරවරුවේ ජනාධිපතිවරයාට සහ මුදල් ඇමැතිවරයාට සංදේශයක් බාරදෙන බවද චන්දන සූරියආරච්චි මහතා පැවසීය.

# මැතිසබේ අද සිට දින 33 ක්

(සුජිත් හේවාජුලිගේ සහ අංජුල මහික වීරරත්න)

**පාර්ලිමේන්තුව අද (8) සිට දින තිස්තුනක් සෞඛ්‍ය නීතිවලට අනුකූලව එක දිගටම රැස්වීමට තීරණය කර ඇත.**

පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ කල් ගිය ප්‍රශ්න 50කට අදාළ ඇමැතිවරුන් අද (8) පිළිතුරු දීමට නියමිතය.

පාර්ලිමේන්තුව අද (8) පෙරවරු 10.00ට රැස්වීමට නියමිතය.


අයවැය විවාදය ලබන 12 වැනිදා පැවැත්වීමට නියමිතය. එදිනෙන් පසු අයවැය විවාද ලබන මස 10 වැනිදා දක්වා පැවැත්වෙන අතර අයවැය පිළිබඳ අවසාන ඡන්ද විමසීම එදින පස්වරුවේ පැවැත්වේ.

මේ අතර, පාර්ලිමේන්තු රැස්වීම් සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුකූලව පවත්වන ලෙස සෞඛ්‍ය අංශ ප්‍රධානීන් පාර්ලිමේන්තු ප්‍රධානීන්ට උපදෙස් දී ඇත.

ඒ අනුව පාර්ලිමේන්තුව සඳහා විශේෂ සෞඛ්‍ය ආරක්ෂක වැඩපිළිවෙළක් සකස් කරන බව වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා පැවසීය.

පාර්ලිමේන්තුවට පැමිණෙන නිලධාරීන් ඇතුළු රජයේ පිරිස් කොවිඩ් පරීක්ෂණවලට ලක් කිරීමට ද මේ අනුව පියවර ගැනෙනු ඇත.

# සිමෙන්ති රු. 1,275 ට නගී




(යොහාන් භාසුර)

**පාලන මිල ඉවත් කිරීමෙන් පසුව සිමෙන්ති නිෂ්පාදකයන් සිමෙන්ති කොට්ටයක මිල රුපියල් 1,275ක් දක්වා ඉහළ දමා ඇත.**

ඒ අනුව පාලන මිල ඉවත් කිරීමෙන් පසුව සිමෙන්ති කොට්ටයක මිල රුපියල් 270කින් ඉහළ ගොස් තිබේ.

මේ අතර ඇතැම් සිමෙන්ති සමාගම් සිමෙන්ති කොට්ටයක මිල රුපියල් 1,375ක් දක්වා ඉහළ දමා ඇත.

පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න මහතාගෙන් විමසීමක දී ඔහු පැවසුවේ රුපියල් 1,375 දක්වා ඉහළ දමා ඇති සිමෙන්ති සමාගම් එම මිල රුපියල් 100කින් අඩු කිරීමට පොරොන්දු වූ බවයි.

පාලන මිල ඉවත් කරන විට, සිමෙන්ති කොට්ටයක මිල රුපියල් 1005ක් ලෙස පැවැති අතර ඉන් පසුව රුපියල් 93කින් ඉහළ නැංවීමත් සමග සිමෙන්ති කොට්ටයක් රුපියල් 1098ක් බවට පත්විය.

## තරුණයන් පත්කළාට:

# එජාප කෘත්‍යාධිකාරී රැස්වීම උණුසුම් වෙයි

(අංජුල මහික වීරරත්න)

**එක්සත් ජාතික පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලයට තරුණ සාමාජිකයන් තිදෙනකු පත් කිරීම මුල් කර ගනිමින් සිකුරාද (6) සවස පැවැති එජාප කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීම උණුසුම් ස්වභාවයක් ගත් බව පක්ෂ අභ්‍යන්තර ආරංචි මාර්ග සඳහන් කරයි.**

එක්සත් ජාතික පක්ෂ නායක සහ හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පිටකෝට්ටේ - සිරිකොත එක්සත් ජාතික පක්ෂ මූලස්ථානයේ දී සිකුරාද සවස කෘත්‍යාධිකාරී මණ්ඩලය රැස්විණ.

එක්සත් ජාතික පක්ෂ ජාතික යොවුන් පෙරමුණ ග්‍රාමීය මට්ටමින් ගොඩනැගීම සඳහා ක්‍රියාකාරීව වැඩ කළ ගමේ තරුණයන් විශාල පිරිසක් සිටියදී කොළඹ සිට කටයුතු කළ තරුණයන් තිදෙනකුට පමණක් කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අවස්ථාව දීම අසාධාරණ බව කෘත්‍යාධිකාරී මණ්ඩල සභික කස්තුරි අනුරාධනායක මහතා එහිදී සඳහන් කර ඇත.

මෙහිදී එජාප නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතා සඳහන් කර ඇත්තේ පක්ෂය ගොඩනැගීම වෙනුවෙන් ක්‍රියාකාරීව වැඩ කළ තරුණ නායකයන් හැත්තෑවකට අධික පිරිසක් දැනට හඳුනා ගෙන සිටින බවත්, ඔවුන්ට සුදුසු වගකීම් පැවරීම වෙනුවෙන් කඩිනම් සාකච්ඡාවක් අවශ්‍ය බවත්ය.

රට දරුණු ව්‍යසනයකට මුහුණ දී සිටින මේ අවස්ථාවේදී කළ යුතුව ඇත්තේ සියලු දෙනා එක්ව බලය ගෙන රට ගොඩනැගීම වෙනුවෙන් කටයුතු කිරීම යැයි ද, පක්ෂයට තමා ගැන විශ්වාසයක් නැති නම් ඕනෑම මොහොතක නියෝජ්‍ය නායක ධුරයෙන් ඉවත්වීමට සූදානම් යැයි ද රුවන් විජයවර්ධන මහතා මෙහිදී සඳහන් කර තිබේ.

තමා කිසිවිටෙක පක්ෂයට හෝ නායකයාට හෝ විරුද්ධව කටයුතු නොකරන බව ද නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතා මෙහිදී අවධාරණය කර ඇත.

මෙහිදී අදහස් දක්වමින් එක්සත් ජාතික පක්ෂ මහලේකම් පාලිත රංගෙ බණ්ඩාර මහතා පැවැසුයේ සැමට වගකීම් බෙදා දී තිබෙන අතර සියලු දෙනා තමන්ගේ වගකීම හරියට කරනවා නම් ප්‍රශ්නයක් ඇති නොවන බවය.

ආණ්ඩුව මෙන්ම විපක්ෂයත් අද ජනතාව අතරින් දුරස් වී තිබෙන බව කී එජාප මහ ලේකම්වරයා, තනතුරු සටන අතහැර පක්ෂය සංවිධානය කර රට ගොඩනගන සටන ආරම්භ කළ යුතු බව සඳහන් කළේය.

සියලු අදහස්වලට සාවධානව ඇහුම්කන් දුන් පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා කීවේ නැවත වතාවක් පක්ෂයේ කල්ලි හදන්න කිසිවකුත් උත්සාහ නොකළ යුතු බවය.

ඕනෑම ප්‍රශ්නයක් තිබේ නම් එය තමා සමග සාකච්ඡා කරන්නැයි ද, එසේ නැතිව කෘත්‍යාධිකාරී මණ්ඩලයේ ප්‍රශ්න ඇති කළ යුතු නැතැයි ද, ආසන සංවිධායක ධුර ආදී ප්‍රශ්න කතා කර විසඳ ගැනීමට හැකි හෙයින් බෙදීම් ඇති කරන්න එපා යැයි ද පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා මෙහිදී කස්තුරි අනුරාධනායක මහතාගේ අදහස්වලට ප්‍රතිචාර ලෙස කීවේය.

එක රටක් - එක නීතියක් සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකාය රටේ එකමුතුකමට හානියක් වන හෙයින් වහාම එය අහෝසි කරන ලෙසට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගෙන් ඉල්ලා සිටීමට ද එජාප කෘත්‍යාධිකාරී මණ්ඩලය තීරණය කළේය.

වැසි වනාන්තර විනාශය හා ඉඩම් බාදනය වැළැක්වීම සඳහා පියවර ගත යුතු බවට COP 26 ලෝක නායක සමුළුවේ අවධානය යොමු කර තිබෙන බැවින් ශ්‍රී ලංකාව ද ඒ සඳහා පෙළගැස්විය යුතු බවට නායක රනිල් වික්‍රමසිංහ මහතා කෘත්‍යාධිකාරී මණ්ඩලයට ඉදිරිපත් කළ යෝජනාවට ද කෘත්‍යාධිකාරී මණ්ඩලයේ ඒකමතික අනුමැතිය පළ විණ.

# දුම්රිය ගමන් අද සිට සාමාන්‍ය ක්‍රමයට

(යොහාන් භාසුර)



**දුම්රිය ධාවනය සාමාන්‍ය කාලසටහනට අනුව අද (8) සිට ක්‍රියාත්මක වන බව ශ්‍රී ලංකා දුම්රිය ස්ථානාධිපති සංගමයේ ප්‍රධාන ලේකම් කසුන් චාමර මහතා පැවසීය.**

රටේ පැවැති 'කොවිඩ්' වසංගත තත්වය හමුවේ සාමාන්‍ය දුම්රිය කාලසටහන පසුගිය වසරේ (2020) මාර්තු මාසයෙන් පසුව මාස 20කට අධික කාලයක් ක්‍රියාත්මක නොවූ බවත් සාමාන්‍ය දුම්රිය ධාවන කාලසටහන අද සිට ක්‍රියාත්මක කරන බවත් ඔහු සඳහන් කළේය.

පාර්සල් ප්‍රවාහනය සහ දුම්රිය ස්ථානවල විවේක කාමර වෙන් කිරීම යන කටයුතු ද අද සිට සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක වන බව ඔහු සඳහන් කළේය.

සාමාන්‍ය දුම්රිය කාලසටහන අද සිට ක්‍රියාත්මක කළ ද දුර ගමන් සේවා දුම්රිය කිහිපයක් පමණක් ක්‍රියාත්මක කරන බවත් ගාල්ල සිට මරදාන රාත්‍රී තැපැල් දුම්රිය හැර සෙසු සියලුම තැපැල් දුම්රිය තවදුරටත් ක්‍රියාත්මක නොවන බවත් කසුන් චාමර මහතා කීය.

# සා.පෙළ - උ.පෙළ පන්ති යළි අද සිට

(ඩයනා උදයංගනී)

**කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් දිගු කලක් වසා දමා තිබූ පාසල් යළි ආරම්භ කිරීමේ කාර්යයේ දෙවැනි අදියර ලෙස දිවයිනේ සියලු පාසල්වල සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ පන්ති අද (8 වැනිදා) සිට ආරම්භ වන බව අධ්‍යාපන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා පැවැසීය.**

දිවයිනේ සියලුම පාසල්වල 10, 11, 12 සහ 13 ශ්‍රේණිවල අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට කොවිඩ් මර්දන කමිටු නිර්දේශ ලැබී ඇති බවත්, ඒ අනුව මෙම පියවර ගත් බවත් ඇමැතිවරයා සඳහන් කළේය.

සියලුම පාසල්වල ඉහළ පන්තිවල සිසුන්ට එන්නත් දීම හමාර කර ඇතැයි කී ඇමැතිවරයා, ඒ අනුව රටේ පාසල්වල විශාල ප්‍රමාණයක දරුවන්ට ඉක්මනින් පාසල් ජීවිතය ආරම්භ කරන්නට හැකි වනු ඇතැයි ද සඳහන් කළේය.

ප්‍රාථමික ශ්‍රේණිවල දරුවන්ගේ පාසල් අධ්‍යාපන කටයුතු ද මේ වන විට ආරම්භ කර ඇති නිසා, 6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල අධ්‍යාපන කටයුතු ද ඉතා ඉක්මනින් ආරම්භ කරන්නට සැලසුම් කර ඇතැයි ඇමැතිවරයා කීවේය.

අ.පො.ස. උසස් පෙළ, සාමාන්‍ය පෙළ හා 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයන් පැවැත්වෙන දින මේ වන විට ප්‍රකාශයට පත්කර ඇති බැවින්, ඒ වෙනුවෙන් දරුවන් සූදානම් කිරීම මේ වන විට සිදුවන බව ද ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා පැවැසීය.

දරුවන්ගේ අධ්‍යාපනය සාර්ථක කිරීම වෙනුවෙන් රජයක් ලෙස කැප වී කටයුතු කරන බව කී ඇමැතිවරයා, ජාතික වගකීමක් ඉටුකරන ගුරුවරුන් ද ඒ වෙනුවෙන් පාසල්වලට පැමිණෙනු ඇතැයි විශ්වාස කරන බව කීවේය.

ඇතැම් ප්‍රදේශවල කඩින් කඩ වාර්තා වන කොරෝනා ව්‍යාප්තිය සම්බන්ධයෙන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ලබාදෙන තොරතුරු අනුව අවශ්‍ය පියවර ගනිමින් පාසල් පවත්වාගෙන යන බව ද ඇමැතිවරයා පැවැසීය.

# අධිකරණයේ ලොකු පුටුවක සිටින සැමියාගෙන් මටත් දරු තිදෙනාටත් හිරිහැර

## බිරිඳ පොලිසියෙන් පිහිට පතයි

(ශ්‍රීනාත් ප්‍රසන්න ජයසූරිය)

**අධිකරණ ක්ෂේත්‍රයේ ඉහළ තනතුරක් හොබවන තම සැමියා තමාට සහ දරු තිදෙනාට හිංසා කරන්නේ යැයි කියමින් ඔහුගේ බිරිය කොළඹ ප්‍රදේශයේ පොලිසියකට පැමිණිල්ලක් කර ඇතැයි ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙක් ලංකාදීපයට පැවසීය.**

මෙම පැමිණිල්ල කර ඇත්තේ පසුගිය 04 වැනිදය.

සැමියාගේ නමද සඳහන් කරමින් බිරිය කළ පැමිණිල්ලට අනුව සැමියා තමාට සහ දරුවන් තිදෙනාට පහර දී කරදර හිරිහැර කරන බව සඳහන් කර ඇති බව එම ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියා කීය.

තමාට හා දරු තිදෙනාට පහර දී කරදර, හිරිහැර කිරීම නිසා දරුවන්ගේ ද ජීවිත ආරක්ෂාව පිණිස තම සැමියාට එරෙහිව ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය යටතේ නඩුවක් පැවරීමට කටයුතු කරන ලෙස ඇය පොලිසියෙන් ඉල්ලීමක් කරමින් මෙම පැමිණිල්ල කර ඇතැයි ද පොලිස් ආරංචි මාර්ග කියයි. පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශනයක් කරන බවද පොලිසිය කීය.

# මිතුරු පියස කාටද? කුමටද?

**කාන්තාවන් මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් සහනය සලසන "මිතුරු පියස" සම්බන්ධයෙන් දැනුවත් කෙරෙන ලිපියකි මේ.**



**ප්‍රශ්නය:- මිතුරු පියස යනු කුමක්ද? එහි ආරම්භය සහ මෙම ආයතනය පිටුපස ඇති අරමුණු මොනවාද?**

**පිළිතුර:-** මිතුරු පියස කියන්නේ හිංසනයෙන් පීඩා විඳින කාන්තාවන්ට සහනය සලසන මධ්‍යස්ථානයක්. මෙය පිහිටුවා තියෙන්නේ රජයේ රෝහල්වල. ඉදිරියේදී පෞද්ගලික රෝහල් දක්වා මේ සේවය ව්‍යාප්ත කරන්න අපිට හැකියාව ලැබෙයි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ආශ්‍රිත හිංසනයෙන් පීඩා විඳින කාන්තාවන් සඳහා මධ්‍යස්ථාන වෙනත් රටවල තියෙනවා. ඒහා සමගාමීව යන නමුත් මිතුරු පියස අපේ රටට ආවේනික ක්‍රමවේදයකටයි ක්‍රියාත්මක වෙන්නේ. දෙදහස් හත වසරේ නියාමන වැඩසටහනක් විදිහට මෙය අපි මාතර මහ රෝහලේ ආරම්භ කළා. එහිදී ලබපු ධනාත්මක අත්දැකීම් පදනම් කරගෙන රට පුරා මෙය ව්‍යාප්ත කළා. හිංසනය කියන්නේ බහුපාර්ශවීය මැදිහත්වීමක් අවශ්‍ය ප්‍රශ්නයක්. එහිදී සෞඛ්‍ය අංශයේ මැදිහත්වීම කරන්නේ අපි. ඒ වගකීම අරගෙන තියෙන්නේ පවුල් සෞඛ්‍ය කාර්යාංශය.

**ප්‍රශ්නය:- මිතුරු පියසේ සංවිධාන ශක්තිය සහ එය ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කළොත්?**

**පිළිතුර:-** මගේ ආයතනය පවුල් සෞඛ්‍ය කාර්යාංශය. මෙය සෞඛ්‍ය අමාත්‍යංශයේ කාන්තා හා ළමා සෞඛ්‍ය පිළිබඳ කේන්ද්‍රස්ථානය. මිතුරු පියස ආරම්භ කිරීමේ සහ පවත්වාගෙන යෑමේ ජාතික මට්ටමේ වගකීම තිබෙන්නේ අපට. රෝහලක් තුළ මිතුරු පියසක් පවත්වාගෙන යෑම ලේසි නැහැ. මොකද රෝහලක් තුළ ප්‍රමුඛත්වය ලබාදෙන්නේ රෝග ප්‍රතිකාර, සත්කාර අංශයට. සාමාන්‍යයෙන් සෑම මිතුරු පියසකම වෛද්‍යවරයෙක් සිටිනවා. ඒ වගේම හෙද නිලධාරිනියක් සිටිනවා. අපේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයම තමයි මෙතනත් සේවය සපයන්නේ.

අපෙන් වෙන සේවාව තමයි මිතුරු පියසට එන කෙනෙක්ගේ දුක්ගැනවිල්ල සාවධානව අසා සිටීම. මෙතනට එන අයගේ ප්‍රශ්න වෙන කාටවත් කියන්න පුළුවන් දේවල් නෙමෙයි. අපේ සංස්කෘතිය සහ සමාජ ක්‍රමය තුළ තමන්ගේ පවුල තුළ සිදුවන ගැටලු පිටතට දැනගැනීමට ලැබීම ලජ්ජාවට කාරණයක්. එහෙත් මේ ගැන කියන්නේ නැතුව හිත ඇතුළේ තියාගෙන ඉන්න එක ගැටලුවක්. ඒ නිසා අපි කරන්නේ සක්‍රියව ඊට සවන්දීම." දුක බෙදාගන්න බෙදාගන්න දුක තුනීවෙනවා" කියල අපි කියන්නේ ඒකට තමයි. ඔවුන් අප ළඟට එන්නෙ ඉතාමත් අසරණ වෙලා, තමන් තුළ තිබෙන ශක්තීන් තමන්ටම නොපෙනෙන තත්ත්වයක ඉන්න වෙලාවක. මෙතැනදී අපි කරන්නේ ඔවුන්ගේ දුක තුනී කරගන්න උදව්වෙන අතරම ඔවුන් තුළ තිබෙන ශක්තීන් මතුකර ගන්නත් සහාය වෙන එක. ඒ කියන්නෙ ඔවුන්ව බලගන්වනවා. එය ඔවුන්ගේ ජීවිත පිළිබඳව ඔවුන්ට තීරණ ගැනීමට ඉවහල් වෙනවා. ඒ සඳහා සහායවීම අපේ වගකීමක්.

ඊට පස්සේ එම තැනැත්තියට රෝහල තුළම පවතින වෙනත් සේවා අවශ්‍ය වෙන්න පුළුවන්. ඒ වගේ සේවා අවශ්‍ය නම්, අපි එම ඒකකවලටත් යොමුකරනවා. ඒ වගේම රෝහලෙන් පිටතත් මෙම තත්ත්වයන්ට සේවා සපයන්නන් ඉන්නවා. කාන්තා කාර්යාංශය, නීති ආධාර කොමිෂන් සභාව, උපදේශන සේවා වගේ වෙනත් සේවා සපයන කණ්ඩායම් සමග අපේ කණ්ඩායම ජාලගතවෙලා ඉන්නවා. ඒ අනුව එවැනි බාහිර සේවාවක් අවශ්‍ය නම් ඒවාටත් යොමුකරනවා.

**ප්‍රශ්නය:- සේවාලාභීන් මිතුරු පියසට පැමිණෙන්නේ කෙසේද?**

**පිළිතුර:-** ඕනෑම කෙනකුට මෙතනට එන්න පුළුවන්. කිසිම විධිමත් යොමුකිරීමක් අවශ්‍ය වෙන්නේ නැහැ. මෙම ආයතනය ගැන දැනුවත් වූ පමණින්ම මිතුරු පියසට එන්න පුළුවන්. ඒ වගේම රෝහලේ බාහිර රෝගී අංශයෙන්, සායනවලින්, වාට්ටුවලින් අපේ සේවය අවශ්‍ය අය මෙතනට යොමුකරනවා. පොලිසිය, උසාවිය, නීති ආධාර කොමිෂන් සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වගේ ආයතන වලිනුත් අපිට සේවාලාභීන් යොමුකරනවා. දැනට ලංකාව පුරා රෝහල් හැත්තෑ නවයක (79) මිතුරු පියස මධ්‍යස්ථාන ක්‍රියාත්මක වෙනවා. විශේෂඥ වෛද්‍ය සේවාව පවතින සෑම රෝහලකම මිතුරු පියසක් ආරම්භ කිරීම තමයි අපේ අවසාන ඉලක්කය. එවැනි රෝහල් එකසිය දහයක් විතර ලංකාව පුරා තිබෙනවා. ඉදිරි වසර කිහිපය තුළ අපේ ඉලක්කය සපුරාගන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා.

**ප්‍රශ්නය:- මෙම වසංගත කාලය තුළ කාන්තා ගෘහස්ථ හිංසන සිද්ධි පිළිබඳව ඔබ දකින්නේ කෙසේද?**

**පිළිතුර:-** වසංගත කාලය තුළ එවැනි ඉහළ යෑමක් පවත්නවාද යන්න සොයාබැලීමට සියලුම සේවා සපයන ආයතන වලින් තොරතුරු අරගෙන සමීක්ෂණයක් සිදුකර තිබෙනවා. එහත් හිංසනයේ පැහැදිලි වැඩිවීමක් එයින් වාර්තා වෙලා නැහැ. කොහොම වුණත් වසංගතය මර්දනය කිරීමට ගත් ඇතැම් ක්‍රියාමාර්ග හේතුවෙන් වසංගත කාලය තුළ සියලුදෙනාම ගෙවල්වලට කොටුවුණා. එහිදී බොහෝ පවුල් සිය බැඳීම් වර්ධනය කරගන්න එම තත්ත්වය ධනාත්මක ලෙස පාවිච්චි කරලා තියෙනවා. එහෙත් හිංසනය පැවති පවුල්වල හිංසකයා සහ හිංසාවට ලක්වූ කෙනා ඒකට කොටුවුණා. ඒ වගේ තැන්වල හිංසනය වැඩිවුණා. සමහර අයට මෙම වසංගත තත්ත්වය මානසික ආතතියක් ඇතිකරන තත්ත්වයක් දක්වා වර්ධනය වුණා. ඒ නිසා හිංසනය නොතිබුණු ඇතැම් ස්ථානවලත් හිංසනය ඇතිවුණා.

**ප්‍රශ්නය:- කාන්තාවන්ට මානසික සෞඛ්‍යය, වඩා වැදගත් වන්නේ ඇයි?**

**පිළිතුර:-** කාන්තාවන්ට මානසික සෞඛ්‍යය පමණක් නෙමෙයි, ඇයගේ කායික, ලිංගික ඇතුළු සමස්ත සෞඛ්‍ය තත්ත්වය සමාජයටම ඉතා වැදගත්. පවුලක අම්මාගේ සෞඛ්‍ය අයහපත් නම්, දරුවන්ගේ සෞඛ්‍යය යහපත් වෙයි කියල අපිට බලාපොරොත්තු වෙන්න බැහැ. සමස්ත පවුලේ සෞඛ්‍යයටම ඒක බලපානවා. එහෙත් කාන්තාව සතුටින් නම්, ඇයගේ සෞඛ්‍යය යහපත් නම්, ඒක අනිවාර්යයෙන්ම පවුලේ යහපැවැත්ම සඳහා ධනාත්මකව බලපානවා. ඒ නිසා අපි ඒ ගැන වඩාත් සැලකිලිමත් විය යුතුයි. ඒත් කනගාටුවට කරුණ වන්නේ අපේ සමාජ ක්‍රමය තුළ කාන්තාව තමන්ගේ සෞඛ්‍යය පිළිබඳව අවසානයටම සලකා බැලීමයි. ඔවුන්ට මුලින්ම වැදගත් වන්නේ සැමියා සහ දරුවන්. ඒ නිසා තමන්ගේ සෞඛ්‍යය ගැන එතරම් සලකන්නේ නැහැ.

**ප්‍රශ්නය:- එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) විසින් මෑතකදී කරන ලද අධ්‍යයනයෙන් කාන්තා ගෘහස්ථ හිංසනයට ලක්වන කණ්ඩායම් පිළිබඳව හෙළිකර තිබෙනවා. එහෙත් එහිදී අනාවරණය නොවූ කොටස්ද සිටිනවා. ඔබ ඔවුන්ට ලබාදෙන පණිවිඩය කුමක්ද?**

**පිළිතුර:-** මනුෂ්‍යයෝ විදිහට අපි කවුරුවත් හිංසනයට ලක්විය යුතු නැහැ. තවත් කෙනෙක් අතින් හිංසනයට ලක්නොවී සිටීමට සෑම අයකුටම අයිතියක් තියෙනවා. යම් කෙනෙක් හිංසනයෙන් පීඩා විඳිනවා නම්, ඔවුන් දැනගත යුතුයි තමන්ට උදව් කරන්න පිරිසක් ඉන්නවා කියලා. තමන් මුහුණ දෙන පීඩාව ගැන ඔවුන්ට කියන්න ඕනේ. ඒකෙන් අපිට යම්කිසි සහනයක් ලබාගන්න පුළුවන්. මිතුරු පියස විශේෂයන්ම ආරම්භ කරලා තියෙන්නේ ඒ වෙනුවෙන්. දිවයින පුරා රජයේ ප්‍රධාන රෝහල් 79ක 'මිතුරු පියස' ක්‍රියාත්මකයි.

**ප්‍රශ්නය:- මිතුරු පියසින් නව දුරකථන අංකයක් (Hot Line) හඳුන්වාදීමට පියවර ගෙන තිබෙනවා. එම සේවාව ක්‍රියාත්මක වන්නේ කෙසේද?**

**පිළිතුර:-** සංචරණ සීමා පවතින අවස්ථාවල අපගේ සේවාව අවශ්‍ය පිරිස් ඉන්න නමුත් ඔවුන්ට අප කරා එන්න අපහසුයි කියලා මේ වසංගත කාලය තුළ අපිට වැටහුණා. එහිදී අපගේ සේවාව තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා තමයි එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ ප්‍රතිපාදන මගින් මේ නව දුරකථන අංකය ලැබුණේ. අපේ නව දුරකථන අංකය තමයි 0702611111. මිතුරු පියස ආරම්භයේ සිට මේ දක්වා ගතවූ කාලය පුරාවටම එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල අපට අඛණ්ඩව උපකාර කරලා තියෙනවා. මෙම දුරකථන සේවාව ඔස්සේ අපේ සේවය තවදුරටත් අවශ්‍ය අය කරා විහිදුවන්න හැකිවෙයි කියල අපි අපේක්ෂා කරනවා. මේ නව දුරකථන උපකාරක සේවාව ක්‍රියාත්මක කරන්නෙත් අපේ මිතුරු පියස කාර්ය මණ්ඩලය විසින්මයි. ඒ හරහා උපකාර අවශ්‍ය පුද්ගලයන් මිතුරු පියස මධ්‍යස්ථානවලට යොමු කෙරෙනවා.



මිතුරු පියස පිළිබඳව, සෞඛ්‍ය අමාත්‍යංශයේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ කාන්තා සෞඛ්‍ය වැඩසටහනේ, ජාතික වැඩසටහන් කළමනාකාර, උපදේශක ප්‍රජා වෛද්‍ය
**නෙත්තාංජලී මාපිටිගම**

---

ලංකාදීප **සුව+ සෙවණ**

# ඉන්නන් වයිරස් ආසාදනයක්



තිස්සමහාරාම මූලික රෝහලේ චර්ම රෝග අංශයේ වැඩබලන විශේෂඥ වෛද්‍ය
**නදී මාරකපුගේ**









**මිනිස් සිරුරේ ඇති විශාලතම ඉන්ද්‍රිය ලෙස සැලකෙනුයේ සමයි. වැඩුණු මිනිසකුගේ සම කිලෝග්‍රෑම් 4.5ක් පමණ ස්කන්ධයකින් යුත් අතර එහි ඝනකම මිලි මීටර් එකත් දෙකත් අතර වේ. සංවේදී අවයවයක් මෙන්ම ආරක්ෂක ආවරණයක් ලෙසින් ද ක්‍රියා කරන සම රැක ගැනීමෙන් පුද්ගලයකුගේ බාහිර පෙනුම මෙන්ම නිරෝගීතාව ද වර්ධනය කර ගත හැකිය.**

සම අපිරිසුදු වීමෙන් වයිරස්, බැක්ටීරියා, දිලීර වැනි ක්ෂුද්‍ර ජීවීන් මඟින් සම ආසාදනය වී විවිධ චර්ම රෝග ඇති වීම පවා සිදුවේ. එබඳු රෝගී තත්ත්වයක් වන ඉන්නන් ගැන අද වැඩිදුර තොරතුරු දැන ගනිමු.

**ඉන්නන්ගේ හට ගැනීම**

වයිරස් ආසාදනයක් නිසා සමෙහි ඇති වන රෝගී තත්ත්වයකි. සාමාන්‍ය ව්‍යවහාරයට අනුව සමෙහි හට ගැනෙන ඕනෑම කලු පැහැති කුඩා ඝන වීමක්, අධිවර්ධන තත්ත්වයක් ඉන්නන් වශයෙන් හැඳින්වීම නිවැරැදි නොවේ. වෛද්‍ය විද්‍යාවේ දී එබඳු ගැටිති ඉන්නන් ලෙස පිළි නොගැනේ. 'Human papilloma Virus ' හෙවත් HPV වයිරසය නිසා සමේ ඉන්නන් හට ගැනේ. මෙම HPV වයිරසය මඟින් අපිචර්මීය සෛල ආසාදනය වීම නිසා ඉන්නන් තත්ත්වය ඇති වේ.

**DPN සහ ඉන්නන්**

චර්ම රෝග සායනවල දී රෝගීන් බොහොමයක්ම ඉන්නන් වශයෙන් හඳුන්වන්නේ මුහුණේ හෝ බෙල්ලේ හට ගැනුණු කලු හෝ දුඹුරු පැහැති සමෙහි ඇති වන නෙරීමක්, ලපයක් හෝ ගැටිත්තකි. එහෙත් ඒත් මේ තත්ත්වයHPN වයිරසය ආසාදනයෙන් හට ගැනුණු ඉන්නන් රෝගය නොවේ. අප මෙය හඳුන්වන්නේ DPN තත්ත්වය යනුවෙනි. ඉන්නන් සහ DPN යනු පැහැදිලිවම රෝගී තත්ත්ව දෙකකි.

DPN තත්ත්වය ඇති වීමට අධිකව ඉර අව්වට නිරාවරණය වීම, වයස්ගත වීම, ස්ථූලතාව, අධික සීනි සහ පිෂ්ඨය සහිත ආහාර අනුභවය, ජානගත නැඹුරුතාව වැනි හේතු ද බලපෑ හැකිය. තවද DPN තත්ත්වය කෙනකුගෙන් තවත් කෙනකුට සම්ප්‍රේෂණය නොවන අතර නැවත නැවතත් සිරුරේ වර්ධනය විය හැකිය. තවද කාන්තාවන් බොහොමයක් දෙනා රූපලාවන්‍යාගාරවලට ගොස් ඉවත් කර ගනු ලබන්නේද DPN තත්ත්වය නිසා සමෙහි හට ගත් ගැටිති විශේෂයයි.

ඒ වගේම බෙල්ලේත්, කිහිලිවලත් හට ගන්නා Skin Tags ඕට් නම් තත්ත්වයක් ද දක්නට ලැබේ. DPN තත්ත්වය සේම Skin Tags යන ද්විත්වයම වයිරස් ආසාදනයෙන් හට නොගනී.

**ප්‍රතිශක්තිය දුර්වල අයටත් ඉන්නන් ඇති වේ.**

ඕනෑම වයසක පසුවන පුද්ගලයකුට ඉන්නන් ඇති විය හැකි නමුදු සුලබව මේ තත්ත්වය දැකිය හැකි වන්නේ පෙර පාසල් වියේ පසුවන දරුවන් සහ පාසල් දරුවන් අතරයි. ඊට අමතරව ප්‍රතිශක්තිකරණ පද්ධතිය හා සම්බන්ධ කුමන හෝ අසනීපයක් හෝ මොනයම් හෝ රෝගී තත්ත්වයක් නිසාවෙන් ප්‍රතිශක්තිකරණය දුර්වල ඕනෑම වයසක පසුවන්නකුට ඉන්නන් හට ගත හැකිය. ප්‍රතිශක්තිය දුර්වල පුද්ගලයන් ලෙස දියවැඩියාව වැනි නිදන්ගත රෝගී තත්ත්ව ආදියෙන් පෙළෙන්නන්, වකුගඩු, ඇටමිදුළු වැනි අවයව බද්ධ කළ රෝගීන්, ප්‍රතිශක්තිය හීන කරන ඖෂධ දිගුකාලීනව භාවිත කරන රෝගීන්, පිළිකා තත්ත්ව සහිත රෝගීන් හඳුන්වා දීමට හැකිය. තවද රක්තයා රෝගය වැනි වියළි සමක් සහිත දරුවන්ට ද, Atopic Dermatitis නම් චර්ම රෝගයෙන් සම දුර්වල වූ රෝගීන්ගේද ඉන්නන් තත්ත්වය දැකිය හැකිය.

**ඉන්නෝ බෝ වෙනවාද ?**

HPV වයිරසය ශරීරගත විය හැකි ක්‍රම කිහිපයකි. සම මතුපිට තුවාලයක්, පැළීමක් හෝ ඉරී තැලීමක් වැනි කුමනාකාරයකින් හෝ වයිරසය සමට ඇතුළු වේ. ඉන්නන් හට ගැනෙන්නේ වයිරස් ආසාදනය වීමෙන් නිසා එක් පුද්ගලයකුගෙන් තවත් පුද්ගලයකුට මේ තත්ත්වය බෝ වීමේ හැකියාවක් පවතී. එසේ වන්නේ දිගුකාලීන සෘජු ස්පර්ශය නිසයි. ඉන්නන් ඇති පුද්ගලයකු එක් වරක් ස්පර්ශ කළ පමණින් වයිරසය වෙනත් පුද්ගලයකුට ඇතුළු නොවන බැවින් අනියත බියක් උපදවා නොගත යුතුය. එසේම පිහිනුම් තටාක මඟින්, සපත්තු වැනි දෑ හුවමාරු කොට පැළැඳීමෙන් ඉන්නන් බෝ වීම, පැතිරීම සිදු වේ. ඒ වගේම ජානගත රෝගී තත්ත්වයක් ලෙස ඉතාම කලාතුරකින් ඉන්නන් ඇතිවිය හැකිය.

මෙම තත්ත්වය සිරුරේ පැතිරිය හැකි තවත් ක්‍රම පවතී. කෙනකුගේ අත්වල ඇඟිලි මත ඉන්නන් සිටීනම් නිතරම නියපොතු සැපීමට ඇබ්බැහිව ඇතිනම් නියපොත්තේ යට කොටසේද ඉන්නන් අලුතින් වර්ධනය විය හැකිය. ඇඟිලි මත ඉන්නන් ඇති කුඩා දරුවන් නිතරම නාසය ඇතුළත ස්පර්ශ කරන විටත් මස් දල්ලක් ආකාරයට ඉන්නන් නාසය තුළ ද පැතිරීමට පුළුවනි. එසේම නිතරම ඇස් ස්පර්ශ කිරීම, ඇස් කැසීම නිසා ඇස් පිහාටු මත හා හමේ යම් සීරීමක් ඇති වුවහොත් එම සීරීම දිගේ ද ඉන්නන් වර්ධනය වීමට පටන් ගනී.

**ඉන්නන් හට ගන්නා ස්ථාන**

බහුල වශයෙන් දෙ අතේ ඇඟිලිවලත්, දණහිස්, වැලමිට, කකුල්වල යටි පතුලේ දැකිය හැකිය. යටි පතුල්වල ගල් තැලුමක් මෙන් මිලිමීටරයක් පමණ සමෙහි කුඩා ඝන වීමක් ආකාරයට ඉන්නා වර්ධනය වේ.

**ඉන්නන් වර්ග**

ඉන්නන් වැළඳෙන සිරුරේ ස්ථාන අනුව වර්ගීකරණය කළ හැකිය. ඒ සම ආශ්‍රිතව ඇති වන ඉන්නන් සහ ලිංග්‍රාශිතව ඇති වන ඉන්නන් වශයෙනි.

**සම ආශ්‍රිතව ඇති වන ඉන්නන්**

Common Warts

අත්වල ඇඟිලි මත සහ පාදවල මතුපිට, දණහිසේ සහ වැලමිටේ දකින ඉන්නන් වර්ගයකි. මෙය සුලබව දැකිය හැකි තත්ත්වයකි. සමෙහි ඇති වන ගල්මලක් වැනි පෘෂ්ඨයක් ඇති ඝන වීමක් වශයෙන් දැකිය හැකියි.

Plantar Warts

පාදවල යටි පතුලේ ගල් තැලුමක ස්වාභාවයට හා සමානව දකින ඉන්නන් විශේෂයයි. ගල් තැලුමක ස්වාභාවය ගත්තද මෙය ගල් තැලුමක් නොවේ.

Perigungual Warts

නියපොතු ආශ්‍රිතව හට ගන්නා ඉන්නන් විශේෂයකි.

**පැතලි ඉන්නන්**

සාමාන්‍යයෙන් මුහුණුවල හට ගන්නා සියුම්, මතුපිට පෘෂ්ඨය ඝන වීමක් නැති පැතලි හැඩයෙන් යුත්, ඉතා සුමුදු ඉන්නන් වර්ගයකි. මෙම විශේෂය රැවුල කපන විට කැපුම් ප්‍රදේශයේ වුව ද පැතිරීමට හැකියාවක් ඇත.

**ලිංගාශ්‍රිතව ඇති වන ඉන්නන්**

Genital Warts

ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වීමෙන් ඇති වන රෝගී තත්ත්වයකි. අනාරක්ෂිත ලිංගික හැසිරීම් සහ බහු ලිංගික ඇසුරු නිසාද බෝ වීමට පුලුවනි. මෙම HPV වයිරස් විශේෂය නිසා කාන්තාවන්ට ගැබ් ගෙල පිළිකා රෝගී තත්ත්වයට අවදානමක් පවතී.

**ප්‍රතිකාර ක්‍රම**

ඉන්නන්ට ප්‍රතිකාර කිරීමට පෙරාතුව නිවැරැදි රෝග විනිශ්චය අත්‍යවශ්‍ය වේ. ඉන් අනතුරුව ප්‍රතිකාර අවශ්‍යම ද යන්න පරීක්ෂා කර බැලිය යුතුය. මන්ද සමහර විශේෂ ස්වාභාවයෙන්ම හැළී යාමට හැකි නිසා ඒවාට ප්‍රතිකාර අවැසි නොවේ. එසේම සමහර පිළිකා තත්ත්ව ද මෙයාකාරයට සම මත වර්ධනය විය හැකි බැවින් රෝගී තත්ත්වය නිවැරැදිව තහවුරු කර ගැනීම සුදුසු වේ. ආලේපන වර්ග යොදා ගැනීම සැලිසිල්ක් අම්ලය අඩංගු ආලේපන භාවිත කෙරේ. ද්‍රව නයිට්රේජන් මඟින් ඉන්නන් පිළිස්සීමේ ප්‍රතිකාරය

මෙම ප්‍රතිකාරය රජයේ රෝහල්වල දී සිදු කර ගත හැකිය. ඉන්නන් පිළිස්සීම යනුවෙන් ව්‍යවහාර වුණ ද ද්‍රව නයිට්‍රජන් උපයෝගී කර ගනිමින් ඉන්නා විනාශ කර දැමීම සිදු වේ. සාමාන්‍යයෙන් ද්‍රව නයිට්‍රජන් ප්‍රතිකාරය එක් වතාවක් කළ පමණින් ඉන්නන් හැළී නොයයි. ඉන්නා වර්ධනය වී ඇති ප්‍රමාණය මත ප්‍රතිකාරය සති දෙකෙන් දෙකට හෝ මාසයක්, මාස දෙකක් හෝ ප්‍රතිකාරය සිදු කළ යුතුවේ. ඉහත ප්‍රතිකාර මඟින් ඉන්නන් සිරුරේ හට ගත් තැන්වලින් ඉවත් කෙරුණ ද නැවත වතාවක් වයිරසය ආසාදනය වුවහොත් ඉන්නන් මතු විය හැකිය.

විද්‍යුත් තාපය මඟින් ඉන්නන් පිළිස්සීමේ ප්‍රතිකාරය

මෙහිදී වයිරසය අඩංගු සෛල ඉවත් කිරීම සිදු කෙරේ.

**ලේසර් ප්‍රතිකාරය**

මෙය ද රජයේ රෝහල්වල දී සිදු කර ගත හැකිය.

**වළක්වා ගැනීමේ ක්‍රම**

මූලික වශයෙන්ම ශාරීරික පිරිසුදුකම රැක ගැනීම වැදගත් වේ. දිනපතා ස්නානය කිරීම ඉතා වැදගත්ය. සම වියැළීමට ඉඩ නොදී සමෙහි තෙතමනය රැක ගත යුතුය. ඒ උදෙසා දිනපතා හොඳින් පිරිසුදු ජලය පානය කිරීම සේම නිසි පෝෂණයෙන් යුත් ආහාර අනුභව කිරීම, ගුණවත් සේම නැවුම් පලතුරු වර්ග අනුභවය දැක්විය හැකිය. නියපොතු සැපීමේ පුරුද්දෙන් බැහැර වීමත් කළ යුතුය. තමා පෞද්ගලිකව පරිහරණය කරන දෑ තුවාය, සපත්තු වැනි දේවල් අනෙක් පුද්ගලයන් සමඟ හුවමාරු කර ගැනීමෙන් වැළකිය යුතුය. තව ද ඉන්නන් ඇති ප්‍රදේශ ස්පර්ශයෙන් පසු දෑත් සබන් ගා හොඳින් සේදීම ද කළ යුතු වේ.

**මෙවැනි දෑ කරන්න එපා**

චර්ම රෝග සායනවලට පැමිණෙන බොහෝ දෙනා DPN තත්ත්වය නිසා හට ගන්නා ගැටිතිවලටත්, ඉන්නන් සඳහාත් කෙස් ගස් ගැට ගැසීමට, බුලත් විට කෑමට යොදා ගන්නා හුණු පවා ආලේප කරති. එමෙන්ම සමහරු ඉන්නන් අතින් කඩා දැමීම, රේසර් සහ බ්ලේඩ් යොදා කපා දැමීම වැනි දෑද සිදු කරති. මේවැනි දෑ මඟින් සමට විය හැකි හානිය කොතෙක්ද? DPN තත්ත්වය රූපලාවන්‍ය ගැටලුවක් මිස ප්‍රතිකාර අවශ්‍යම තත්ත්වයක් නොවේ. ඉහත දේවල් ඔබත් සිදු කරන්නේ නම් වැළකිය යුතුය. මන්ද සංවේදී අවයවයක් වන සමට මෙවැනි දෑ අහිතකර විය හැකි නිසාය. ඒ වගේම රෝහල්වලින් පරිබාහිර නිසි පුහුණුවක් නොලද පුද්ගලයන්ගෙන් ප්‍රතිකාර ගැනීමේ දී පවා හොඳින් සිතා බලන්න. පිළිස්සීමේ දී සම මත කැළැලක්, සමට හානි ගෙනදිය හැකිය.

චර්ම රෝගයක දී තත්ත්වය නිසියාකාරව පරීක්ෂා නොකොට අත්බෙහෙත් කිරීමෙන් වළකින්න. ඒ සඳහා පළපුරුදු චර්ම රෝග පිළිබඳ වෛද්‍ය වරයකුගේ උපදෙස් හෝ ළඟම පිහිටි රජයේ රෝහලේ චර්ම රෝග සායනයට යොමු විය හැකිය.

- **නිතරම සම පිරිසුදුව තබා ගන්න**
- **හිතුමතේ ප්‍රතිකාර නොකරන්න**

සටහන- මාධවී ධර්මරත්න

---

# කොන්දෙන් කකුලට එන සයටිකා

**සයටිකා යනු කුමක්ද**

සිරුරේ ඇති විශාලතම වාත නාඩිය සෘධ්‍රසි නාඩිය හෙවත් සයටික් නර්ව් ලෙසින් හැඳින්වේ. මේ නාඩිය අපේ අතේ මහපට ඇඟිල්ල තරමට විශාලය. සයටික් නාඩිය ඇසුරු කරගෙන ඇති වාතය කිපීමෙන් නාඩිය ගමන් කරන පෙදෙස්වලට අදාළව වේදනා ඇතිකරන වාත රෝගය සෘධ්‍රසි වාතය හෙවත් සයටිකා නම්වේ.

මේ වාත වේදනාව සයටික් නාඩි මූලයෙන් ආරම්භ වී උකුල, තුනටිය, තට්ටමේ මැද පෙදෙස, කලවා, දණහිස, බත්කෙණ්ඩාවල පිටුපස පෙදෙස දිගේ විත් වළලුකර පතුල යන මේවායේ වේදනාව දරදඬු බව කැක්කුම සහිතව වරින් වර ඉදිකටු අගිස් අනින්නාක් බඳු වේදනාව, සිරුර පැත්තකට නැවෙන අයුරින් ඇවිදීම හා උකුල, කලවා, දණහිස වළලුකර, සන්ධි ඉදිමීමද ඇතිකරයි. සමහරවිට ඉතා අපහසුවෙන් පසෙකට නැවී අඩි කිහිපයක් ඇවිද ඉන්පසු එතරම් අපහසු නැතිව ඇවිද යයි.

**මෙම සෘධ්‍රසි රෝගයේ ප්‍රබේද හෙවත් ආකාර දෙකකි.**

වාතය කිපීමෙන් පමණක් ඇතිවූ විට එකී නහරය ඇසුරු කරන පෙරකී ස්ථානවල මාංශපේෂිවල දරදඬු ගතිය කකුලේ පසුපස පැත්තේ තදබල වේදනාව ඉදිකටු අනින්නාක් බඳු වේදනාව නැමී ගමන්කිරීම හා ඇවිදිද්දී විටින් විට ගැස්සීමද සිදුවේ වාතය සහ සෙම යන දෙකම කිපීමේ රෝගය ඇතිවන විට සිරුරේ බර ගතිය කටට සෙම ඉනීම, තෙත රෙද්දකින් සිරුර එතුවාක්මෙන් දැනීම, නුරුස්සන ගතිය, බත් කෑමට අකැමැති බව, කුසගිනි අඩුකම ආදියද ඉහත ලක්ෂණවලට අමතරව ඇතිවේ.

සාමාන්‍යයෙන් සෘධ්‍රසි වාත රෝගයේදී කකුළ උකුල් සන්ධියෙන් නැවීමේදී රෝගියාට තදබල පීඩාවක් දැනෙයි. ගමන් කිරීමේදී රෝගියාගේ ආබාධ සහිත පාදය ගමනට බාධා කරන අතර සිරුර හොඳින් තිබෙන පැත්තට මදක් නැමී ගමන් කරයි. එය ප්‍රවක්‍රතාවය නම් වේ.

තවද මෙම රෝගයේදී නාඩිය ගමන් කරන පෙදෙස ස්පර්ශ කරන විට යම් අසහනයක් හා රිදීමක් ඇතිවේ. එය කලවේත් දණහිස පිටුපස පැත්තේත් බත් කෙණ්ඩේත් අධිකව පවතී. මේ රෝගය දෙපසටම හටගත් විට එම රෝගියා ඇවිදීම කරනුයේ බලවත් වේදනාවකිනි. මෙය ගණන් නොගෙන කල්ගත වුවහොත් මාංශ පේශී දුර්වල වී වියළී යාම නිසා කකුල් කොටවීම සිදුවේ.

වැසි සහිත කාලයට රෝගය බලවත් වන්නේ ශීතල අධික වීම නිසාය. මේ රෝගය දිගු කලක් සිරුරේ ලැගුම් ගන්නා එකකි.

**මේ රෝගය හට ගැනීමට හේතු වන්නේ**

1. සිසිල් සුළඟ අධික ලෙස ඇඟට වැදීම
2. කකුල් පෙරළීම (අඩි උස පාවහන් භාවිතය ආදියෙන්)
3. ශ්‍රෝණිගත අර්බුද (ගෙඩි වර්ගවල බලපෑම)
4. හතරවැනි සහ පස්වැනි කශේරුකා අතර බිම්බ චක්‍රිකා පිපිරීම.
5. පස්වැනි කටී කශේරුකාව හා පළවැනි ත්‍රික කශේරුකාව යන දෙක අතර ඇති බිම්බ චක්‍රිකා පිපිරීම යන මේවායි.

පිටට පහර වැදීමෙන් මෙන්ම වැඩි බර ඉසිලීමෙන්ද කශේරු කාන්තරීය (දෙකක් අතර) චක්‍රිකාවෝ පිපිරී යති. මෙසේ මුළුමහත් පිටටම අයත් චක්‍රිකාවල පිපිරීම ඇතිවිය හැකිය.

එසේ සෘධ්‍රසි රෝගය ඇතිවීමට හේතු වනුයේ කටී කශේරුකා අතර ඇති චක්‍රිකාවන් ය. එයිනුත් වැඩිමනත් බලපානුයේ 4 වැනි 5 පස් වැනි කටීකශේරුකා මැද පිහිටි චක්‍රිකා හා පස් වැනි කටී කශේරුකාවේ තුනටිය පෙදෙසේ ප්‍රථම ත්‍රික කශේරුකාවේත් මැද පිහිටි චක්‍රිකා පිපිරීමය.

3 වැනි සහ 4 වැනි කටී කශේරුකාවල මැද පිහිටි චක්‍රිකාවෝ පුපුරා ගියහොත් මේ පිපිරීම පර්වාහ නාඩීන් සහිත සුසුම්නා බණ්ඩය හෙවත් කොඳු නාරටිය කෙරෙහි බලපෑම් ඇති කරයි. එසේම පස්වැනි කටී කශේරුකාවේත් 1 වැනි ත්‍රික කශේරුකාවේත් චක්‍රිකා පිපිරීම බලපානුයේ තුනටිය ප්‍රදේශයේ පිහිටි ප්‍රථම සුසුම්නා නාඩිය කෙරෙහිය. පස්වැනි හතරවැනි කටී කශේරුකා අතර ඇති චක්‍රිකාවල පිපිරීම් කටී ප්‍රදේශයේ පිහිටි පස් වැනි නාඩිය කෙරෙහි බලපෑම් ඇති කරයි. එවිට එම නාඩි ගමන් කරන පෙදෙස්වලට අදාළව වේදනා හට ගනී. මේ සයටික් හෙවත් සෘධ්‍රසි නාඩිය 4 වැනි 5 වැනි අනු කටික නාඩි 2ත් 1වැනි හා දෙවැනි අනු ත්‍රික නාඩි දෙකත් 3න් වැනි අනු ත්‍රික අග්‍ර ශාඛාවේ පූර්ව බෙදීමක් මගින් සෑදී ඇත. එනිසා එම නාඩි මූලයන් කෙරෙහි එල්ලවන බලපෑම් මගින් මේ සෘධ්‍රසි නාඩි තුළ ඇති වාතය කිපී මේ රෝගය හටගනී. මෙය බල්ලී රෝගය නමින් ද හැඳින්වේ. මේ රෝගය ඇති අයට පැතලි මතුපිටක නිදා ගැනීමට උපදෙස් දිය යුතුය.

**ප්‍රතිකාර**

රෝගී පාදයට උඩු අතට තෙල් ගා පංච කර්ම ප්‍රතිකාරවල එන නාඩි ස්වේදය කරන අතරම ඒ සඳහා යෝග්‍ය ගුලි කල්ක සහ පාණ්ඩ පානය කිරීමට දීමෙන් සුවකර ගත හැක.




සිද්ධායුර්වේද නිකේතනයේ හිටපු කථිකාචාර්ය දෙකටන ආයුර්වේද වෙද මැදුරේ වෛද්‍ය
**නිලානි වෙලේකුඹුර**

සටහන:- පුෂ්පා රණවීර

---

# ලස්සන වෙන්න රහස් මෙන්න



කොළඹ ජාතික රෝහලේ පුහුණු කිරීමේ හෙද නිලධාරිනී
**පුෂ්පා රම්‍යාණි සොයිසා**

**අපි හැමෝම ලස්සන වීමට කොතෙක් නම් උත්සාහ දරනවාද? ලස්සන වීමට කැමැති අයට, ලස්සන වැඩි දියුණු කර ගැනීමට කැමැති ඔබට පහත පුරුදු අනුගමනය කළ හැකිය.**

**අධික හිරු එළියට නිරාවරණය වීම සුදුසු නැත.**

උදෑසන 10න් පසු සවස තුන, හතර වන තුරු පවතින දැඩි හිරු රශ්මිය සමට පීඩා ගෙන දේ.

**දේශගුණ තත්ත්වයට ඔබින ඇඳුම් පැළඳුම් භාවිතයට හුරු වන්න.**

අපේ රට සමකයට ආසන්නව පිහිටීම නිසා උණුසුම් ගතිය වැඩිය. නිතර දහදිය දැමීම පවා සිදුවේ. එබැවින් කපු ඇඳුම් භාවිත කිරීම ඉතා යෝග්‍යයි. පහසුවෙන් ඇඳිය හැකි ඇඳුමක් සුදුසු අතර ලා පැහැති, සිරුරට තද නොවුණු ඇඳුමක් විය යුතුය. අව් රශ්මියට යාමේදී කුඩයක්, අව් කණ්ණාඩි, හොඳ වර්ගයේ සන් ක්‍රීම් එකක් භාවිත කරන්න.

**සමේ තෙතමනය රැක ගත යුතුය.**

සම වියළි වුවහොත් බාහිරින් අවලස්සනක් එකතු වේ. තෙතමනය රැක ගැනීමටත් වියළි ගතිය දුරු කිරීමටත් දිනකට වතුර ලීටර් දෙකහමාරක් තුනක් පානය කරන්න.

**සම අධිකව ඇතිල්ලීම, ඇදීම නොකරන්න.**

ඇතැම් දෙනා කොහු ලණු, ගල් වර්ග භාවිත කරමින් සම තදින් අතුල්ලන ආකාරය දක්නට ලැබේ. මෙමගින් කුණු, දුහුවිලි යාම කෙසේ වෙතත් හිතාමතාම ඔබ සමට හානි කර ගනී.

**සමේ රෝම කූප ඉවත් කිරීමේදී පරෙස්සම් වන්න.**

රෝම කූප යනු සමේ ආරක්ෂිත වැස්මකි. රේසර්, වැක්ස් වර්ග භාවිතයෙන් රෝම කූප ඉවත් කිරීම ප්‍රචලිත ක්‍රම කිහිපයකි. යම් හෙයකින් සම තුවාල වුවහොත් ඒ සීරුම දිගේ විසබීජ ශරීර ගත විය හැකිය. දියවැඩියා රෝගියකු නම් එම සුළු තුවාලය සුව වීමට කල් ගත වීමත්, තුවාලය වර්ධනය වීමටත් ඉතා ප්‍රමාණවත්ය.

**දෙපා පිරිසුදුව තබා ගැනීමෙන් ලස්සන වීම ඔප් නැංවේ.**

මුහුණ පමණක් නොව දෙපාවල නිය, ඇඟිලි කරු අතර තෙතමනය නොතබා වියළිව තබා ගත යුතුය. තෙතමනය නිරතුරුව රැඳී තිබීමෙන් විවිධ දිලීර ආසාදන මතු විය හැකිය.

**පෝෂ්‍යදායී ආහාර රටාවකට අනුගත වන්න.**

මෙමගින් සම පැහැපත් වීමටත්, නිරෝගී භාවයටත් මෙන්ම හිසකෙස් වර්ධනයටත් මහෝපකාරී වේ. ගුණවත් එළවළු, පලතුරු මෙන්ම පළා වර්ගද තම ආහාර වේල්වලට එකතු කර ගැනීමෙන් කදිම පෝෂණයක් ලබා ගත හැකිය.

**දිනකට ඔබට අවැසි පැය 6ක අඛණ්ඩ නින්ද ලබා ගන්න.**

ඔබ කලින් දිනයේදී හොඳ නින්දක් ලබා නැති බව පෙන්වන්නේ මුලින්ම ඔබේ දෙනෙතයි. දීප්තිය නැති දෙනෙත ඔබේ ලස්සන යටපත් කරන ප්‍රධාන සාධකයයි.

සටහන- මාධවී

ලංකාදීප ක්‍රීඩා
2021 නොවැම්බර් මස 8 වැනිදා සඳුදා

CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE

# කැලණිය විශ්වවිද්‍යාලය
## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි ප්‍රථම, ද්විතීය, තෘතීය භාග පරීක්ෂණ (බාහිර)**
**2015 පැරණි නිර්දේශය**

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමු, දෙවන, තෙවන, සිව්වන පරීක්ෂණ (බාහිර)
2015 පැරණි නිර්දේශය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර)
2015 නව නිර්දේශය

දිවයිනේ පැවති කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් අවලංගු කරන ලද ඉහත සඳහන් පරීක්ෂණය 2021 නොවැම්බර් මස 16 වන දින පැවැත්වීමට සියලු විධිවිධාන යොදා ඇත. පරීක්ෂණය සඳහා ඉදිරිපත්වීමට බලාපොරොත්තු වන සියලු අපේක්ෂකයන්ට තමන්ගේ විභාග ප්‍රවේශ පත්‍රය 2021-11-08 දින සිට කැලණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ පහත වෙබ් අඩවිය මගින් බාගත කළ හැකිය.

http://www.cdce.kln.ac.lk

වැඩිදුර විමසීම් හා මේ පිළිබඳ ව යම් ගැටලුවක් වේ නම්
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ
පහත සඳහන් දුරකථන අංක අමතන්න.

011-2987000
011-2987001
011-2987005
011-2914478
011-2908166

ලේඛකාධිකාරී
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය

CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE



# 2022 ලෝක කුසලාන තරගාවලියේදීත් ශ්‍රී ලංකාව සුදුසුකම් තේරීමේ වටයට

(ශානුක අරවින්ද සාජා සිට...)

**තවත් මාස 11 කින් ඕස්ට්‍රේලියාවේදී පැවැත්වෙන (2022) විස්සයි-20 ලෝක කුසලාන තරගාවලියේදීත් ශ්‍රී ලංකාවට සුපිරි 12 දෙනාගේ වටයට සුදුසුකම් ලබාගැනීම සඳහා මෙම වසරේදී (2021) මෙන්ම පළමු වටය යටතේ තරග වැදීමට සිදුව තිබේ. මෙවර ලෝක කුසලාන තරගාවලිය අවසන් වන විට විස්සයි-20 ශ්‍රේණිගත කිරීම්හි ඉහළින්ම රැඳී සිටින කණ්ඩායම් 8 සෘජුවම එළඹෙන ලෝක කුසලාන තරගාවලියේ සුපිරි 12 දෙනාගේ වටයට සුදුසුකම් ලබන නමුත්, ශ්‍රේණිගත කිරීම්හි 9 වැනි ස්ථානයේ පසුවීම නිසා ශ්‍රී ලංකාවට එම අවස්ථාව අහිමි විය.**

මෙවර ලෝක කුසලාන තරගාවලියට සහභාගි වීමට පෙර විස්සයි-20 ශ්‍රේණිගත කිරීම්හි 10 වැනි ස්ථානයේ පසුවූ ශ්‍රී ලංකාව, එහිදී සහභාගි වූ තරග 8 න් 5 ක් ජයගැනීමට සමත්වීම හේතුවෙන් තරගාවලියෙන් ඉවත් වන විට 9 වැනි ස්ථානය දක්වා පියවරක් ඉදිරියට පැමිණියේය. එහිදී 8 වැනි ස්ථානයේ පසුවූ බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායම 10 වැනි ස්ථානය දක්වා පසුබැසීමද ශ්‍රී ලංකාවට පියවරක් ඉදිරියට යෑම සඳහා බෙහෙවින්ම ඉවහල් විය.

ශ්‍රේණිගත කිරීම්හි 8 වැනි ස්ථානයේ පසුවන බංග්ලාදේශය මෙන්ම එහි 9 වැනි ස්ථානයේ පසුවන ශ්‍රී ලංකාවද මේ වන විට 232 බැගින් සම ශ්‍රේණිගත ලකුණු සංඛ්‍යාවන් ලබා සිටිති. යම් හෙයකින් මෙවර තරගාවලියේදී ඕස්ට්‍රේලියාව, දකුණු අප්‍රිකාව සහ එංගලන්තය හමුවේ පරාජයට පත්වූ තරග 3 න් එක් තරගයක් හෝ ජයගැනීමට සමත්ව සිටියා නම් ශ්‍රී ලංකාවට ලබන වසරේ ලෝක කුසලාන තරගාවලියේදී පළමු වටයට සහභාගි නොවී සෘජුවම සුපිරි 12 දෙනාගේ වටයට සුදුසුකම් ලබාගැනීමේ අවස්ථාව උදා කර ගැනීමට ඉඩක් තිබිණ.

කෙසේ වුවත් දැන් පවතින තත්ත්වය අනුව ශ්‍රී ලංකාවට මෙන්ම බටහිර ඉන්දීය කොදෙව් පිලට, ස්කොට්ලන්තයට සහ නැමීබියාවටද ලබන වසරේදී සුදුසුකම් ලැබීමේ වටයෙන් පැමිණෙන කණ්ඩායම් 4 ක් සමග පළමු වටය යටතේ තරග වැදීමට සිදුවනු ඇත. ලබන වසරේ පැවැත්වෙන ලෝක කුසලාන තරගාවලියද මෙවර ලෝක කුසලාන තරගාවලියට සමාන ආකෘතියකින් සමන්විත වේ. එබැවින් මෙම වසරේදී මෙන්ම ලබන වසරේදීද පළමු වටයේදී කණ්ඩායම් 8 ක් තරග වදින අතර ඉන් 4 ක් සුපිරි 12 වටයට සුදුසුකම් ලබනු ඇත.

මෙවර ලෝක කුසලාන තරගාවලිය අවසානයේ ශ්‍රේණිගත කිරීම්හි මුල් ස්ථාන 8 පසුවන එංගලන්තය, පාකිස්තානය, ඉන්දියාව, නවසීලන්තය, දකුණු අප්‍රිකාව, ඕස්ට්‍රේලියාව, ඇෆ්ගනිස්ථානය සහ බංග්ලාදේශය ලබන වසරේ ලෝක කුසලාන තරගාවලියේ සුපිරි 12 දෙනාගේ වටයට සෘජුවම සුදුසුකම් ලබාගන්නා කණ්ඩායම් වෙති. මෙවර ලෝක කුසලාන තරගාවලිය නිමාවීමට තවත් දින 6 ක් ඉතිරිව ඇති නමුත් එම කණ්ඩායම්වලින් කිසිවක් 8 වැනි ස්ථානයෙන් පහළට නොයනු ඇත.

වත්මන් ලෝක ශූරයන් වන බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායම මෙවර තරගාවලියේදී සුපිරි 12 දෙනාගේ වටයට සෘජුවම ඇතුළත්ව සිටි නමුත් එහිදී දැක්වූ ආසාර්ථකත්ව මත ඔවුන්ට ශ්‍රේණිගත කිරීම්හි 10 වැනි ස්ථානය දක්වා පසුබැසීමට සිදුවිය. ඒ අනුව ඔවුන්ට ලබන වසරේදී සෘජුවම සුපිරි 12 දෙනාගේ වටයට පිවිසීමේ අවස්ථාව අහිමිවිය. කොදෙව් කණ්ඩායමේ පසුබැසීමත් සමග ශ්‍රේණිගත කිරීම්හි 9 වැනි ස්ථානයේ සිට 8 වැනි ස්ථානය දක්වා ඉහළට පැමිණි බංග්ලාදේශයට ලබන වසරේදී සුපිරි 12 දෙනාගේ වටයට සෘජුවම සුදුසුකම් ලැබීමේ අවස්ථාව උදාවිය.

(ඡායාරූපය-රොයිටර්)

ශ්‍රී ලංකාවේ #1
ටෙලිවිෂන් රසාස්වාදය
Dialog TELEVISION


# මාලදිවයින පැරැද්දුවොත් පාරිතෝෂිකයක්

(නාමල් පතිරගේ)

**වසර 19 කින් පරාජය කිරීමට අපොහොසත්ව සිටින මාලදිවයින අද (8) කොළඹදී ආරම්භ වන අගමැති මහින්ද රාජපක්ෂ කුසලාන සිවු කොන් තරගාවලියේදී පරාජය කිරීමට ශ්‍රී ලංකා කණ්ඩායම සමත් වන්නේ නම්, එහි සියලු ක්‍රීඩකයන්ට විශේෂ පාරිතෝෂික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා පාපන්දු ආයතනය සූදානම්ව සිටියි.**

මෙම කණ්ඩායම් දෙක ජාත්‍යන්තර පාපන්දු තරගයකදී අවසන් වරට මුණගැසුණු පසුගිය ඔක්තෝබර් 10 වැනිදද ශ්‍රී ලංකා පාපන්දු ආයතනය මෙම විශේෂ පාරිතෝෂික දීමනාව ගෙවීමට සූදනම්ව සිටියත්, එම තරගයෙන් ද ශ්‍රී ලංකාව ගෝල 1-0කට පරාජයට පත්විය.

ශූරයන්ට ඩොලර් 30,000ක් හෙවත් ශ්‍රී ලංකා මුදලින් රුපියල් ලක්ෂ 65 කට ආසන්න ත්‍යාග මුදලක් හිමි වන අගමැති මහින්ද රාජපක්ෂ කුසලාන සිවු කොන් ජාත්‍යන්තර පාපන්දු තරගාවලියේ ශ්‍රී ලංකාව හා මාලදිවයින අතර තරගය අද (8) රාත්‍රී 9.00 ට කොළඹ රීඩ් මාවත ක්‍රීඩා සංකීර්ණයේදී ආරම්භ වීමට නියමිතය. මෙම සිවු කොන් පාපන්දු තරගාවලියේ පළමු තරගය පස්වරු 4.00 ට පැවැත්වීමට නියමිතව ඇත්තේ, බංග්ලාදේශය හා ශීෂෙල්ස් රාජ්‍යය අතරය.



ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාට උපහාර පිණිස සංවිධානය කෙරෙන තරගාවලියේ සමාරම්භක උත්සවය අද රාත්‍රී 8.00 ට පැවැත්වෙන්නේ මාලදිවයින් ජනාධිපති ඉබ්‍රහිම් මොහොමඩ් සෝලි මහතා සහ ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙනි.

වසර 13කට පසුව ශ්‍රී ලංකාවේ සත්කාරයෙන් සංවිධානය කරන පළමු ජාත්‍යන්තර පාපන්දු තරගාවලිය මෙයයි. මෙම තරගාවලිය සඳහා ආසියානු පාපන්දු සමුළුවේ හා ලෝක පාපන්දු සම්මේලනයේ ද අනුග්‍රහය ලැබෙන අතර, එහි මුළු පිරිවැය ආසන්න වශයෙන් රුපියල් කෝටි පහක් පමණ වනු ඇත.

ශ්‍රී ලංකාව හා මාලදිවයින අතර තරගය නැරඹීම සඳහා මාලදිවයින් ජාතිකයෝ ද විශාල පිරිසක් ගුවන් යානා වෙන් කරගනිමින් පැමිණ සිටින බව ශ්‍රී ලංකා පාපන්දු ආයතනයේ සභාපති ජස්වර් උමාර් මහතා පවසයි. මෙම තරගය නැරඹීම සඳහා විශේෂිත ආරාධිතයකු ලෙස මාලදිවයින් ජනාධිපති ඉබ්‍රහිම් මොහොමඩ් සෝලි මහතා ද අද දිවයිනට පැමිණීමට නියමිතය.

**අගමැති මහින්ද රාජපක්ෂ කුසලාන සිවු කොන් පාපන්දු තරගාවලිය පැවැත්වෙන ආකාරය (පළමු තරගය පස්වරු 4.00 ට ද, දෙවැනි තරගය රාත්‍රී 9.00 ට ද ආරම්භ වේ.)**

නොවැම්බර් 8 -
I. බංග්ලාදේශය-ශීසෙල්ස් අතර,
II. ශ්‍රී ලංකාව-මාලදිවයින අතර

නොවැම්බර් 11 -
I. බංග්ලාදේශය-මාලදිවයින අතර,
II. ශ්‍රී ලංකාව-ශීසෙල්ස් අතර

නොවැම්බර් 14 -
I. ශ්‍රී ලංකාව-බංග්ලාදේශය අතර
II. ශීසෙල්ස් - මාලදිවයින අතර

නොවැම්බර් 19 -
රාත්‍රී 8.00 ට අවසන් මහා තරගය

ශ්‍රී ලාංකීය ක්‍රීඩා පිටියේ වැඩිදුර තොරතුරු දැනගන්න
www.kelimandala.lk වෙත පිවිසෙන්න

# සදීර - කමිල් ශ්‍රී ලංකා 'ඒ' පිල බේරාගනිති

(රොෂාන් ගුණරත්න)

**සදීර සමරවික්‍රමගේ (නොදැවී 151) ශතකයත්, කමිල් මිෂාරගේ (98) අර්ධ ශතකයත් හේතුවෙන් පාකිස්තාන 'ඒ' කණ්ඩායමට එරෙහිව පැවැති දෙවැනි නිල නොවන ටෙස්ට් තරගය ජය පරාජයෙන් තොරව අවසන් කර ගැනීමට ශ්‍රී ලංකා 'ඒ' කණ්ඩායමට හැකිවිය.**

මහනුවර පල්ලෙකැලේ ක්‍රීඩාංගණයේදී පැවැති දෙවැනි නිල නොවන ටෙස්ට් තරගයේ සිවුවැනි සහ අවසන් දිනය වූ ඊයේ (7 වැනිද) අයහපත් ආලෝක තත්වය හේතුවෙන් තරගය අවසන් කරන විට පන්දුවට පහරදෙමින් සිටි ශ්‍රී ලංකා 'ඒ' කණ්ඩායම සිය දෙවැනි ඉනිම සඳහා කඩුලු 6 ක් දැවී ලකුණු 317 ක් රැස්කර තිබිණ. පළමු තරගයත් ජය පැරදුමෙන් තොරව නිමා වූ හෙයින් තරග 2 කින් සමන්විත නිල නොවන ටෙස්ට් තරගාවලිය 0-0 ක් ලෙස සම තත්වයෙන් අවසන් විය.

**පාකිස්තාන 'ඒ' පළමු ඉනිම - සියලුදෙනා දැවී 394**

**ශ්‍රී ලංකා 'ඒ' පළමු ඉනිම - සියලුදෙනා දැවී 67**

**ශ්‍රී ලංකා 'ඒ' දෙවැනි ඉනිම - කඩුලු 6 ක් දැවී 317** (කමිල් මිෂාර 98, සදීර සමරවික්‍රම නොදැවී 151, සුමින්ද ලක්ෂාන් 25, කුරාම් ශාසාඩ් 67/2, කම්රන් ගුලාම් 6/1, )

LOLC FINANCE

# වාහන විකිණීමක්

## අම්පාර

| | | | | | |
|---|---|---|---|---|---|
| **රෝද හතරේ ට්‍රැක්ටර්** | | | | | |
| ටැෆේ 45DI | 2500CC | 2015 | EP | RE | XXXX |
| ජෝන් ඩියර් | 2900CC | 2011 | UP | RC | XXXX |
| **මෝටර් බයිසිකල්** | | | | | |
| බජාජ් PULSAR | 200CC | 2020 | EP | BIQ | XXXX |
| **ත්‍රීරෝද රථ** | | | | | |
| බජාජ් | 198CC | 2014 | EP | AAT | XXXX |
| බජාජ් | 198CC | 2016 | EP | ABN | XXXX |

LOLC ඔටෝ මාර්ට්, නො. 223, නුවර පාර, අම්පාර
සමන්ත - 0635780880/881

## බදුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| **මෝටර් බයිසිකල්** | | | | | |
| හොන්ඩා NAVI | 110CC | 2017 | CP | BIW | XXXX |
| **ත්‍රීරෝද රථ** | | | | | |
| බජාජ් | 198CC | 2015 | CP | ABH | XXXX |
| බජාජ් | 173CC | 2010 | CP | QZ | XXXX |
| බජාජ් | 173CC | 2007 | CP | QN | XXXX |
| බජාජ් | 173CC | 2010 | CP | YB | XXXX |

LOLC වාහන අංගනය, නො. 161A, කැප්පෙටිපොල පාර, බදුල්ල
ලහිරු - 0554549948

## දඹුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| **රෝද හතරේ ට්‍රැක්ටර්** | | | | | |
| මහින්ද්‍රා 575DI | 2523CC | 2014 | NC | RD | XXXX |
| **හාවෙස්ටර්** | | | | | |
| MUBOTA COMBINE HAVESTER AC 70S | | | | | |
| **මෝටර් ලොරි** | | | | | |
| ටාටා LPK 1615 | 5883CC | 2010 | EP | LH | XXXX |
| **ත්‍රීරෝද රථ** | | | | | |
| බජාජ් | 173CC | 2009 | NW | QU | XXXX |
| බජාජ් | 173CC | 2009 | NW | QT | XXXX |
| බජාජ් | 173CC | 2009 | NW | QV | XXXX |
| බජාජ් | 173CC | 2010 | NW | QX | XXXX |
| බජාජ් | 173CC | 2010 | NC | YB | XXXX |
| බජාජ් | 198CC | 2010 | NC | YF | XXXX |
| බජාජ් | 173CC | 2010 | NC | QW | XXXX |
| බජාජ් | 198CC | 2014 | SG | AAT | XXXX |
| බජාජ් | 173CC | 2010 | CP | QW | XXXX |
| බජාජ් | 173CC | 2009 | CP | QS | XXXX |
| බජාජ් | 173CC | 2009 | WP | QS | XXXX |
| බජාජ් | 198CC | 2011 | WP | YK | XXXX |
| බජාජ් | 173CC | 2007 | CP | QM | XXXX |
| බජාජ් | 198CC | 2010 | CP | YH | XXXX |
| බජාජ් | 173CC | 2010 | CP | QW | XXXX |
| බජාජ් | 198CC | 2012 | NC | YX | XXXX |
| බජාජ් | 198CC | 2011 | CP | YL | XXXX |
| බජාජ් | 173CC | 2009 | CP | QT | XXXX |
| බජාජ් | 173CC | 2008 | CP | QQ | XXXX |
| බජාජ් | 173CC | 2009 | CP | QU | XXXX |
| බජාජ් | 173CC | 2009 | CP | QT | XXXX |
| බජාජ් | 173CC | 2009 | CP | QW | XXXX |
| බජාජ් | 173CC | 2009 | CP | QS | XXXX |

LOLC වාහන අංගනය, ඇතාබැඳිවැව පාර, තලකිරියාගම, දඹුල්ල
චමින්ද - 0665118181

## වැල්ලම්පිටිය

| | | | | | |
|---|---|---|---|---|---|
| **මෝටර් බයිසිකල්** | | | | | |
| TVS NTORQ | 124CC | 2019 | WP | BIJ | XXXX |
| **ත්‍රීරෝද රථ** | | | | | |
| බජාජ් | 145CC | 2006 | WP | QE | XXXX |
| බජාජ් | 198CC | 2012 | WP | AAE | XXXX |
| බජාජ් | 173CC | 2009 | SP | QU | XXXX |
| බජාජ් | 145CC | 2005 | WP | QB | XXXX |
| බජාජ් | 173CC | 2007 | WP | QK | XXXX |
| බජාජ් | 145CC | 2005 | WP | QB | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QG | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QH | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QG | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QG | XXXX |
| බජාජ් | 198CC | 2011 | WP | YQ | XXXX |
| බජාජ් | 198CC | 2016 | WP | ABL | XXXX |
| බජාජ් | 198CC | 2016 | WP | ABM | XXXX |
| බජාජ් | 198CC | 2011 | WP | YT | XXXX |
| බජාජ් | 198CC | 2015 | WP | ABA | XXXX |

LOLC වාහන අංගනය, නො.98 J/1, අවිස්සාවේල්ල පාර,මහබුත්ගමුව, වැල්ලම්පිටිය
ජයන්ත - 0773242324

## අම්බලන්තොට

| | | | | | |
|---|---|---|---|---|---|
| **ත්‍රීරෝද රථ** | | | | | |
| බජාජ් | 145CC | 2006 | SP | QI | XXXX |
| බජාජ් | 200CC | 2011 | SG | YU | XXXX |
| බජාජ් | 173CC | 2010 | SP | YE | XXXX |

LOLC වාහන අංගනය, නො.162, කෙලින් වීදිය, අම්බලන්තොට
කවිඳු - 0475118080

## ගොතටුව

| | | | | | |
|---|---|---|---|---|---|
| **ත්‍රීරෝද රථ** | | | | | |
| බජාජ් | 198CC | 2011 | SP | YO | XXXX |
| බජාජ් | 198CC | 2012 | WP | YY | XXXX |
| බජාජ් | 198CC | 2011 | WP | YP | XXXX |
| බජාජ් | 150CC | 2004 | WP | JG | XXXX |
| බජාජ් | 200CC | 2012 | WP | AAE | XXXX |
| බජාජ් | 173CC | 2007 | WP | QM | XXXX |
| බජාජ් | 198CC | 2014 | WP | AAU | XXXX |
| බජාජ් | 198CC | 2011 | WP | YI | XXXX |
| බජාජ් | 150CC | 2003 | WP | HG | XXXX |
| බජාජ් | 173CC | 2009 | WP | QU | XXXX |
| බජාජ් | 173CC | 2010 | WP | QW | XXXX |
| බජාජ් | 145CC | 2005 | WP | QD | XXXX |
| බජාජ් | 145CC | 2005 | WP | QB | XXXX |
| බජාජ් | 150CC | 2003 | WP | HK | XXXX |
| බජාජ් | 150CC | 2006 | WP | JW | XXXX |
| බජාජ් | 173CC | 2009 | WP | QW | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QE | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QI | XXXX |
| බජාජ් | 173CC | 2009 | WP | QV | XXXX |
| බජාජ් | 173CC | 2010 | WP | QZ | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QG | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QF | XXXX |
| බජාජ් | 145CC | 2005 | WP | QC | XXXX |
| බජාජ් | 198CC | 2014 | WP | AAR | XXXX |
| බජාජ් | 150CC | 2003 | WP | HS | XXXX |
| බජාජ් | 150CC | 2003 | WP | HM | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QF | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QI | XXXX |
| බජාජ් | 173CC | 2010 | WP | QZ | XXXX |
| බජාජ් | 173CC | 2009 | WP | QU | XXXX |
| බජාජ් | 198CC | 2012 | WP | AAD | XXXX |
| බජාජ් | 173CC | 2008 | WP | QP | XXXX |
| බජාජ් | 173CC | 2010 | WP | YC | XXXX |
| බජාජ් | 150CC | 2003 | WP | HR | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QH | XXXX |
| බජාජ් | 173CC | 2007 | WP | QK | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QI | XXXX |
| බජාජ් | 150CC | 2003 | WP | HW | XXXX |
| බජාජ් | 150CC | 2003 | WP | HN | XXXX |
| බජාජ් | 173CC | 2008 | WP | QP | XXXX |
| බජාජ් | 173CC | 2010 | WP | QX | XXXX |
| බජාජ් | 150CC | 2003 | WP | HI | XXXX |
| බජාජ් | 150CC | 2004 | WP | HX | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QI | XXXX |

නො. 42/5, ගොතටුව ගම්සභා පාර, ගොතටුව
මහේෂ් - 0773493535

## කුරුවිට

| | | | | | |
|---|---|---|---|---|---|
| **ත්‍රීරෝද රථ** | | | | | |
| බජාජ් | 173CC | 2009 | SG | QU | XXXX |
| බජාජ් | 173CC | 2009 | SG | QU | XXXX |
| බජාජ් | 198CC | 2012 | SG | AAC | XXXX |
| පියාජියෝ | 395CC | 2011 | SG | YR | XXXX |
| පියාජියෝ | 395CC | 2009 | WP | QT | XXXX |
| පියාජියෝ | 395CC | 2012 | SG | YW | XXXX |
| පියාජියෝ | 395CC | 2009 | SG | QV | XXXX |
| පියාජියෝ | 395CC | 2011 | WP | YP | XXXX |

LOLC වාහන අංගනය, නො. 472 F, මලව, කුරුවිට
ඉෂංක - 0772752097

## මතුගම

| | | | | | |
|---|---|---|---|---|---|
| **ත්‍රීරෝද රථ** | | | | | |
| බජාජ් | 173CC | 2010 | WP | QW | XXXX |

LOLC වාහන අංගනය, මහජන බැංකුව අසල, විජය මාවත, මතුගම
ප්‍රමෝද - 0775634245

## වව්නියාව

| | | | | | |
|---|---|---|---|---|---|
| **රෝද හතරේ ට්‍රැක්ටර්** | | | | | |
| කුබෝටා L3408 | 1647CC | 2017 | NC | RF | XXXX |
| කුබෝටා L4508 | 2197CC | 2018 | NC | RF | XXXX |
| **මෝටර් බයිසිකල්** | | | | | |
| හීරෝ PLEASURE | 100CC | 2015 | NP | BDU | XXXX |
| **ත්‍රීරෝද රථ** | | | | | |
| බජාජ් | 198CC | 2010 | NP | YF | XXXX |
| බජාජ් | 173CC | 2009 | NP | QV | XXXX |
| බජාජ් | 150CC | 2004 | NP | JQ | XXXX |
| බජාජ් | 145CC | 2006 | NP | QH | XXXX |
| බජාජ් | 173CC | 2009 | NP | QT | XXXX |
| බජාජ් | 173CC | 2010 | NP | YC | XXXX |

LOLC වාහන අංගනය, නො.363, මන්නාරම පාර, වෙප්පන්කුලම්, වව්නියාව
තිමෝති - 0766582329

ටෙන්ඩර් කිරීම සඳහා වෙන්කර ඇති ඕනෑම වාහනයක් දැන්වීමකින් තොරව ඉවත් කිරීමේ අයිතිය අප සමාගම සතුයි.
ටෙන්ඩර් පත් රාජගිරිය ප්‍රධාන කාර්යාලයෙන් සහ ඉහත ලිපිනයන්ට අදාල ශාඛා වලින් ලබාගත හැක.
**ටෙන්ඩර් භාර ගැනීම 2021 නොවැම්බර් මස 11 වන දින ප.ව. 12.30 න් අවසන් වේ.**

**LOLC ෆිනෑන්ස් පීඑල්සී**
අංක: 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.

D_Ads

CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE

# කැලණිය විශ්වවිද්‍යාලය
## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර) - 2015**

දිවයිනේ පැවති කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් අවලංගු කරන ලද ඉහත සඳහන් පරීක්ෂණය 2021 නොවැම්බර් මස 20 වන දින පැවැත්වීමට සියලු විධිවිධාන යොදා ඇත. පරීක්ෂණය සඳහා ඉදිරිපත්වීමට බලාපොරොත්තු වන සියලු අපේක්ෂකයන්ට තමන්ගේ විභාග ප්‍රවේශ පත්‍රය 2021-11-02 දින සිට කැලණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ පහත වෙබ් අඩවිය මගින් බාගත කළ හැකිය.

http://www.cdce.kln.ac.lk

**BMGT E 2055** ව්‍යාපාරික තොරතුරු පද්ධති
**BMGT E 2065** සංවිධාන න්‍යාය සහ සැකැස්ම

වැඩිදුර විමසීම් හා මේ පිළිබඳ ව යම් ගැටලුවක් වේ නම්
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ
පහත සඳහන් දුරකථන අංක අමතන්න.

ලේඛකාධිකාරී
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය

011-2987000
011-2987001
011-2987005
011-2914478
011-2908166

CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE CDCE

කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරණ ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2021 නොවැම්බර් මස 8 වැනිදා සඳුදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.
Lankadeepa - Printed and published by Wijeya Newspapers Ltd. on Monday 08th November, 2021 at No. 8, Hunupitiya Cross Road, Colombo 02, Sri Lanka.
Telephone: Editorial Dept: 2448321, 2423919, 5330813 Fax: 2438039, Advertising Dept: 2479540, 5383383, 5330330, Fax: 2314864, 2304144 Circulation Dept: 2435454, 2448322, 2479625 Fax: 2459725 General: 2314714



# සිසුන් 48 යි: ගුරුවරුන් 7 යි

# මහරගම පමුණුව කනිෂ්ඨය වැසීයන්න ඔන්න මෙන්න

(මත්තේගොඩ ශාන්ත ප්‍රදීප් කුමාර කුලරත්න)

**වසර හැට එකක් පැරණි මහරගම, පමුණුව කනිෂ්ඨ විද්‍යාලය, බලධාරීන් කිසිවකුගේ ඇස නොගැටීම නිසා වැසීයාමේ තර්ජනයට ලක්ව ඇතැයි ප්‍රදේශවාසීහු පවසති.**

සිසුන් සිය දහස් ගණනක් සිප් සතර හැදෑරූ මෙම පාසල අද වනවිට සිසුන් 48 දෙනකුට හා ආචාර්ය මණ්ඩලය 07 දෙනකුට පමණක් සීමා වී ඇති අතර, උසස් පෙළ දක්වා පන්ති පැවැත්වෙන බවද පැවසේ.

ඔවුන් අතරින් අවසන් වරට පැවැත්වූ අ.පො.ස (සා. පෙළ) විභාගයට සිසුන් තිදෙනකු ඉදිරිපත් වී ඇති අතර ඉන් එක් සිසුවකු ඉහළ සාමාර්ථ සහිතව උසස් පෙළ සඳහා සුදුසුකම් ලබා ඇති බවත් තවත් සිසුවියක ගණිත විෂයට සම්මානයක් දීමේ පොරොන්දුව මත උසස් පෙළ වරම් ලබා ඇති බවත් වාර්තා වේ.

1947 වර්ෂයේ ආරම්භ කළ සුචරිතෝදය ළමා නිවාසයට අනුබද්ධව 1960 වසරේදී ,ආරම්භ කළ මෙම විද්‍යාලයෙන්, ප්‍රදේශයේ දරු දැරියන් විශාල ප්‍රමාණයක් අධ්‍යාපනය ලබා ඇතත්, මේ වනවිට, බාහිර කිසිදු දරුවකු මෙම පාසලට නොපැමිණෙන බව සුචරිතෝදය ළමා නිවාසයේ කළමනාකාරවරිය පැවසුවාය.

ඊට හේතුවී ඇත්තේ පහසුකම් අවම වීම බව ද ඇය වැඩිදුරටත් කීවාය.

මේ හේතුවෙන් බාහිර දෙමව්පියන් පාසලට නොපැමිණෙන නිසා, දෛනික කටයුතු විදුහල්පතිනිය ඇතුළු ආචාර්ය මණ්ඩලයේ කැපවීමෙන් කර ගැනීමට සිදුව ඇති බව ප්‍රදේශවාසීහු පවසති.

මෙවන් පරිසරයක් තුළ, වසර පනහකට පමණ පෙර ඉදිකළ අංග සම්පූර්ණ ගොඩනැගිලි නඩත්තු නොකිරීම නිසා, වහළ සම්පූර්ණයෙන් දිරාපත්ව, ජනෙල් උලුවහු අබලන්ව, භාවිතයට ගැනීමට නොහැකිව සම්පූර්ණයෙන් විනාශවීමේ තර්ජනයකට ලක්ව තිබේ.



අබලන් වූ ගොඩනැගිල්ලක වහල දිරාපත්ව ඇති අයුරු

එසේම පසුගිය වසර දෙකක කාලයක් පාසල වසා තිබීමෙන්, එක් ගොඩනැගිල්ලක වහලයේ යටලීයක් දිරාපත්ව මුක්කු ගසා ඇති අතර තවත් ගොඩනැගිල්ලක වහලය සම්පූර්ණයෙන් දිරාපත්ව, මාරක අනතුරකට අත වනමින් තිබෙනු දක්නට ලැබේ.

මේ තත්ත්වය මත තම දරුවන් වෙනත් පාසල් කරා යොමු කළද, පාසලේ භෞතික සම්පත් සංවර්ධනය කිරීමට, රජයෙන් හෝ වෙනත් පාර්ශ්වයකින් අනුග්‍රහයක් ලැබෙන්නේ නම් තම දරුවන්, මෙම පාසලට ඇතුළත් කිරීමට පියවර ගන්නා බව, ඔවුහු කියා සිටිති.

මේ පිළිබඳව මහරගම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයේ ඉහළ නිලධාරිනියකගෙන් විමසූ විට ඇය අප වෙත පැවසුවේ,

මේ පාසලේ විශාල සිසුන් පිරිසක් මීට පෙර අධ්‍යාපනය ලැබුවා. නමුත් මේ වන විට අධ්‍යාපනය ලබන්නේ සුචරිතෝදය ළමා නිවාසයේ සිසුන් පිරිසක් පමණයි.

එහෙත් අපි පාසල වසා නොදමා පළමු ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා පන්ති පවත්වාගෙන යාමටත්, 5 ශ්‍රේණියෙන් පසුව බුවනෙකබා විද්‍යාලයට සිසුන් ඇතුළත් කොට සිසුන්ට අධ්‍යාපනය ලබාදීමටත් දැනට පියවර ගෙන තිබෙනවා.

# ප්ලාස්ටික් බෝතල්-යෝගට් කෝප්ප හැම තැනම: විදුලි පහන් නෑ

# දළුපිටිය ඇවිදින මංතීරුවේ කිඹුල් බියක්

(මහර ගණිදු රෝචන සමරතුංග)

**මහර, දළුපිටිය ශරීර සුවතා මං තීරුව ආශ්‍රිත ඇළ මාර්ගයේ කිඹුලන් කිහිප දෙනකු ගැවසීම නිසා එම ස්ථානයට පැමිණෙන ජනතාව කිඹුලන්ගෙන් විවිධ අනතුරුවලට ලක්වීමේ අවදානමක් මතුව පවතී.**



**මෙහි සවිකර ඇති සමහර විදුලි පහන් කණු අක්‍රියව පවතින නිසා එම ස්ථානයට පාන්දර සහ සවස් කාලයේ පැමිණෙන ජනතාව එහි ඇති අඳුරු ස්වභාවය හේතුවෙන් එම අනතුරුවලට ලක්වීමේ දැඩි අවදානමක් පවතියි. මෙම ඇළ මාර්ගය කැලයෙන් සහ විවිධ ජලජ ශාක වර්ග වැවී අවහිරව පැවතීම නිසා සුළු වර්ෂාවකදී පවා ප්‍රදේශය ජලයෙන් යටවීමේ අවදානමක් මතුව පවතියි.**

**මෙම ස්ථානයට පැමිණෙන සමහර පුද්ගලයන් විසින් මෙහි පරිසර පද්ධතියට ප්ලාස්ටික් බෝතල්, යෝගට් කෝප්ප, ඉටි උර සහ විදුරු බෝතල් බැහැර කිරීමෙන් ප්‍රදේශය අපවිත්‍රව පවතී.**

**මේ වනවිට මෙම ශරීර සුවතා මං තීරුව ආශ්‍රිත භූමියේ ඇති විවිධ ශාක නිසා මෙහි පොළවට සවිකර ඇති සමහර ඉන්ටර්ලොක් ගල් ගිලා බැස ඇති බැවින් එම ස්ථානයට පැමිණෙන ජනතාව විවිධ අනතුරුවලට ලක්වීමේ අවදානමක් මතුව පවතියි. මෙම ජලාශය ආශ්‍රිත පරිසරයේ කොරවක්කන්, දියකාවුන්, කිරලුන්, විවිධ කොක්කු වර්ග, පිළිහුඩුවන්, උකුස්සන් වැනි විවිධ පක්ෂීහු වැඩි වශයෙන් වාසය කරති. එහෙත් විවිධ පුද්ගලයන්ගේ නොමනා ක්‍රියා හේතුවෙන් මෙම සතුන් වඳවී යාමේ අවදානමක් මතුව පවතියි.**

**මහර ප්‍රාදේශීය සභාවට අයත් මහර, දළුපිටිය ශරීර සුවතා මංතීරුව සිවිල් ආරක්ෂක බළකායේ නිලධාරීන් යොදවා නඩත්තු කිරීමේ කටයුතු සිදු කරති. මෙම ශරීර සුවතා මංතීරුව ඉකුත් 2012 වසරේ මාර්තු මස හිටපු ජනාධිපති වත්මන් අගමැති මහින්ද රාජපක්ෂ මහතා විසින් ඉදිකර ජනතා අයිතියට පත් කර තිබේ. මහර දළුපිටිය ශරීර සුවතා මං තීරුවේ පවතින අඩුපාඩු නිසි පරිදි පිළිසකර කර දෙන ලෙස එම ස්ථානයට පැමිණෙන ජනතාව අදාළ අංශවලින් ඉල්ලා සිටිති.**

**මේ පිළිබඳව මහර ප්‍රාදේශීය සභාවේ නම සඳහන් කිරීමට අකමැති උසස් නිලධාරියකුගෙන් කළ විමසීමකදී ඔහු මෙසේ පැවසීය.**

**මහර දළුපිටිය ශරීර සුවතා මංතීරුවේ විදුලි පහන් සකස් කිරීම පහත් බිම් සංවර්ධන ආයතනයෙන් සිදු කළා. එහෙත් එම කටයුතු සිදු කිරීමට ලිඛිතව මහර ප්‍රාදේශීය සභාවට පවරා නැහැ. මෙම භූමිය එළි පෙහෙළි කිරීමට අපි සිවිල් ආරක්ෂක බළකායේ නිලධාරීන් යොදවා සිදු කරනවා. කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ පවා මෙම භූමියේ වැඩි ප්‍රමාණයක් එළි පෙහෙළි කිරීමට කටයුතු කළා.**

# කන්නන්ගර නුවර මතුගමට ඈඳයි

(මතුගම බන්දු තඹවිට)

**වලල්ලාවිට ඉත්තපාන ‘කන්නන්ගර නුවර’ නමින් පිහිටුවීමට නියමිත නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මතුගම මැතිවරණ කොට්ඨාසයට එකතුකර ගැනීමට මතුගම ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේදී තීරණය විය.**

වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉත්තපාන කලාපය කන්නන්ගර නුවර නමින් නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් පිහිටුවීමට මේ වන විට ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම් අනුව කටයුතු සිදුවෙමින් පවතින අතර එම නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් 04 ක් පවරා ගැනීමට ඉල්ලීමක් කර ඇති බව පසුගියදා පැවති මතුගම ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේදී සාකච්ඡා විය.

එහිදී මතුගම ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සභාපති කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අනුප පැස්කුවෙල් මහතා එම යෝජනාව ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට ඉදිරිපත් කරමින් මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් 04 එම නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට පවරා කන්නන්ගර නුවර නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මතුගම මැතිවරණ කොට්ඨාසයට පවරා ගැනීමට යෝජනා කළ අතර ඒ සඳහා කමිටුවේ එකඟතාවය පළ කෙරිණි. මතුගම ප්‍රාදේශීය ලේකම් නිරංජලා හුළුගල්ල මහත්මිය ඇතුළු රාජ්‍ය නිලධාරීහු සහ මතුගම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුහු මෙම ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට සහභාගී වූහ.

නිදහස් අධ්‍යාපනයේ පියා ලෙස සැලකෙන ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර ශ්‍රීමතාණන්ගේ භෂ්මාවශේෂ තැන්පත්කර ඇති සහ එතුමාගේ පාරම්පරික උරුමය හිමි ඉත්තපාන ලුල්බද්දුව ප්‍රදේශය මුල්කරගෙන එතුමාට උපහාරයක් ලෙස මෙම නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කන්නන්ගර නුවර නමින් නම් කිරීමටත් තීරණය කර ඇති අතර මේ වන විට ඉත්තපාන ප්‍රදේශය අයත් වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඉත්තපාන ප්‍රදේශවාසීන්ට රාජකාරී කටයුතු සඳහා ගමන් කිරීමේදී විශාල දුරක් ගෙවීමට සිදුවීම ඇතුළු අපහසුතා නිසා ඉත්තපාන ප්‍රදේශයට නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ලබාදෙන ලෙස ප්‍රදේශවාසීන් කාලයක සිට කරන ලද ඉල්ලීමක් අනුව මෙම තීරණය බලධාරීන් විසින් ගෙන ඇත.





# එගොඩ උයන සුනන්දෝපනන්ද ප්‍රාථමිකයේ ගුරු වන්දනාවක්

(මොරටුව - රේඛා තරංගනී ෆොන්සේකා)

**ගුරු උද්ඝෝෂණ හේතුවෙන් පළුදු වූ ගුරු සිසු සංවේදී බැඳීම් නැවත ශක්තිමත් කිරීමේ අරමුණින් ‘ගුරු වන්දනා’ යන තේමාව යටතේ ගුරුවරුන් පිදීමේ වැඩසටහනක් මොරටුව එගොඩඋයන සුනන්දෝපනන්ද ප්‍රාථමික විද්‍යාලයේ පසුගියදා (29) සිදු කෙරිණි.**

පිළියන්දල අධ්‍යාපන කලාප කාර්යාලයෙන් ලැබුණු උපදෙස්වලට අනුව විදුහලේ විදුහල්පතිනි මයුරි කරුණාරත්න මහත්මිය මෙම ගුරුවරුන් පිදීමේ වැඩසටහන සංවිධානය කොට තිබූ අතර එම අවස්ථාවේදී ගුරුවරුන්ගේ සිත් නිවාලන ආකාරයට දරුවන් විසින් ගීත ගායනා කොට දෙපා නමැද ගුරු බුහුමන් දැක්වීම සිදු කෙරිණි.




## කෝවිඩ් යුතුකම

ඇරුනත් රට යළිත් කෝවිඩ් මාරකය
නෙක වෙස්ගෙන සරති අනතුරු දයකය
නිසි ඔසුවක් තවම නැතිකම බාධකය
බාධකයම තමයි ජය මඟ සාධකය

මේ වෛරසයෙ පවතින මාරක පෙනුම
ගැන පුරවැසි හැමට දැන් තියෙනව දැනුම
එය පහසුවක් කරගෙන රට රැක ගැනුම
නොකළොත් එයම වේ මරුවට අත වැනුම

සමහරු වාසියට කෑමොර දෙති කයියෝ
යළි රට වසන්නට සිදු වුණොතින් අයියෝ
බඩ ගින්නෙම මැරෙන්නට සිදුවෙයි ගොයියෝ
එතකොට පිහිට වෙන්නේ කවුරුද දෙයියෝ

රට රැක ගැනුම යුතුකම බව අප සතුව
හැම දෙන සිතා ගනු මැන නුවණින් යුතුව
‘අවුරුදු පොකුරු’ ආවොත් තැන තැන මතුව
අවසන් ගමන සිදුවේ සුදු කොඩි නැතුව

නිසි ලෙස මුඛ වැස්ම දගෙන නහය කට
වහගෙන හිටියහොත් රැකගත හැකිය රට
සෝදු දෙඅත් මීටරයක දුරින් සිට
එන්නත නොගත හොත් මරු එයි විටින් විට

සුව සේවය කියන පිළිවෙත් නිති රකිනූ
රැස්වෙන තැන පිරිස් මදකට අත හරිනූ
අරයා මෙයා ගැන නොසිතා වැඩ කරනූ
රට යනු මමය මම යනු රට බව සිතනූ

රාජගිරියේ
**රංජිත් වීරසේකර**

ඔබේ නිර්මාණ කොළම්පුර කවි මඩුව “ලංකාදීප” කර්තෘ මණ්ඩලය, අංක 8, හුණුපිටිය හරස් පාර, කොළඹ 02. ලිපිනයට යොමු කරන්න.

# ගිලන් රියෙන් ජනතාවට විශාල සේවාවක් සිදුවුණා

## විජයමුණි අජිත් (ශ්‍රීලනිප)

# අතුරු ව්‍යවස්ථාවලින් සභාවට සත පහක ආදයමක් නැද්ද?

## පේමලාල් පිංතු (එජාප)

සීතාවකපුර නගර සභාව

(අවිස්සාවේල්ල විශේෂ සෝමසිරි හිඟුරලආරච්චි)

**පිලිප් ගුණවර්ධන ක්‍රීඩාංගණය ගිලන් රථය තියෙන්නේ සම්පූර්ණ පෙට්‍රල් ගහලා, අවශ්‍ය රියදුරුත් සමග. මම කියනවා ජනතාවගේ ඉල්ලීම්වලට අවශ්‍ය පරිදි ක්‍රියාත්මක වෙලා තියෙනවා කියා යැයි අවිස්සාවේල්ල සීතාවක පුර නගර සභාවේ නාගරික මන්ත්‍රී විජයමුණි අජිත් මහින්ද සොයිසා (ශ්‍රී ලංකා නිදහස් පක්ෂය) මහතා පැවැසීය.**

ඒ මහතා එසේ පැවසුවේ මාසික රැස්වීම අමතමිනි.

**අවිස්සාවේල්ල සීතාවකපුර නගර සභාවේ සභාපති දේශමාන්‍ය රණවීර කුරුගලආරච්චි මහතා (පොදුජන එක්සත් පෙරමුණ)** ගේ මූලිකත්වයෙන් එම නගර සභා ශ්‍රවණාගාරයේදී මාසික රැස්වීම පැවැත්විණි.

සොයිසා මහතා වැඩිදුරටත් අදහස් දක්වමින් මෙසේද පැවසීය. අපි ගිලන් රථ සේවාව පවත්වාගෙන යන්නේ රෝහලක් හැටියට නෙවෙයි නගර සභාවක් හැටියට දහසක් බාධක මැද්දේ. මේකෙන් අපේ ප්‍රදේශයේ ජනතාවට විශාල ප්‍රයෝජනයක් ලැබෙනවා.

**ජී. ජී. දුෂ්මන්ත අනුර කුමාර ගුණවර්ධන මහතා (එක්සත් ජාතික පක්ෂය - උප සභාපති):**
අවිස්සාවේල්ල මහ රෝහලේ කොවිඩ් වාට්ටුව පසුගිය කාලේ පිරිල ඉතිරිලා ගියා. මට ආරංචියක් ආවා සභාපතිතුමා කර්මාන්තපුරේ කම්පැණියක් එක්ක කතා කරල ඒ අය එකඟ කරගෙන තියෙනවා රුපියල් කෝටියක මුදලක් පරිත්‍යාග කරන්න. ඒ අවිස්සාවේල්ල රෝහලේ ළමා වාට්ටුව හා කොවිඩ් වාට්ටුව වැඩි දියුණු කරන්න.

**ඩබ්. ඒ. සමන් පුෂ්ප කුමාර මහතා (පොදුජන එක්සත් පෙරමුණ):**
ලෝක කොවිඩ් වසංගතය හමුවේ ලංකාවටද එය බෝවී අකාලයේ මිය යන අසරණ ජනතාවගේ මරණ ආදාහනය සඳහා මල් ශාලාවලින් අධික මුදල් අය කරන බැවින් ඒ සඳහා නගර සභා බල ප්‍රදේශය තුළ රුපියල් 12,500/- ක මුදලකටත් නගර සභාවෙන් පිට රුපියල් 15,000/-ක මුදලකටත් ඉටු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස මම නගර සභාවට යෝජනා කරනවා.

**ආර්. එම්. එස්. පේමලාල් පිංතු මහතා (එක්සත් ජාතික පක්ෂය)**

ඊළඟට සභාවට මේ අතුරු ව්‍යවස්ථා මිටියක් සම්මත කරනවා. ඒ අතුරු ව්‍යවස්ථාවලින් ශත පහක්වත් ආදායමක් මේ සභාවට එන්නේ නැද්ද? ඒ පිළිබඳ ගැසට් එකක් නෑ. මේ පරණම සෙට් එක තමයි දාල තියෙන්නේ. දැන් අතුරු ව්‍යවස්ථා තියෙනවා. ලොට් එකක් විසි නමයක්ද කීයක්ද? මේකේ එක ආදායමක්වත් නැද්ද සභාවට?

**නගර සභාපති දේශමාන්‍ය රණවීර කුරුගල ආරච්චි මහතා (පොදුජන එක්සත් පෙරමුණ)** මන්ත්‍රීතුමා මේක සම්මත වෙලා නැහැල්ලු. සම්මත උනාට පස්සේ තමයි ආයිත් ගැසට් එකක් දමන්නේ.

# කැනපි හට් ප්‍රදානයක්

(ගම්පහ තිලකරත්න දිසානායක)



(සුගතදස මහතා කැනපිය බාර දුන් අයුරු)

**පිළිකුත්තුව පුනර්ශක්ති වැඩිහිටි සංවිධානයට අවශ්‍යව තිබූ කැනපි හට් එකක් ප්‍රදානය කිරීම ප්‍රදේශයේ දනපතියකු වූ ජී.ඒ. සුගතදස මහතාගේ ධන පරිත්‍යාගයෙන් සිදු කෙරිණි.**

මියගිය ස්වාමි දියණි සෝමාවතී පෙරේරා මහත්මියට සහ මව්පිය දෙපළට පිං පිණිස මෙම පරිත්‍යාගය සිදුකළේය.

පිළිකුත්තුව ග්‍රාම නිලධාරී කාර්යාලයේදී මෙය බාරදීම සිදු කළ අතර එම අවස්ථාවට මහර ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලාහුගල සුමනසාර නාහිමි, ග්‍රාම නිලධාරී ඒ. එස්. ජයරත්න, වැඩිහිටි සංවිධානයේ සභාපති එල්. එල්. රංජිත් යන මහත්වරුන් ඇතුළු සංවිධානයේ සාමාජිකයෝ පිරිසක් එක්ව සිටියහ.

# ලුහුඬු දැන්වීම්

## මේසන්වරු සහ වඩුබාස්වරු

**වඩු** බාස්වරු අවශ්‍යයි වැටුප 2500 සිට 3000 දක්වා කෑම නවාතැන් පහසුකම් ඇත. 0703142932 කඩුවෙල. L349180-3

**වත්තල** ජාඇල වැඩපළකට මේසන් බාස්වරුන් 3,000/-, ගෝලයන් 2,300/- නවාතැන් පහසුකම්. 077-8342536, 076-0537598 L359137-1

**හේමාගම** වැඩබිමකට මේසන්, ටයිල් හා වඩු බාස්වරු, අත්උදව්කරුවන් අවශ්‍යයි. දිනපතා වැටුප්. රු. 3,000/- 2,000/-. දු.අැ. 0773301425 L359128-1

**හොරණ** වැඩබිමකට මේසන්වරු හා ගෝලයින් වැටුප් 2,500/- - 3,500/- 1,800/- - 2,300/- 0761799890 L358421-1

**මේසන්** බාස්වරු සහ ගෝලයන්, ඇලුමිනියම් අයද උවමනායි. කඩවත, දිනපතා මුදල්, නවාතැන් ඇත. 0714-870210. L352142-2

## ගෘහ සේවකයෝ

**අප** නිවසේ නැවතී සේවයට 35-45 තරුණ යුවලක් අවශ්‍යයි. 60,000/- සියළු පහසුකම් ඇතිව කිරිබත්ගොඩ. 076-6452454. L358148-1

**කුරුණෑගල** අවු: 85 මවක් බලාගැනීමට ගෘහ සේවිකාවක් අවශ්‍යයි. නවාතැන් පහසුකම් ඇත. දෛනික වැටුප් 0718454729. L356272-1

**මිරිහානේ** වෛද්‍යවරයෙකුගේ නිවසේ සහ කාර්යාලයේ (නැවතී) සේවය කිරීමට වසර 2 පලපුරුද්ද ඇති (වයස 40 - 50 අතර) කාන්තාවක් අවශ්‍යයි. බ්‍රෝකර්වරුන් අනවශ්‍යයි. වැටුප: 35,000 - 40,000 අතර. 0777704887. L357120-1

## කාර්මිකයෝ

**අප** බොරලැස්ගමුව පිහිටි වාහන සර්විස් කිරීමේ ආයතනයකට සර්විස් කිරීමට සහ කට් ඇන්ඩ් පොලිෂ් කිරීමට දන්නා සේවකයින් සහ වාහන සේදීමට පුහුණු/ නුපුහුණු සේවකයින් අවශ්‍යයි. 0777-313296 L359124-1

**වාහන** පේන්ට් බාස්වරුන් සහ ගෝලයින් අවශ්‍යයි. 0768506744. L358120-2

## වෙළෙඳ සහායකයින්

**බත්තරමුල්ල** අවන්හල් සඳහා වයස 35ට අඩු කැෂියර්වරු අවශ්‍යයි. 0773409108, 0777340748 L359162-1

**මීගමුව** අවට පේස්ට්‍රි ෂොප් කිහිපයක් සඳහා පුහුණු/ නුපුහුණු වෙළෙඳ සේවක සේවිකාවන් අවශ්‍යයි. ආහාර, නවාතැන්, සෞඛ්‍ය පහසුකම් සැපයේ. වැටුප 35,000/- 0772050315, 0314937031 L359135-1

## අලෙවිකරුවන්

**අලුතින්** ආරම්භකරන ස්වර්ණාභරණ අලෙවි ආයතනයකට සේල්ස්මන්වරුන් අවශ්‍යයි. කෑම/ නවාතැන් පහසුකම් නොමිලේ සිත්ගන්නා සුළු වැටුප්. 0756320693. L358580-1

**ස්වර්ණාභාරණ** අලෙවි ආයතනයකට පළපුරුදු සේල්ස්මන්වරුන්/ ලිපිකරුවන් අවශ්‍යයි. ගම්පහ දිස්ත්‍රික්කයෙන් විශේෂයි (පිරිමි අය පමණි) 0760755051. L358582-1

## වතුවැඩ

**උද්‍යාන** නඩත්තු, සැකසුම්, පැළ තවාන් සඳහා කම්කරුවන්, වැඩ පරීක්ෂක, බර - රියැදුරු අවශ්‍යයි. නවාතැන්, තේ, ප්‍රවාහනය නොමිලේ. 1,800 + OT. මාස 03 ස්ථිරයි. ETF/ EPF යුනිෆෝම්. 0703482485 L359125-1

**නාවලපිටියේ** අක්කර 5ක තේ වත්තක නැවතී වැඩකිරීමට යුවලක් අවශ්‍යයි. නැවතීමට කුඩා නිවසක් ඇත. වැටුප පිරිමි 1200/-. කාන්තා 850/-. 0772659939. L351158-1

**මීගමුව** දගොන්නේ පිහිටි පොල් වත්තකට අවුරුදු 55ට අඩු කම්කරු පවුල් අවශ්‍යයයි. දෙදෙනාම වැඩකළ යුතුයි. ඉහළ වැටුප් ග්‍රාමසේවක සහතිකය අනිවාර්ය වේ. විමසන්න. 0718388931, 0787676344. L348661-4

**වැලිවේරිය** ප්‍රදේශයේ ඇති කුකුළු ගොවිපලකට සහ ඌරු ගොවිපලකට සේවකයින් අවශ්‍යයි. නවාතැන් පහසුකම් සහ ආහාර සැපයේ. 077-8362284, 071-5365385. L1021620403-1

## ආරක්ෂක සේවා

**00** ඔරුගොඩවත්ත ගබඩා කාර්යාල සඳහා SSO - රු. 1300 (පැය 12) ආහාර නොමිලේ, නවාතැන් පහසුකම් ඇත. 0763035656, 0763075656. ABC සෙකියුරිටි සොලුෂන්ස් (පුද්) සමාගම. L354335-1

**00** කඩුවෙල ගබඩා කාර්යාල සඳහා ආරක්ෂක නිලධාරී ඇබෑර්තු SSO - රු. 1150 අමතන්න. 0763055656, 0763035656 ABC සෙකියුරිටි සොලුෂන්ස් (පුද්) සමාගම. L354344-1

**00** කොටුගොඩ, ජාඇල, ඒකල සඳහා LSO - රු. 31,200 + OT, SSO - රු. 1250 (පැය 12) සහන මිලට ආහාර, නවාතැන් පහසුකම් ඇත. 0763035009, 0763035656 ABC සෙකියුරිටි සොලුෂන්ස් (පුද්) සමාගම. L354354-1

**00** නුගපේ කඳාන ගබඩා කාර්යාල සඳහා පරිගණක දත්ත ක්‍රියාකරු කාන්තා (LSO) - වැටුප රු. 30,000/- (අවු. 45ට අඩු) පිරිමි (SSO) - වැටුප රු. 51,750 (අවු. 55ට අඩු) ආහාර නොමිලේ, නවාතැන් පහසුකම් ඇත. 0763035656, 0763035009 ABC සෙකියුරිටි සොලුෂන්ස් (පුද්) සමාගම. නො. 101, නුවර පාර, දළුගම, කැලණිය. L354328-1

**OIC/** SO/ LSO වයික්කාල, කොට්ටාව, පෑලියගොඩ මාලබේ හා කොළඹ අවට ඇබෑර්තු. දින 10කට වරක් රු. 10,000/- දක්වා වැටුප් අත්තිකාරම්. 0740166657, 0773868260 L348012-5

**ආරක්ෂක** සේවයේ ඇබෑර්තු - පහත ප්‍රදේශයන්හි ආරක්ෂක නිලධාරී/ නිලධාරිනියන් බඳවා ගැනේ. (කොට්ටාව, නාරාහේන්පිට, හොරණ, කළුතර-පලාතොට, කොළඹ අවට හදිසි ඇබෑර්තු - 0760-957781, 0778-890264, 0778-889847, 0778-891904). (ටවුන්හෝල්, දෙමටගොඩ, බියගම BOI, කඩවත - 0778-887528, 0760-957784). (කුරුණෑගල, මාතලේ, නිකවැරටිය, මැල්සිරිපුර - 0778-886433, 0778-889936, 0777-637094). (නිට්ටඹුව, තිහාරිය - 0778-889739, 0778-890283). (කොග්ගල BOI, මාතර - 0778-887813). (කෑගල්ල, අලව්ව - 0778-859576). (කාන්තා නිලධාරිනියන් සඳහා - 0761869056) ඉහල වැටුප් අපෙන්. ඒස් ෆ්‍රන්ට් ලයින් සෙකියුරිටි සොලුයුෂන් (පුද්) සමාගම. L304028-17

**කටුනායක/** සීදුව පිහිටි ආයතන සඳහා ආරක්ෂක නිලධාරීන් කඩිනමින් අවශ්‍යයි. OIC - 1200/-, SSO - 1100/-, JSO - 1000/-. 077-3976388. L1021617079-9

**ජා** ඇල, බෝපිටියේ ආයතනයක් සඳහා ආරක්ෂක නිලධාරීන් කඩිනමින් බඳවා ගැනේ. ඊගල් ආරක්ෂක සේවය 0703909090, 0773509778, 0112245506 L348679-4

**නාවල** බංගලාවක් බොරැල්ල වාහන යාඩ්, පෑලියගොඩ ගබඩාවක් වැටුප මාසික රුපියල් 60000/- වගකීමෙන් රාජකාරී කිරීමේ හැකියාව අනෙකුත් දීමනා සමඟ එකම ස්ථානයක සහතිකපත් සමඟ. 0772777682, 0772726870. L358150-1

**සතිපතා** වැටුප්. වත්තල ප්‍රදේශයේ පිහිටි ප්‍රධාන පෙළේ ඇඟලුම් ප්‍රදර්ශනාගාරයක් සඳහා වයස අවුරුදු 25-50ත් අතර පුද්ගලයින් සඳහා ආරක්ෂක නිලධාරි ඇබෑර්තු. 0750300333, 0759105050, 0753700751 L359126-1

## විවිධ

**0** බීම බිස්කට් ආයතන සඳහා 18-50 අතර ගැහැනු පිරිමි ඉක්මනින් අවශ්‍යයි. කෑම, නවාතැන් සමග 45,000/- ඉහළ වැටුප්. 071-4604521 L359150-1

**071-3786949** දිවයිනේ ඉහළ පෙළේ අප කිරිපිටි සමාගමට කාන්තා පිරිමි අවශ්‍යයි. 45000 වැඩි ආහාර නවාතැන් සමඟ L358173-1

**071-3787006** දිවයිනේ පිළිගත් අප බිස්කට් සමාගමෙහි සේවයට ගැ/පි අවශ්‍යයි. 45000 වැඩි ආහාර නවාතැන් ඇත. L358169-1

**0718684499** ජංගම පවිත්‍රතා සේවාවන් සපයන දිවයිනේ ප්‍රමුඛ පෙළේ ආයතනයකට බර-වාහන රියදුරු බලපත් සහිත අයවළුන්, පවිත්‍රතා යන්ත්‍ර ක්‍රියාකරුවන්, පවිත්‍රතා සේවක සේවිකාවන් වයස් බේදයකින් තොරව බඳවා ගැනේ. L358318-2

**074-0065770** කටුනායක ගුවන්තොටුපලේ කේටරින් පැකින් අංශ සඳහා අවු. 18 - 55 ගැ/ පි අවශ්‍යයි. 45000 වැඩි. ආහාර තවාතැන් ඇත. අධ්‍යාපන සුදුසුකම් අනවශ්‍යයි. L358124-1

**076-9836881** කටුනායක ගුවන්තොටුපලේ ස්ථිර සේවයට කාන්තා පිරිමි අවශ්‍යයි. 45000 වැඩි ආහාර නවාතැන් සමඟ පසුකාලීන ඉහළ වැටුප්. L358145-1

**077-1207870** සෝලා සමාගමකට වැඩ සහායකයින් අවශ්‍යයි. නුගේගොඩ රියදුරු බලපත්‍රය අමතර සුදුසුකමකි. L348275-4

**කටුනායක** ගුවන්තොටුපලේ කේටරින් ක්ලීනින් කාගෝ සඳහා කඩිනමින් සේවක සේවිකාවන් බඳවා ගනු ලැබේ. කෑම, නවාතැන් සමග 45,000/- ඉහළ වැටුප්. 070-2836307 L359155-1

**චීනයේ** නිෂ්පාදන ලංකාවේ අප සමාගමට අවුරුදු 18-55 අතර සේවකයින් අවශ්‍යයි. කෑම, නවාතැන් සමග 60,000/- වැඩි වැටුප්. 071-9547986 L359153-1

**මල්** ශාලාවකට - (කුරුණෑගල) එම්බාම්/ ඩ්‍රයිවින් ඇතුළුව සියළුම වැඩ දන්නා සේවකයින් අවශ්‍යයි. විමසීම්:- 0774625576. L356236-1

**සදසරණ** උපස්ථාන පුද්ගලික සමාගම සඳහා සේවක සේවිකාවන් බඳවා ගනු ලැබේ. සාමාන්‍ය රෝගීන් සඳහා දිනක වැටුප රු. 1500-1800 දක්වා ගෙවනු ලැබේ. විශේෂිත වූ රෝගීන් සඳහා දිනක වැටුප රු. 5000-4000 දක්වා ගෙවනු ලබන අතර සේවා කාලයේදී ආහාරපාන, නවාතැන් පහසුකම් නොමිලේ අවු. 18-70 දක්වා නිරෝගී අයවලුන් දැන් බඳවා ගනු ලැබේ. අමතන්න. නිපුල් - 0775077942, පිවිතුරු - 0741002993, ඉසුරු - 0741002994, ඉදුනිල් - 0741002998, 0114397476. L358153-1

**ළමා** නිවාස පාලිකා තනතුරු සඳහා දැන් අයදුම්පත් භාරගනු ලැබේ. අපගේ ලිපිනය කළමණාකාරතුමා, Future for Children ආයතනය, යුනෙස්කෝ ගම්මානය, නානතොට, කොස්ගොඩ, වැඩි විස්තර සඳහා විමසන්න 091-2264217. L358117-1

**ෆැෂන්** බග් (පුද්) සමාගමේ බොරැල්ල හා පැපිලියාන යන ශාඛාවන් සඳහා තේ සාදන්නියන් (Tea Maker) වහාම අවශ්‍යයි. දු.ක - 0764537040, 0772920795. L354648-2

# හද හඬන හඬ

## උසස් අධ්‍යාපනයේ ශක්තිය



එස්.බී. දිසානායක

**උසස් අධ්‍යාපනයේ ශක්තිය හඳුනා ගන්න. අපේ දරුවන්ට උසස් අධ්‍යාපනයට ඇති නිදහස සහතික කර දෙන්න.**

2020 වසරේ අපේ රටේ උසස් පෙළ
විභාගයට දරුවෝ 301771 දෙනෙක්
පෙනී සිටියහ.
දරුවෝ 194297 ක් උසස් පෙළ
සමත් වී ඇත්තාහ.
එයින් 42000 ක් රජයේ විශ්ව විද්‍යාල
වලට යති.
රජයේ හා පෞද්ගලික අංශයේ
මුදල් ගෙවා ඉගෙන ගත යුතු විශ්ව විද්‍යාල
වලට 15000ක් පමණ යති.
මේ විශ්ව විද්‍යාල වලට උපාධි ප්‍රදානය කිරීමේ
බලය ප්‍රදානය කෙරුණේ
මා උසස් අධ්‍යාපන ඇමති ලෙස සිටි කාලයෙයි.

සෑම වසරකම ළමයි 10000 - 12000 පමණ
උසස් අධ්‍යාපනය සඳහා විදේශගත වෙති.
මීට අමතරව විවෘත විශ්වවිද්‍යාලයේ හා
බාහිර සිසුන් ලෙස තවත් 20000ක් පමණ
අධ්‍යාපන කටයුතු අරඹති.
ඒත් උසස් පෙළ සමතුන් තවත්
90000ක් ඉතිරි වෙති.
මේ අයගෙන් 60000 කටවත්
උසස් අධ්‍යාපනය අවශ්‍ය වේ.
එහෙත් ඔවුනට තමන් කැමති ක්ෂේත්‍රයක
උසස් අධ්‍යාපනය ලබන්නට
ශ්‍රී ලංකාව තුළ ඉඩක් නැත.
විදේශගත වීමට තරම්
වත්කමක් ද ඔවුනට නැත.

රජයේ විශ්ව විද්‍යාල වලට ගන්නා
දරුවන්ගෙන් 30000 කට පමණ
තමුන් කැමති විෂය ක්ෂේත්‍රයක් මෙන්ම
තමුන් කැමති පාඨමාලාවක් නොලැබේ.
මේ අතර
වෛද්‍ය අංශයෙන් A 3 ක් ලබාගෙන
වෛද්‍ය අධ්‍යාපනය අහිමි වූ සිසුහු සිටිති.
A 3 ක් ලබාගත් ඉංජිනේරු අංශයේ
දරුවන්ට තමන් කැමති ඉංජිනේරු
පාඨමාලාවක්
නොලැබූ අය ද සිටිති.
A 3 ක් ලබා ගෙනත් නීතිය හැදෑරීමට
අවස්ථාවක් නොලැබූ දරුවෝද
අපේ රජයේ සරසවිවල සිටිති.
මේ සිසුන් සියයට 60කට පමණ තමන් කැමති
විශ්ව විද්‍යාල නොලැබේ.
සියයට 60 තමන් කැමති පාඨමාලා ද නොලැබේ.

රජයේ විශ්ව විද්‍යාල තුළ මේ සියලු ප්‍රශ්න
විසඳීමට තව වසර 30කින් වත් හැකි වේ යැයි,
මම විශ්වාස නොකරමි.
අප වසරකට අධ්‍යාපනය සඳහා වෙන් කරන්නේ
දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 1ක්
පමණ මුදලකි.
මේ මුදල සැලකිය යුතු ලෙස වැඩිවීමට නම්
රටේ ආර්ථිකය සැලකිය යුතු ලෙස
වැඩි විය යුතුය.
2022 අය වැයෙන් සමස්ත අධ්‍යාපනයට
වෙන් වී ඇති මුදල
දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට0.8 කි.

විශ්වවිද්‍යාල ආචාර්ය සංගමයේ
ප්‍රධාන ඉල්ලීමක් වන්නේ අධ්‍යාපනයට
සියයට 6 ක් වෙන් කරන ලෙසයි.
සියයට 6 කෙසේ වෙතත් සියයට 3 ක් වෙන් කර
ගැනීමටත්, රටේ ආර්ථිකය අදට වඩා
විශාල ලෙස ශක්තිමත් විය යුතුය.

ඒත් අපේ දරුවන්ට උසස් අධ්‍යාපනයට ඇති
නිදහස සහතික කරන්න
ඉහත කථා කළ ගැටලු විසඳන්න
රටේ ආර්ථිකය ශක්තිමත් වනතුරු
බලා සිටිය යුතු නැත.

අපි අපේ මව්බිම තුළ
උසස් අධ්‍යාපනයට ඇති ශක්තීන්
හඳුනා ගනිමු.

අප රටේ උසස් අධ්‍යාපනයට ඇති
ප්‍රධාන ශක්තිය වන්නේ
ලොව පුරා විසිරී පැතිරී සිටින අපේ
උගතුන් - බුද්ධිමතුන් හා විද්‍යාඥයෝය.
දෙවැනි ප්‍රධාන ශක්තිය වන්නේ
අපේ රට පිහිටා තිබෙන ස්ථානයයි.
තෙවැනි ප්‍රධාන ශක්තිය වන්නේ
අප රටේ සෞන්දර්යාත්මක බවයි.
හතරවැනි ශක්තිය වන්නේ අපේ
ආකර්ශනීය දේශගුණයයි.

අප රටේ විදේශගත වන දරුවෝ සිය අධ්‍යාපනය
වෙනුවෙන් සෑම වසරකම ඩොලර් මිලියන 300
පමණ
වැය කරති.
ඒ මුදල රටින් පිටට ඇදී යන විදේශ විනිමයයි.
මේ මුදල් ඉතිරි කර ගැනීමට නම්
මුදල් අයකරන රජයේ හා පෞද්ගලික අංශයේ
හවුල් ව්‍යාපාර ලෙසත්
රජයේ හා පෞද්ගලික අංශයේ සීමිත සමාගම්
ලෙසත්
නව විශ්වවිද්‍යාල ආරම්භ කළ යුතුය.

එවිට රජයට විශාල මුදලක් වැය කිරීමට
සිදු නොවේ.
එසේම කීර්තිමත් විදේශ විශ්ව විද්‍යාල
කිහිපයක් අපේ රටට,
ගෙන්වා ගැනීමට ද හැකිය.
අද අපේ සරසවි සිසුන්ගේ ප්‍රශ්නත්,
උසස් අධ්‍යාපනය කරගත නොහැකිව
සිටින අයගේ ප්‍රශ්නත්,
මේ තුළින් විසඳ ගත හැක.

මේ පෞද්ගලික හා විදේශ විශ්වවිද්‍යාල වලට
ඇතුළු වන දරුවන්ට
ශිෂ්‍යාධාර හා බැංකු ණය පහසුකම්
සැලසිය යුතුය.

මම උසස් අධ්‍යාපන ඇමතිවරයා ලෙස
ඉන්දියාවේ කීර්තිමත් මනිපාල් විශ්ව විද්‍යාලයත්,
මහා බ්‍රිතාන්‍යයේ සෙන්ට්‍රල් ලැන්කැෂියර් විශ්ව
විද්‍යාලයත්,
ලංකාවට ගෙන ඒමට සියලු කටයුතු කළෙමි.
විශ්ව විද්‍යාල 2 කටම කටුනායකින් හා
මීරිගමින් ඉඩම් අක්කර 100 බැගින්
ලබා දුනිමි.
බ්‍රිතාන්‍ය විදේශ ඇමැතිවරයා මීරිගම
ඉඩමේ මුල් ගලක් තබා වැඩ ඇරඹීය.

එහෙත් පෞද්ගලික වෛද්‍ය පීඨ ඇති කිරීමේ දී,
රජය දැක්වූ වැනෙන සුළු භාවය නිසා,
එම විශ්ව විද්‍යාල 2 කම අප රටට එන
අදහස අත්හළේය.
ලැන්කැෂියර් නොහොත් U-Clan සරසවිය,
ලෝකයේ කීර්තිමත් විශ්ව විද්‍යාල 100 අතර
තිබූ විශ්ව විද්‍යාලයකි.
ආසියානු දරුවන් මෙන්ම මැද පෙරදිග දරුවන් ද
අපේ විශ්ව විද්‍යාලවලට ගෙන්වා ගැනීම පහසුය.
අපට විදේශ විනිමය ඉපයිය හැකි
ප්‍රධාන ක්ෂේත්‍රයක් ලෙස උසස් අධ්‍යාපනය
දියුණු කළ හැකිය.

මුදල් අයකරන රජයේ හා පෞද්ගලික
අංශයේ විශ්වවිද්‍යාල වලට
ඇතුළුවන දේශීය දරුවන්ට ද
විදේශ ශිෂ්‍යත්ව ක්‍රමයක් හා බැංකු ණය ක්‍රමයක්
සකස් කිරීම
අත්‍යාවශ්‍යය.

මේ තීරණ ක්‍රියාත්මක කිරීමට යාමේ දී
සරසවි ශිෂ්‍යයෝ, ආචාර්යවරු හා වෛද්‍යවරු
විරුද්ධ වනු ඇත.
ඒත් ඒ විරෝධතා කිසිවකට සාධාරණ
හේතු කිසිවක් නැත.
එනිසා ඒ සියලු විරෝධතා පරාජය කළ යුතුය.

රජයේ විශ්ව විද්‍යාල පෙරටුගාමීන් හෝ
ජේ.වී.පී. ශිෂ්‍යන්ට
අවශ්‍ය ලෙස පාලනය කරන යුගය,
වහා අවසන් කළ යුතුය.
අපේ රජයේ විශ්ව විද්‍යාල ජාත්‍යන්තර තලයේ
ඉහළට ගෙන යාමට නම්
විදේශ සිසුන් ද බඳවා ගැනීම
අත්‍යාවශ්‍යය.
අප පටන්ගත් නායකත්ව පුහුණුව තව පුළුල් කර
ආරම්භ කළ යුතුය.
සරසවි නවක වදය
වහා අවසන් කළ යුතුය.

සිංගප්පූරු ශිෂ්‍යයෙක් එරට විශ්ව විද්‍යාලයකට
බඳවා ගන්නේ වසර 2ක හමුදා
පුහුණුවකින් පසුවය.
ජපන් සිසුන් එරට විශ්වවිද්‍යාල වලට
ගැනීමට පෙර වසරක හමුදා සේවය අත්‍යාවශ්‍යය.

මේ සාර්ථක රටවල,
අති සාර්ථක විශ්ව විද්‍යාල වල,
ක්‍රියාමාර්ග, අපේ විශ්ව විද්‍යාල වලට
ඵලදායක මග පෙන්වීම් කරන බව
අප තේරුම් ගෙන හැඩ ගැසීම අත්‍යාවශ්‍යය.

## ජන් හඬ

# බඩු මිල අඩුකර සහන දෙන්න

**ගෑස්, කිරි පිටි, සහල්, තිරිඟු පිටි, සිමෙන්ති ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල රොකට් වේගයෙන් ඉහළ ගොස් තිබේ. මිල පාලනය ඉවත් කිරීමෙන් ජනතාව කබලෙන් ළිපට වැටී ඇත. ගැසට් නිවේදන මගින්, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් මගින් අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල මිල පාලනයට ගත්තා වූ ක්‍රියාමාර්ග සියල්ලම පුස්සක් බවට පත්වූ බව අමුතුවෙන් කිව යුතු නැත. මෝල් හිමියන් කිහිප දෙනකුට හා මහා පරිමාණ ව්‍යාපාරිකයන් කිහිප දෙනකුගේ ඕනෑ එපාකම් අනුව රටේ ජනතාවගේ අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල තීරණය වන්නේ නම්, රජයකින්, පාරිභෝගික සේවා අධිකාරියකින් ඇති ඵලය කුමක් ද?**

අහස උසට බඩු මිල ඉහළ ගොස් ජනතාව පීඩා විඳිද්දී පොහොර හිඟයෙන් ද ගොවීහු පීඩා විඳිති. රට පුරා ගොවි බිම්වල උද්ඝෝෂණ කරති. ගුරු විදුහල්පති වැටුප් විෂමතා ගැටලුවට මෙතෙක් නිසි විසඳුමක් නොලැබීමෙන් අසරණ දරුවන්ගේ අධ්‍යාපනයට අනාගතයට කණ කොකා හඬා ඇත. වරාය, විදුලිය, ඛනිජ තෙල් වැනි ජාතික සම්පත්, ආර්ථික මර්මස්ථානයන් කුණු කොල්ලයට විදේශයන්ට විකුණමින් සිටින බවට වෘත්තීය සමිති හා විද්වත්හු චෝදනා නගති. විරැකියාව නිසා තරුණ අසහනය වැඩි වී ඇත. මාධ්‍ය නිදහසට තර්ජන එල්ල කරමින් ‘සුදු ලූනු වංචාව’ සම්බන්ධයෙන් ‘ලංකාදීප’ කර්තෘ ඇතුළු මාධ්‍යවේදීන් රහස් පොලිසියට කැඳවීම කරන ලදී. මාධ්‍යවේදීන් රහස් පොලිසියට කැඳවා ප්‍රශ්න කිරීම කිසිසේත් නොකළ යුතු බව අග්‍රාමාත්‍යවරයා ද ප්‍රකාශ කර තිබිණි. සී.අයි.ඩී.ය ‘ලංකාදීප’යට පැමිණීම ශීලාචාර සමාජයක සිදු නොවිය යුත්තක් බව අමාත්‍යවරයා පවසා තිබිණි. පොලිස් රාජ්‍යයකට රට යමින් පවතින බවට සමාජයෙන් චෝදනා විවේචන රජයට එල්ල වෙමින් පවතී.

මෙවන් තත්ත්වයක් හමුවේ මෙරට ‘69 ලක්ෂයක්’ ජනතාව ජනපතිතුමන් සහ රජය කෙරෙහි තැබූ විශ්වාසය පළුදු වී අපේක්ෂාභංගත්වයකට පත්ව සිටින බව කියන්නට අමුතුවෙන් අටුවාටීකා අවශ්‍ය නොවේ.

එහෙයින් ජනාධිපතිතුමනි, ඔබතුමන් හදිසි නීතිය පනවා හෝ සහල්, සීනි, කිරි පිටි, පරිප්පු, ගෑස් ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩවලට සහතික මිලක් නියම කර මිල පාලනයක් සිදුකර බඩු මිල අඩු කර, ජනතාවගේ ජීවන තත්ත්වය නගාසිටුවීමට නොපමාව ක්‍රියා කරනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

රටේ ආර්ථික තත්ත්වය යහපත් වනතුරු, රජයේ ඇමැතිවරුන්ගේත්, අමාත්‍යාංශවලත් අනවශ්‍ය වියදම් කපා හැර අත්‍යවශ්‍ය නොවන භෞතික සංවර්ධනය නවතා දමා (උදාහරණ-ඇවිදින මංතීරු වැනි ව්‍යාපෘති) පීඩිත ජනයාට ජීවන වියදම් දීමනාවක් හෝ ලබාදීමට කටයුතු කරන්නේ නම් එය ඉතා කාලෝචිත යෝග්‍ය ක්‍රියාවක් වනු ඇත.

**බී.එච්. රසික ප්‍රියංකර පෙරේරා**
**පොතුපිටිය, වාද්දුව**

# තුන්මංසල

| | |
|---|---|
| මෙතුවක්කල් පැවත ගෙන ආ රජය | මත |
| වෙළෙඳ පොළේ දැන් මිල පාලනය | නැත |
| මුදලාලිගෙ අණට එය ඉටු කැරෙනු | ඇත |
| ඇමැතිවරුන්ගෙන් දැන් ඇති වැඩක් | නැත |

*තිලක*

# සුජීවගේ විගඩම්



| | |
|---|---|
| සතොසෙන් දෙන්න ගිය සහනය | ඉතාය |
| දැම්මේ නීති ජනයා ගැන | හිතාය |
| කවුරුත් දන්න සක්කරයගෙ | පුතාය |
| දිව දෙකකින් කියන රසවත් | කතාය |

# රථවාහන තදබදයට යටවුණු කිරිඳිවැල නගරය

**ගම්පහ දිසාවේ පිහිටා තිබෙන ජනාකීර්ණ නගර අතර තෙමංසලකින් සමන්විත කිරිඳිවැල නගරයට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. දෛනික අවශ්‍යතාවන් රැසක් ඉටුකර ගැනීම සඳහා දිනකට දහස් සංඛ්‍යාත ජනතාවක් කිරිඳිවැල නගරය කරා ඇදී එති. නගරයේ මාර්ගවල සුදු ඉරි සලකුණු කර ඇති අතර උදේ, දිවා, හවස් කාලය ද ඇතුළුව දවස පුරාම නගරය තුළ දැඩි රථවාහන තදබදයක්ද පැවැතීම සුලභ දර්ශනයකි.**

මෙම නගරය තුළ දවස පුරාම ඇතිවී තිබෙන රථවාහන තදබදය අවම කිරීම සඳහා වර්ණ සංඥා පද්ධතියක් ස්ථාපිත කිරීම දේශපාලන අධිකාරිය ඇතුළු සියලුම රාජ්‍ය ආයතන භාර නිලධාරීන්තුමන්ලාගේ හා නිලධාරිනියන්ලාගේ වගකීම හා යුතුකම වේ.

**එච්. පිල්මන් ද සොයිසා**

# අයාලේ යන සුනඛ ගහනයට විසඳුමක් ඕනෑ

**සෑම පළාතකටම එක් සුනඛ එළිමහන් නිවහන බැගින් ඉදිකරන ලෙස 2011 වසරේ සෞඛ්‍ය අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන මහතා ජලභීතිකා මර්දන වැඩ සටහනේ නිලධාරීන්ට උපදෙස් දුන් බව ‘ලංකාදීප’ වාර්තා කළේය.**

එකල සුනඛ ගහනය ලක්ෂ දෙක හමාරකි. අද ඊටත් වැඩිය. පළමු එළිමහන් සුනඛ නිවහන අනුරාධපුරයේ ඉදිකරන බවත් එකල පළවිය. සුනඛයන් මියයන තෙක් හොඳින් රැකබලා ගැනීම හා එමගින් සුනඛ සපාකෑම් පාලනය කිරීම මෙම සුනඛ නිවහන් ඉදිකිරීමේ වැඩපිළිවෙළේ අරමුණ බව ද ප්‍රකාශ විය.

වර්තමානයේ ලංකාවේ අනෙක් ප්‍රදේශවලද මෙම වැඩපිළිවෙළ ව්‍යාප්ත කිරීමෙන් ජල භීතිකා රෝග මර්දනයට ද අනුබලයක් ලැබේ.

**ඒ.සී.ඇල්. ආරියපාල,**
**දියගම, ගල්පාත.**

# වත්තල - ඇටම්පලවත්ත අතුරු මාර්ගය අබලන්

**වත්තල හැඳල පුරාණ විහාරස්ථානය ඉදිරියෙන් පිවිසෙන ‘ඇටම්පලවත්ත’ අතුරු මාර්ගය ස්ථාන කිහිපයක විශාල වළවල් හෑරීමෙන් වැසි සමයේ ජලය පිරී පැවැතීමත් වියළි අවස්ථාවේ වාහන ධාවනය කිරීමේ දී රියැදුරු මහතුන්ට මෙම වළවල් පැහැදිලිව නොපෙනී යාමෙන් අනතුරුවලට භාජනය වීමට ඉඩ ඇත.**

මේ දිනවල පවතින වැසි හේතුවෙන් මෙහි වළවල් පිරී යාමෙන් පා ගමනින් යන්නන් දැඩි අපහසුතාවයන්ට පත්වේ. ගැබිනි මාතාවන් මෙන්ම හදිසි රෝගීන් රෝහල් කරා රැගෙන යාමේ දී ත්‍රිරෝද රියදුරු මහතුන් දැඩි වෙහෙසක් දරන්නේය.

අදාළ බලධාරීන්ගේ කඩිනම් අවධානය වසරකටත් අධික කාලයක සිට මෙලෙස පවතින අතුරු මාර්ගය කෙරෙහි යොමුකර වළවල් වසා කලක් පවතින ආකාරයට පිළිසකර කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

**එස්. රාසයියා ගාල්ල.**

# අද දවස ඔබට

## රාහු කාලය 7.29-8.59

### • මේෂ — රැකියාවට උනන්දුව

හිතවතෙකුගේ ඇරියුමක් පිළිගැනීමට අසීරු තත්ත්වයක් මතු වේ. දවසේ කටයුතුවල දී දුෂ්කරතා මතුවේ. රැකියා කටයුතු සඳහා වැඩි උනන්දුවක් දක්වයි. සිදුවීමට ගිය පාඩුවක් වළකා ගැනීමට හැකිවේ.

### • වෘෂභ — වගකීම්

බලපාන දුෂ්කරතා මහහරවා ගැනීමට හැකියාව ලැබේ. රැකියා කටයුතු ආදියේ වගකීම් ඉහළ යයි. යොදගත් කටයුතු නිසි ලෙස ඉටුකර ගැනීමට නොහැකි වේ. ඉංග්‍රීසි අධ්‍යාපනය කෙරෙහි වැඩි උනන්දුවක් දක්වයි.

### • මිථුන — දේපළ ගැටලු

දේපළ සම්බන්ධ ව්‍යාකූළතා මතුවේ. රැකියා ස්ථානයේ බලාපොරොත්තු වෙනසක් සිදුවේ. නිවාස අලුත්වැඩියා කටයුතු යෙදේ. දුෂ්කර කටයුතු සඳහා වැඩි වෙහෙසක් දැරීමට සිදුවේ.

### • කටක — ආධාර මුදලක්

ගෙවතු අලංකාර කටයුතු වලින් වැඩි ආදයම් හිමිවේ. උරුම හිමිකම් ආදියේ ව්‍යාකූලතා මතුවේ. වගා කටයුතුවලට බාධක මතුවේ. බලාපොරොත්තු ආධාර මුදලක් හිමිවේ.

### • සිංහ — සමාජ සේවය

ලැබිය යුතු උදව් උපකාර නොලැබී යාමට හේතු මතුවේ. සමාජ සේවා කටයුතුවල කාර්ය බහුලවේ. නව නිර්මාණ තුළින් වැඩි ආදයම් හිමිවේ. වැඩිහිටියන්ගේ උපකාර වැඩියෙන් ලැබේ.

### • කන්‍යා — ව්‍යාපාරික වාසි

වෙළෙඳ ව්‍යාපාරවලින් වැඩිලාබ ප්‍රයෝජන හිමිවේ. උත්සාහයේ තරමට ඵල නොලැබීමට හේතු යෙදේ. කලා කටයුතුවල නිරතවූවන්ට කාර්ය බහුල වේ. තම හිතවතකුගේ ඇරියුමක් ලැබේ.

### • තුලා — ස්ථාන පහසුකම්

ව්‍යාපාර කටයුතු සඳහා නව ස්ථාන පහසුකම් සලසා ගැනීමට හැකියාව ලැබේ. දවසේ කටයුතු සඳහා වැඩි සේවක පිරිසකගේ උපකාර ලබා ගැනීමට සිදුවේ. දුෂ්කර කටයුතු රැසක් යෙදේ. තැන්පත් ධනය වැයවේ.

### • වෘශ්චික — විදෙස් චාරිකා

රැකියා කටයුතු සඳහා උනන්දුව අඩුවේ. විදේශ චාරිකා වලින් බලාපොරොත්තු ඉටුවේ. පිරිස් පාලන කටයුතුවල නිරත වූවන්ට විවිධ දුෂ්කරතා මතුවේ. නිවසේ උත්සව අවස්ථාවක් යෙදේ.

### • ධනු — ව්‍යාපාරික ගැටලු

අන්‍යයන්ගේ ප්‍රසාදයට හේතු යෙදේ. පවතින බාධක මධ්‍යයේ වුවද යෙදුණු කටයුතු කිරීමට හැකිවේ. ව්‍යාපාරික ස්ථානයේ විවිධ ගැටලු මතුවේ. ඉතා ඉවසිලිමත්ව කටයුතු කළ යුතු තත්ත්වයක් පවතී.

### • මකර — නව ආදායම් මාර්ග

නුසුදුසු කටයුතුවලට ලක්වීමෙන් ප්‍රධානීන්ගේ අප්‍රසාදයට හේතු මතුවේ. කල්පවතින පාද ආශ්‍රිත ආබාධයක් සුව අතට හැරේ. කලක් කරගෙන ගිය කටයුතුවල වෙනසක් සිදුවේ. නව ආදයම් මාර්ගයක් පිළිබඳව වෙහෙසීමට සිදුවේ.

### • කුම්භ — විවිධ ලාබ

පවතින අපහසුතා රැසක් ජය ගැනීමට හැකියාව ලැබේ. විවිධ කටයුතුවලට යොමු වීමෙන් වැඩි ලාබ හිමිවේ. අධ්‍යාපන කටයුතුවලට බාධක මතුවේ. දවසේ කටයුතුවල වෙනසක් සිදුවේ.

### • මීන — හදිසි ධන ලාබ

රූපලාවණ්‍ය කටයුතු වලින් වැඩි ලාබ උපයා ගැනීමට හැකිවේ. අතර මග නතර කළ කටයුතු සඳහා යළි වෙහෙසීමට සිදුවේ. පූජක පක්ෂයේ උපකාර ලැබේ. බලාපොරොත්තු රහිත ධන ලාභයක් හිමිවේ.

**ගම්පහ . අබේසේන හේරත්**

කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරණ ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2021 නොවැම්බර් මස 8 වැනිදා සඳුදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.